
ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී


2022 දෙසැම්බර් 07 වන බදාදා
3 කාණ්ඩය 01 කලාපය
මිල රු. 80 යි


විශේෂ අතිරේකයක් නොමිලේ

2 වන සංවත්සර කලාපය



## මේ ලස්සන එකී මට දීපන් කිය කියා බාබලා තරඟෙට ලංසු තිබ්බා

## බඳින්න කලින් පිරිමි ගෙට ගන්නෙ බලාගෙන මගෙ දුවේ

අත්තනායක එම්. හේරත්

## ඇඳුම මැහුවේ ඉන්දි රාජාට වුණාට මගේ හිත කිව්වෙම වාසනා එක අඳින්න ඕන කියලා

## කුඩු අදින බෝට්ටුවලට නඩු දාන දියකිඳුරියෝ

ගයංසා නෙතුශලි
අලෙවි අධ්‍යක්ෂිකා
ශ්‍රී කාන්ත ජුවලර්ස් පුද්ගලික සමාගම

ඡායාරූප
ක්‍රිෂාන් කාරියවසම්




*කොන්දේසි සහිතයි

## කිසිවෙකු පසුපසින් නොයන ඔබ
# සැමවිටම ඉදිරියෙන්

ඔබ කිසිවෙකුටත් දෙවෙනි නෑ. ඔබ කිසිවෙකු පසුපස යා යුතුත් නෑ. ඔබ ඔබමයි. ඔබ හැමදෙයින්ම ශක්තිමත්, දිරිමත් කාන්තාවක්. කුමන ක්ෂේත්‍රයක වුව ද, ඔබට ඉදිරියටම යා හැකියි. Ladies 1st නමින් අපේ කාන්තා ගිණුම නම්කර ඇත්තේද ඒ නිසයි.

අසමසම ප්‍රතිලාභ රැසක් පිරිනමමින් Ladies 1st ඔබට මූල්‍ය ජවය සපයන්නේ ඔබව ඉදිරියෙන්ම තබන්නයි.

- **සාමාන්‍ය ඉතුරුම්වලට වඩා ඉහළ පොලියක්**
- **Ladies 1st පාස් පොතක් සහ වීසා ඩෙබිට් කාඩ්පතක්**
- **අවුරුදු 5ක් දක්වා ආයෝජන සැලසුම් ලබාගැනීමේ අවස්ථාව**
- **ණය පහසුකම්වලදී විශේෂ වූ පොලී අඩු කිරීමක්**

ඉදිරියෙන් ඉදිරියට ම යන්න,
සම්පත් බැංකුවේ කාන්තා ගිණුමක් අදම අරඹන්න.

**සම්පත් බැංකුව**
හෙට දින එළිය කරයි

0112 30 30 50 www.sampath.lk

සම්පත් බැංකුව ෆිච් රේටිංස් AA-(lka) ශ්‍රේණිගතයි.

# ඉස්කෝලෙ හාමිනේලගේ සාරි හුටපට අවුරුදු හැටකට කලිනුත් තිබ්ලා


සිළුමිණ
The Silumina
ඉස්කෝලෙ හාමිනේගේ සාරිය ගැන ප්‍රශ්නයක්
ඇඟ පත වැසෙන්න ඇඳිය යුතුයි කියති

**"ඉස්කෝලේ හාමිනේලා ඉඟ පේන්න සාරිය හෝ ඔසරිය ඇඳගෙන ඉස්කෝලෙට යෑම තහනම් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යංශයට පැමිණිලි ලැබී ඇත්තේය."**

**සමහර පාසල් ගුරුවරියන් විකාර විදියට ඇඳ පැළඳීම ගුරු වෘත්තියට මදිකමක් පමණක් නොව එයින් අන්‍යයයන්ගේ කාමුක හැඟුම් ඇවිස්සීමටද ඉඩ තිබේයැයි අධ්‍යාපන අමාත්‍යංශයට ලැබී ඇති පැමිණිලිවල සඳහන් වේ.**

ඔබ ඉහතින් කියවන ලද්දේ මෙයින් වසර හැටකට පෙර, ලේක්හවුස් ආයතනය මගින් ප්‍රකාශිත 'සිළුමිණ' පුවත්පතේ පළව තිබූ ප්‍රධාන සිරස්තලයයි. හරියටම දිනය කිවහොත් ඒ 1962 වසරේ මැයි 27 දය. එම පුවත්පත මුද්‍රණය වී තිබුණේ අළුයම් මුද්‍රණයක් ලෙසිනි. පුවත්පතක මුද්‍රණ කිහිපයක් එන්නේ නම් ඒ විශේෂ ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති තොරතුරක් රටට දැනුම්දීමට ඇති විටය. එසේ ගත්කල එකල මෙම ප්‍රවෘත්තිය විශේෂ එකකි.

අද ඇතැම් ගුරුවරියන් ඉල්ලන්නේ සාරිය වෙනුවට වෙනත් සරල ඇඳුමක් ඇඳ පාසලට එන්නට අවසර ලබාදෙන ලෙස වුවත්, මේ කියන කාලයේ ගුරුවරියන්ට තිබී ඇත්තේ සාරිය ඇන්දද අඟපසඟ වැඩිපුර ප්‍රදර්ශනය වීමේ ගැටලුවකි. එක්දහස් අටසිය ගණන්වල සිට ගුරුවරියන් ඇන්දේ සාරියය. ගමේ පාසලට උගන්වන්නට ගියේ ගමේම ගුරුවර ගුරවරියන්ය. විශේෂයෙන් ගුරුවරියන් සිටියේද අතලොස්සකි. ඔවුන්ද වැඩිහිටි වයසේ පසුවූ අතර, ගුරු විද්‍යාල පටන්ගෙන තරුණ ගුරුවරියන් වැඩිපුර සේවයට බඳවාගැනීම සිදුවූයේ පනස්හයෙන් පසුය.

මෙසේ බඳවාගන්නා ලද තරුණ ගුරුවරියන්ගෙනුත් ඉතාම අතලොස්සක් මෝස්තර කරන්නට කැමැත්තක් දැක්වූ අයය. බටර්නයිලෝන්, නයිලෙක්ස් හෝ වොයිල් සාරිය, අත් බෝරිච්චි දිගු හැට්ටය වෙනුවට අත් රහිත හැට්ටයකට සාරි, ඔසරි හැඳීමත්, නාභියටත් පහලින් අඟලක් දෙකක් ප්‍රදර්ශනය වීම පාසලේ සිටි ජ්‍යේෂ්ඨ සිසුන්ගේ වාගේම තරුණ ගුරුවරුන්ගේ සිල් බිඳෙන තත්ත්වයකැයි එකල වැඩිහිටියෝ සලකන්නට ඇත. ඒ වාගේම එවන් කට කැඩුණු උපහාස හෝ අපහාස කතාවන්ට ගුරුවරියන් ඉලක්ක වී ගුරු ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් විය හැකි බවටද උපකල්පනයක් තිබිණි.

විශේෂයෙන්ම එකල පාසල්වලට පත්ව ආ තරුණ ගුරුවරියන්ට වඩා වයසින් වැඩි සිසුහු ජ්‍යේෂ්ඨ පන්තිවල ඉගෙනගනිමින් උන්හ. ඒ ඇතැම් සිසුන් එකම පන්තියේ වසර දෙක තුන සිටියේ ඉගෙනුම් දුර්වලතා නිසා වසරින් වසර අසමත් වෙමිනි. විටෙක ඔවුන් දඩබ්බර ගති ඇත්තන්ය. ගුරුවරියන්ටද ඉඟිබිඟි පානා සිසුන් ඒ අතර සිටියෝය. ඒ අල්ලපනල්ලේ ඇතැම් ගුරුවරියන් නාභිය හා සිරුරේ අනෙක් අඟපසඟ ප්‍රදර්ශනය කරමින් පාසලට ඒම ඉබ්බා දියට දමන්නදැයි ඇසුවිට ඇන්නෑවේ කියන තරමේ කාරණයක් ලෙස තරුණ සිසුන් සැලකූහ.

අනෙක් අතට හින්දි හෝ දෙමළ චිත්‍රපට නරඹා ඇතැම් ගුරුවරියන් සාරි ඇඳීමේ පිළිවෙල වෙනස් කළ බව කියැවිණි. මෙය ගම්බදට වඩා නගරබද පාසල් ආශ්‍රිතව සිදුවූ අතර විදුහල්පතිවරුන්ට නොඑසේනම් එකල සිටි ලොකු ඉස්කෝලේ මහත්තයාටද එය ගැටලුවක් විය. ඔහු ඒ ගැන කලාප කාර්යාලයට පැමිණිලි කරද්දී, කලාප කාර්යාලය ඒ ගැන අමාත්‍යංශයට පැමිණිලිකොට තිබේ. එය ප්‍රවෘත්තියක් වී පත්තරේට එන්නේ එහෙමය.

**"මට ඔය ප්‍රවෘත්තිය ගැන හරිහැටි මතක නැතත් ඔය කියන කාලේ සිදුවීම් ගැන මතකයක් මට තියෙනවා. එතකොට මම ගුරුකමට ඇවිත් නැහැ. මමත් ජ්‍යේෂ්ඨ ශිෂ්‍යයෙක්. ඒ කාලේ ගුරුවරුන්ට සුදු ඇඳුම අඳින්න නියමිතව තිබුණා. සරම ඇඳලා, කෝට් එක ඇඳලා, ටයි එකක් දාලා සමහර ගුරුවරු, විදුහල්පතිවරු පාසලට ආවා. රෙද්ද බැනියම වගේම කලිසම් කමිස ඇඳලා පාසලට ආව ගුරුවරු හිටියා. ගුරුවරියෝ අපිට මතක කාලේ ඉඳලම ඇන්දේ සාරිය. එහෙමත් නැත්නම් ඔසරිය. පාරකතොටක ගියත් එය ගෞරවනීය සංකේතයක් වගෙයි හැමදෙනාම සැලකුවේ. එක්කෙනෙක් දෙන්නෙක් ඔය අතරේ විලාසිතාවන්ට කැමති අය ඉන්නවා. සමහර වෙලාවට බයිස්කෝප් එකක්, චිත්‍රපටයක් බලලා ඒකේ නිළිය ඇඳපු විදියට සාරිය ඇඳලා කොණ්ඩෙට කටු ගහලා ඉස්කෝලෙට එනවා. ඒ ආවහම වැඩිහිටි ගුරුවරියෝ දෙස් කියන අවස්ථා තියෙනවා. කොල්ලෝ කුරුට්ටෝ විහිළු කරනවා. විදුහල්පතිවරුන්ට සමහර වෙලාවට ගුරුවරියම ගිහින් පැමිණිලි කරනවා."**



චිත්‍රපට නිළියෝ සාරි අඳින විදියට සමහර තරුණ ගුරුවරියෝ සාරි ඇඳලා

ඒ ලංකා ගුරු සංගමයේ ආරම්භක ලේකම් ඩබ්ලිව්.ඕ.විතාන මහතායි. අද ඔහු විශ්‍රාම සුවයෙන් පසුවූවත් හතළිස් වසරක ගුරු දිවිය තුළ විවිධ අත්දැකීම් ඇත්තේය. ඔහු කලක් විදුහල්පතිවරයෙකු ලෙස සේවය කළ අතර, විශ්‍රාම ලැබුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු ලෙසිනි. වෘත්තීය සමිති සාමාජිකයෙකු ලෙසද ඔහු කලක් කටයුතු කළේය. ඒ අනුව ඔහු සඳහන් කළේ ගුරුවරියගේ සාරිය විවිධ හේතු දක්වමින් වර්තමානයට දැරිය නොහැකි කාරණයක් ලෙස හුවා දැක්වුවත් ඊට එකඟතාව දක්වන්නේ ගුරුවරියන්ගෙන් ඉතාම අතලොස්සක් බවය.

**"අද සාරි ගන්න වැටුප මදියි කිව්වට මට මතකයි 1960 වෙනකොට ගුරු වැටුප රුපියල් එකසිය පනහක්. සහතිකලත් හා සහතික නොලත් ගුරුවරු හැටියට කාණ්ඩ දෙකක් ඒ කාලේ හිටියා. පස්සේ උපාධිධාරී ගුරුවරුන්ට වැටුප් වැඩි කළා. ඒ රුපියල් සීයකින් වගේ. හැබැයි ඒ කාලේ රුපියල් එකසිය පනහක් කියන්නේ ලොකු මුදලක්. සාරි මිලදීගන්න ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ගුරුවරයෙක් නවාතැනක නැවතිලා සේවයට ගියානම් මාසෙට කෑමටයි, ඉන්නයි ගියේ රුපියල් තිහක වගේ මුදලක්. අද කියලා ගුරුවරුන්ට තියෙන සාරි ටික පිළිවෙලට අඳින එක ප්‍රශ්නයක් නෙවෙයි. මම හිතන්නේ ගුරු සංගම් ලේකම්වරයෙකු පළමු වතාවට තමයි ගුරුවරියන්ට සාරි එපා කියලා කිව්වේ."**



ලංකා ගුරු සංගමයේ ආරම්භක ලේකම් ඩබ්ලිව් .ඕ. විතාන

හැට ගණන්වල අධ්‍යාපන අමාත්‍යංශයට තිබුණු ගැටලුවම සාරිය වෙනුවට වෙනත් ඇඳුමක් ඉල්ලන ගුරුවරියන්ටද ඇති බව පෙනේ. පසුගියද වෙනත් ඇඳුමකින් පාසලට ගිය ගුරුවරියක් සාරිය එපාවීමට එක් කාරණයක් ලෙස දක්වා තිබුණේද කොච්චර බඩ වැහෙන්න සාරිය ඇන්දත් කළුලෑල්ලේ අකුරු ලියද්දී බඩ පේන්නට ගන්නා බවය. එසේනම් සාරිය ඇඳීම ගුරු ගෞරවයට හේතුවක් විය හැකි දැයි ඕ ප්‍රශ්න කර තිබිණි.

**"1963 අවුරුද්දේ තමයි මම ගුරුවරියක් විදියට සේවයට බැඳුනේ. දැන් මගේ වයස අවුරුදු අසූහයක්. අපිට අපේ වැඩිහිටියෝ සාරිය අඳින්න කියලා දීපු ක්‍රමයක් තිබුණා. පස්සේ ඉන්දියන් සාරි ලංකාවට ඇවිත් විවිධ මෝස්තර සාරි හැට්ට ඇන්දට ඉස්සර වැඩිපුර අපි ඇන්දේ වොයිල් සාරි. ඔය අතරේ මට කොළඹ ඉස්කෝලෙකට මාරුවක් ලැබුණා අනූ ගණන්වල. ඒ කාලේ වුණ සිද්ධියක් මතකයි. දවසක් විවේක කාලේ අඬාගෙන මගේ ගුරු යෙහෙළියක් කාමරේට ආවා. ලොකු පන්තිවල පිරිමි ළමයි එයාට 'මිස් බුරියානි' කියලා. ඒකට හේතුව තමයි නාභිය පේන්න සාරිය ඇඳීම. පස්සෙ පස්සේ සාරි හැට්ටෙටත් විවිධ මෝස්තර ආවා. පිට ගැඹුරට කපලා මහලා. හැබැයි ඒ වගේ සිද්ධි එකක් දෙකක් හැරුණුකොට සමස්ත ගුරුවරියෝ සාරියට නම් හානියක් කළේ නැහැ."**

ඒ වසර තිස්හතක් ගුරු සේවයේ නියැලි චන්ද්‍රා මීගම ලද සාරි ඇඳීමේ අත්දැකීම්වලින් බිඳකි. අදද පිට ගැඹුරට හාරා අඳින සාරි හැට්ටය නිසා 'නාරාහේන්පිට මාරයි', 'පිට බැද්දර යන්නේ කවුද' ආදී වැකි කොල්ලන්ගේ මුවින් පිටට නොපනින්නේ නොවේ. සාරිය නාභිය පෙනෙන්නට අඳින්නේනම් එවිට කියන්නේ 'බුරියානි' කියාය. පියයුරු ටිකක් හැඩට පෙනේනම් 'ඒ මිස් අඹේවෙලින් ඇවිත්' යැයි කියති. පියයුරු කුඩා කාන්තාවන් 'මිස් තුනීලෑලි'ය. පස්ස ලොකුවට පෙනේනම් 'ඒ මිස් වට්ටක්කා'ය. කොලුගැටයින්ගේ මෙවැනි ආතතුත කතා ගුරුවරියන්ට පමණක්ම සීමා වූ කතාද නොවේ. වෙනත් කාර්යාල සේවිකාවක් වුව මෙවන් කතා එකක්වත් අසා ඇතිවාටද සැක නැත.

ඉතින් එද, මෙද, කවද වුවත් ගුරුකම ගෞරවාන්විත වෘත්තියක් ලෙස සැලකිනි. ඒ ගුරුකමේ මහඟු ආදර්ශයන් මතු පරපුරටද වටිනාකම් එක්කරන්නේය. ඒ වටිනාකම් අකාමකා දැමීම වෘත්තිය සමිතියක හෝ කිසියම් කණ්ඩායමකට තරම් නොවටිනා බවට දැනටමත් අදහස් දරන්නන් බොහෝය.

■ දීපා වසන්ති එදිරිසිංහ

2 වන සංවත්සර කලාපය

# පා නැගූ දෑ අවුරුද්දට
## පුදමි ආසිරි කුසුම් මල්මිට

ඇසෙන විට කූජන ද රාවය සවන් පත් වෙත යොමුවෙමින්
නිලඹරේ හිරු කුමරු පිබිදී දස අතම ලොව තුටු වෙමින්
විල්තෙරේ නිලුපුල් ද තඹරු ද සුපුපි දියඹේන් මතුවෙමින්
විවරකොට නෙත් යුගළ බලනෙමි ධරණී එනතුරු කිව්දිනෙන්

පහන් සිතුවිලි එකින් එක ගෙන පිටු අතරෙ ඔපවත් කළා
තුටින් එය නෙත ගැටුණු විගසම මගේ අදහස් පළ කළා
බැතින් හද මඩලින් ම ධරණී පිළිඅරන් තුති මල් නෙළා
මුවින් හසරැල් මතුවෙමින් මල් කළඹ සුරතට පුද කළා

සුපිපි සුවඳැති ගං දෑලේ මල් සුරත දිගුකර නෙළන්නම්
හමන මදනල සමඟ දසතින් ඇවිත් ධරණී සිඹින්නම්
සුරත රඳවා පන්හිඳෙන් කවියාය සරසා තබන්නම්
නැගුව පා පොඩි ඉහළ යන්නට කුසුම් ආසිරි පුදන්නම්

**ඥානා දෙනිපිටිය**
**කෝට්ටගොඩ, බදුල්ල**

# ඇඳුම මැහුවේ ඉන්දි රාජාට වුණාට
# මගේ හිත කිව්වෙම වාසනා ඒක අඳින්න ඕන කියලා

නුවර ලස්සන වැස්සට යැයි කතාවට කිව්වද නුවර ඇත්තටම ලස්සන ඇහැළ මහටය. ඒ කන්ද උඩරට ඓතිහාසික ඇසළ පෙරහර මංගල්‍යය නිසාය. මේ ගෙවෙන්නේ පෙරහර සමයක් නොවුණාට මේ වෙද්දීත් ලබන වසරේ පෙරහර මංගල්‍යය වෙනුවෙන් ලකලෑහැස්ති වෙන්නෝ එමටය. ඒ අතරින් බරපතළම රාජකාරියක් වන්නේ අලි ඇතුන්ගේ ඇඳුම් මැසීමයි. එය නමේ හැටියටම අලි වැඩකි.

මෑතක් වෙනතුරුම ඒ භාරදූර රාජකාරිය කළේ ඉන්දියානු සම්භවයක් සහිත තදනි නමැති හින්දු බැතිමතාය. දැන් ඔහු ජීවතුන් අතර නැත. නමුත් තදනිගේ කාරිය හරි අපූරුවට කරන කාන්තාවක් සිටින බව පසුගියදා අපට දැනගන්නට ලැබුණි. අලි ඇඳුම් මැසීමට නම් දැරූ කාන්තාවන් කීපදෙනෙක් සිටියත් ඇගේ විශේෂත්වය වන්නේ ලංකාවේ අලි ඇඳුම් නිර්මාණය කරන පළමු සහ එකම රූපලාවණ්‍ය ශිල්පිනිය ඇය වීමයි. ඇය වැලිවේරියේ පදිංචි ඉනෝකා වාසනා පෙරේරා ය.

"ඇත්තටම මේක භාරදූර කටයුත්තක්. ඒ නිසා මුලදි නම් ලොකු බයක් හිතේ තිබුණා. ඒත් මම මේක ගොඩාක් ආසාවෙන් වගේම ශ්‍රද්ධාවෙන් බාරගත්තු වැඩක් නිසා කරගෙන යද්දි ඒ බය නැතිවෙලා ගියා. මං හිතනවා නුවර දළදා පෙරහරට අලි ඇඳුම් නිර්මාණය කරන්න ලැබීම ලොකු වාසනාවක් කියලා. මොකද මෙහෙම අවස්ථාවක් ලේසියෙන් කෙනෙක්ට ලැබෙන්නේ නෑ."

2019 වසරේ සිට මේ දක්වාම ඓතිහාසික කන්ද උඩරට ඇසළ පෙරහර මංගල්‍යයේ පළමු කුඹල් පෙරහරේ දළදා කරඬුව වැඩමකළ ඇතුට මෙන්ම දෑලේ ඇතුන් දෙදෙනාට ඇඳුම් නිර්මාණය කර ඇත්තේ ඉනෝකාය. එකී අවස්ථාව ලැබුණු ආකාරය ගැන ඇය 'ධරණී'ට පැවසුවේ මෙසේය.

"මං පුංචි කාලේ ඉඳන්ම පින්දහම් වැඩවලට ආසයි. දැනටත් මං ගොඩාක් පින්කම් කරනවා. දවසක් ටීවී එකේ නුවර පෙරහර බලද්දි මට පුංචි අදහසක් හිතට ආවා. ඒ තමයි මාලිගාවේ පෙරහරට මගේ අතින්ම අලි ඇඳුමක් මහලා පූජා කරන්න. මගේ අදහස කිව්වම ගොඩාක් අය කිව්වේ ඒක ලේසි වැඩක් නෙවෙයි ලක්ෂ ගණනක් යනවා වගේ කතා. ඒත් කොච්චර අමාරු වුණත් කොච්චර මුදලක් ගියත් කොහොම හරි මට ඒක කරන්න ඕන වුණා."

එතැන් පටන් ඇඟිලි ගනිමින් සිටි ඉනෝකා 2018 වසරේ නුවර දළදා පෙරහර බලන්නට පවුලේ උදවියද සමඟින් මහනුවරට ගියේ දහසක් බලාපොරොත්තු හිතේ දරාගෙනය. අවසන් රන්දෝලි පෙරහර තිබූ එදින ඇය පෙරහැර නැරඹුවේ මහනුවර ශ්‍රී විෂ්ණු දේවාලය ආසන්නයේ සිටය.

"එදා මට මහනුවර විෂ්ණු දේවාලයේ බස්නායක නිලමේගේ ලේකම් අනුරුද්ධ බණ්ඩාර මහත්තයා මුණගැහුනා. පස්සේ මං මගේ අදහස එතුමාට කිව්වා. එයා කිව්වා එහෙනම් විෂ්ණු දේවාලේ පෙරහරට ඇඳුමක් මහලා දෙන්න කියලා. එයාලම මිම්මත් දුන්නා. ඒ විතරක් නෙවෙයි මහපු අලි ඇඳුමකුත් දිගෑරලා පෙන්නුවා. ඒක මං හිතුවට වඩා ලොකුයි. ඒ වෙලාවේ නම් මට මෙච්චර ලොකු එකක් මහන්න පුළුවන්ද කියලා බයකුත් ආවා."

පෙරහර නිමාවී ගෙදර පැමිණ පහුවදා සිටම ඉනෝකා කළේ අලි ඇඳුම නිර්මාණයට සැලසුමක් නිර්මාණය කිරීමයි. නමුත් එය ලේසිපහසු කටයුත්තක් වූයේ නැත. එනිසා මුලින්ම ඇය අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධියටත්, රුවන්වැලිසෑයටත්, මහනුවර ශ්‍රී දළදා මාලිගයටත් භාරයක් වුණාය. ඒ තමන්ගේ පින්වන්ත කටයුත්ත සාර්ථකව නිමකරගැනීමට හැකිවේවා යන අභිංසක ප්‍රාර්ථනයෙනි.

"අපේ ගෙදර සාලේ ලොකු බුදු පිළිමයක් තියෙනවා. ඒ ඉස්සරහා තියාගෙන තමයි අලි ඇඳුම මහන්න පටන්ගත්තේ. හැමදාම පාන්දර එකට තමයි ඇහැරුණේ. කොහොමහරි ජනවාරි වෙනකොට මැහුවා. මාස තුනයි ගියේ. පස්සේ ඒක අරන් විෂ්ණු දේවාලෙට ගියා. එයාලටත් පුදුමයි. පස්සේ මට අනුරුද්ධ මහත්තයා මාලිගාවේ ඇත් පන්තිය බාර ප්‍රදීප් මියනපලාව මහත්තයාව මුණගැස්සුවා. ඒ හරහා මට දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහත්තයා එක්කත් කතා කරන්න අවස්ථාවක් ලැබුණා. එතුමාට මං කිව්වා මට නුවර පෙරහරේ පළවැනි කුඹල් පෙරහරේ කරඬුව අරන් යන ඇතාටයි දෑලේ ඇත්තුන්ටයි ඇඳුම් තුනක් මහන්න දෙන්න කියලා. එතුමා මට ඒ අවස්ථාව සතුටින් බාරදුන්නා."

ඒ වනවිටත් ඇසළ මහට තිබුණේ හරියටම මාස හතකි. මාස හතකින් අලි ඇඳුම් තුනක් මැසීම ලේසිපහසු කාරියක් නොවේ. නමුත් ඇය ඒ අභියෝගය බාරගත්තේ අභිංසක ප්‍රාර්ථනාවක්ද එක්කමය.







ඉනෝකා වාසනා පෙරේරා

"පළවැනි කුඹල් පෙරහරේ කරඬුව වඩම්මන්නේ ඉන්දි රාජා. ඒත් මං ඇඳුම මැහුවේ කතරගම වාසනා මේ ඇඳුම අඳින්න ඕන කියලා හිතාගෙන. හැබැයි මං හොඳටම දන්නවා වාසනා කුඹල් පෙරහරේ යන්නේ නෑ කියලත්. ඒත් මං අර විදියටම හිතුවා. මං පෙරහරට කලින් දවසේ අලි ඇඳුම් මාලිගාවට බාරදීලා එනකොට මට වාසනා හම්බුණා. මං ඒ වෙලාවේ මගේ දුවටත් කිව්වා 'අනේ මෙයා මගේ ඇඳුම අඳින්නේ නෑනේ' කියලා. කොහොමහරි පහුවදා ඉන්දි රාජා මගේ ඇඳුම ඇඳලා සඳගලත් බැස්සා. ඒත් එතැනින් එහාට එයා හෙල්ලුනේවත් නෑ. පස්සේ බලද්දි එයා මදකිපිලා. අන්තිමේ ඒ ඇඳුම එයාගෙන් ගලවලා කතරගම වාසනාට ඇන්දුවා. අනේ එදා නම් මට පුදුම සතුටක් දැනුණේ."

එවර නුවර පෙරහර මංගල්‍යයේ අලි ඇඳුම් හතරක්ම මසා තිබුණේ ඉනෝකාය. ඒ ඇඳුම්වලින් හැඩවූයේ කතරගම වාසනා, මියන් රාජා, බුරුම රාජා සහ විෂ්ණු දේවල පෙරහරේ පෙරමුණේ ගමන් කළ සුරනිමල ය. ඉනෝකා පවසන පරිදි ඒ ඇතුන් හැරුණුකොට ඉනෝකාගේ අලි ඇඳුම්වලින් කීපවරක්ම නැදුන්ගමුවේ රාජා, සිංහ රාජා, කෝට්ටේ රාජා මෙන්ම සින්දු ද හැඩ වී තිබේ.

අපට ඇඳුමක් මසනා ආකාරයට අලි ඇතුන්ට ඇඳුම් මැසීමට නොහැකිය. එයට කාලය ශ්‍රමය පමණක් නොව ලක්ෂ ගණනින් මුදල්ද උවමනාය.

"ඒකට යොදගන්න රෙදිපිළි මිලෙන් අධිකයි. කොහොමත් දැන් බඩු භාණ්ඩවල වියදමත් එක්ක එක අලි ඇඳුමක් මහන්න ලක්ෂ තුන හතරක් වගේ යනවා. ඒත් සල්ලි ගැන නොහිතා මං මේ වැඩේ ශ්‍රද්ධාවෙන් කරනවා."

ඉනෝකා වසරක් පාසා මේ පූජනීය කටයුත්ත සිදුකරන්නේ මහර ප්‍රදේශයේ පිහිටි තමන්ගේ රූපලාවණ්‍යගාරයේ කටයුතුද සිදුකරන අතරේය.

"මං ඉස්කෝලේ ගියේ කිරිබත්ගොඩ විහාරමහාදේවි බාලිකා විද්‍යාලයට. ඒ කාලේ ඉඳන්ම රූපලාවණ්‍ය පැත්තට මැහුම් ගෙතුම්වලට ආසයි. ඉස්කෝලෙන් අයින්වුණාට පස්සේ රූපලාවණ්‍ය පැත්තට යොමුවුණා. හොඳ හැදෑරීමක් එක්ක 2010 අවුරුද්දේ සැලෝන් එකක් දැම්මා. එතැන වැඩත් කරන ගමන් තමයි අලි ඇඳුම් නිර්මාණත් කරන්නේ."

අප මුලදීම කී පරිදි ලංකාවේ අලි ඇඳුම් නිර්මාණය කරන පළමු මෙන්ම එකම රූපලාවණ්‍ය ශිල්පිනිය ඉනෝකාය. ඒ නිසාම පසුගියදා ඇය රූපලාවණ්‍ය ශිල්පීන් වෙනුවෙන් පැවති සම්මාන උළෙලක 'රූපලාවණ්‍ය පද්ම විභූෂණ කීර්ති ශ්‍රී දේශමාන්‍ය' යන ගෞරව නාමයෙන්ද පිදුම් ලැබුවාය.

"මේ දවස්වල මං පාන්දර දෙකේ ඉඳන් ඇහැරලා ලබන සැරේ පෙරහරට අලි ඇඳුම් තුන නිර්මාණය කරනවා. "

ඉනෝකාගේ එකම අපේක්ෂාව පුළුවන්තාක් කල් නුවර දළදා පෙරහරේ අලි ඇතුන්ට ඇඳුම් නිර්මාණය කිරීමය. අදටත් දළදා පෙරහරේ බහුතරයක් අංග ගැහැනුන්ට අකැප වුවද ඉනෝකාගේ අතින් මැසෙන අලි ඇඳුම් නම් පෙරහැරේ ආලෝකයට කදිමට ගැලපෙන්නේය. ඉතින් මීලඟ ඇසළ පෙරහර මංගල්‍යයට බොහෝකල් තිබුණත් ඉන්දිලා, සිංහලා, මියන්ලා මෙන්ම බුරුමලාද දැන් සිටම පේවෙන්නේ ඉනෝකාගේ හැඩකාර ඇඳුමින් හැඩ වී පළමු කුඹල් පෙරහරේ ආඩම්බර ගමනින් උතුම් දළදා වහන්සේ වඩම්මන්නටය. ඉනෝකා දිවා රෑ වෙහෙසෙන්නේ ඒ වාසනාවන්තයින්ගේ ඒ ආඩම්බරකාර ගමන නෙක වර්ණ ඇඳුමින් හැඩකරන්නටය.

**■ රුවන් එස්.සෙනවිරත්න**

# වැඩිපුර ඩේටා, වැඩිපුර video, වැඩිපුර Fun සමඟින්

# FUN BLASTER

## මාසයක් පුරා Fun එකේ ඉන්න
## හොඳම UNLIMITED පැකේජය

Facebook WhatsApp සහ YouTube

## සමඟ අමතර ඩේටා*




**Activate කිරීම රීලෝඩ්, MyDialog App හෝ #678# මඟින්**

4G SIM පතක් (පෙරගෙවුම් හෝ පසුගෙවුම්) සහ 4G දුරකථනයක් තිබිය යුතුය.

*1GB Anytime Data සහ 1GB Free Night Bonus ( 12.00 midnight - 8.00 am) ඇතුළත් වේ.

TRC/D/PRO/20/10

twitter.com/dialoglk facebook.com/dialog.lk

• කොන්දේසි සහිතයි

SD(360p) Video සඳහා සකසා ඇත.


ඔබ වෙත ගෙන එන්නේ
ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම ටෙලිකොම් සන්නාමය
ස්ලිම් කැන්ටා ජනතා සම්මානය 2022

an axiata company

www.dialog.lk

Dialog
අනාගතය අදයි.

2 වන සංවත්සර කලාපය



# බඳින්න කලින් පිරිමි ගෙට ගන්නෙ බලාගෙන මගෙ දුවේ



අත්තනායක එම්. හේරත්



**ලිපිය මට ලැබෙනකොට ඇය දිවි නසාගෙන සතියක් ගෙවිලා. ඒ දුව මට වගේම කැලණිය විශ්වවිද්‍යාලයේ එච්.ඩබ්. කරුණාරත්න සර්ටත් දන්වලා තිබුණා. ඒත් අපි දෙන්නටම බැරිවුණා ඒ දුවගේ ජීවිතය බේරගන්න**

රත්තරන් දුවේ,

මං අද දූලට කියන්න යන්නේ ඇත්ත කතාවක්. මං එක සතියක් කැම්පස් එකට ගියේ නෑ. අපට නිවාඩු හින්දා. නිවාඩුව ඉවරවෙලා නැවත මං කැම්පස් එකට යනකොට මට ලියුමක් ඇවිල්ලා තිබුණා කුරුණෑගල පැත්තෙ, මගේ සිසු දියණියකගෙන්. ඒ දුව මගේම බාහිර පංතියේ පිරිමි ළමයෙක් එක්ක තමයි යාළුවෙලා හිටියේ. ඒ පිරිමි ළමයා මේ දුවගේ ගෙදරටත් ආව ගිය බව ඒ ලියුමේ ලියලා තිබුණා. හැබැයි ඒ පිරිමි ළමයගේ තොරතුරු කිසිම දෙයක් මේ දුව හරියට දැනගෙන ඉඳලා නැහැ. එයාගේ අම්මා තාත්තව දැකලත් නැහැ. මේ දුවවත් දුවගේ දෙමාපියොවත් ඒ පුතාගේ ගෙවල් දොරවල් තියන තැනක් බලන්න ගිහිල්ලත් නැහැ.

ඉතින් එදා දුව මට ලියනවා, **“සර් මං දැනට ගැබිනියක්. ඒක දන්නේ මං විතරයි. තාම අම්මලට කිව්වෙත් නෑ. ඒක දැනගත්ත දවසේ ඉඳලා මං එයාට කතා කළා. එයාගේ දුරකතනය විසන්ධි වෙලා. එයා දුන්න ලිපිනයට මං ලියුම් දැම්මා. ඒ ලිපි ආපහු මං ළඟටම ආවා එහෙම කෙනෙක් නැහැ කියලා. අනේ සර් මට එයාව හොයලා දෙන්න. එයාගේ යාළුවොත් එයා ගැන දන්නෙ මං දන්න ටිකම තමයි.”** හැබැයි මේ ලිපිය මට ලැබෙනකොට ඇය දිවි නසාගෙන සතියක් ගෙවිලා. ඒ දුව මට වගේම කැලණිය විශ්වවිද්‍යාලයේ එච්.ඩබ්. කරුණාරත්න සර්ටත් දන්වලා තිබුණා. ඒත් අපි දෙන්නටම බැරිවුණා ඒ දුවගේ ජීවිතය බේරගන්න.

මගෙ දුවලා මං කිව්ව මේ කතාව සැහැල්ලුවට ගන්න එපා. රාවණ පරපුරේ කුවේණිත් විජය කියන පුද්ගලයා නිසා ගැබ්ගෙන දරුවන් දෙන්නෙක් එක්ක අනාථ වුණා. ඒක අපේ දුවලගේ ලැබීමද? නැත්නම් කරුමෙද? මට ලියපු දුවව ඒ පිරිමි ළමයා අනාථ කරලා තිබුණේ ඒ දුවගේ ගෙදරදීමයි. අපේ සංස්කෘතියේ තියෙන නරකම දේ තමයි විවාහයට පෙර මනමාලයා මනමාලිගේ (නැත්නම් පෙම්වතියගේ) ගෙදර නවාතැන්ගැනීම. උමංදව මහෞෂධ පඬිතුමාත් විවාහයට පෙර අමරාගේ ගෙදර එක රැයක් ගතකළා. ඒත් මහෞෂධ අමරාව මැරෙනකල්ම ආදරෙන් බලාගත්තා. අපේ ගොඩක් දූලත් හිතනවා තමන්ගේ පෙම්වතා මහෞෂධ පඬිතුමා වගේ කියලා.

තවත් එකක් තමයි අපේ දූලා තමන්ගේ පෙම්වතාගේ ගේ දොර දෙමාපියන් ගැන හොයන්නේ නැහැ. මට ලියුම එවපු දුවට බැරිවුණා නම් දුවගේ දෙමව්පියන් නැත්නම් සහෝදරයෙකු යවලා හරි පෙම්වතා කියන දේ ඇත්තද කියලා බලන්න තිබුණා. ඒත් අපේ දුවලා එච්චර බුද්ධිමත් නැහැ. කපටිත් නැහැ. අද ලංකාවේ පුතාලා ඔය වගේ වැඩ වලදී දුවලට වඩා තීක්ෂණ නුවණින් යුක්තයි. ඒ හින්දා ඒ අය තමන්ගේ වැඩේ කරගන්න අර දුවව ඉතා සියුම් විදියට රවට්ටනවා.

ඒ නිසා මගෙ දුවේ, කොල්ලෙක් එක්ක යාළුවෙන්න කලින් විස්තර හොයලා බලන්න. උප්පැන්න සහතිකය හරි කමක් නෑ ඉල්ලගෙන බලන්න. පුළුවන්නම් ග්‍රාමසේවක සහතිකය හරි ගෙන්නගෙන බලන්න. හැංගි මුත්තම් අල්ලන්නෙ නැති පිරිමි ළමයෙක්නම් තමන්ගෙ අනන්‍යතාව හෙළිකරන්න බය වෙන එකක් නෑ. පිරිමි ළමයින්ගේ හැසිරීමට සාපේක්ෂව දූලටත් අලුත් ක්‍රියාමාර්ග ගන්න වෙනවා. ගොඩක් පිරිමි සම්බන්ධය දුරදිග ගෙනිහිල්ලා, **“ඔයා කුලයෙන් පහත් නිසා අපේ අම්මලා කැමති නැහැ”** කියලා මගඅරිනවා. ඒකයි කිව්වේ උප්පැන්නෙ ගේන්න කියලා එයාගේ කුලය බලාගන්න.

අපේ රටේ ගොඩක් දැරියෝ ගණිකාවෝ වෙලා ඉන්නේ මේ නුවණ දුවලට නැති නිසා. ඒ නිසා දූලත් ටිකක් කපටි වෙන්න. අනෙක දුවේ ලියාපදිංචි විවාහයක් වෙනකල් යම් පිරිමියෙක් ඔයාට කාමරයකට යන්න කතා කරනවානම් ඒ ගැන පරිස්සම් වෙන්න. දුවකගේ පිරිසිදු බව රකින නැන්දම්මලාගේ ‘ඩෝබි පරීක්ෂණ’ ගැන කල්පනාකාරී වෙන්න. වරදක් වුණාට පස්සේ පුතා පැනලා යනවා. දුව දරුවෙක් එක්ක තනිවෙනවා. කුවේණිත් දුවේ දරුවෝ රත්නපුරයට යවලා යද්දෙස්සා ගලෙන් පහලට පැනලා දිවි නසාගත්තා. මේ ක්‍රමය දැන්වත් නවත්තමු දුවේ. අධ්‍යාපනයෙන් ඉහළ ගියා වගේම මේ තත්ත්වයෙන් ගොඩ එන්නත් දූලා ඔය නුවණ පාවිච්චි කරන්න.

**“මගේ දුවේ ඔබ අවදියෙන් නම් රැයේ මිහිරිම වෙලාවයි”**

පුළුවන් වෙලාවක මෙන්න මේ ගීතයට හොඳට කන්දෙන්න. ඒකෙ අර්ථය ගැන ටිකක් කල්පනා කරන්න. අද මේ ඉරණමට මුහුණ දුන්න දූලා යම් ප්‍රමාණයක් දිවි නසාගන්නවා. තව කොටසක් මසාජ් ක්ලිනික්වලට යනවා දරුවා හදාගන්න ඕන නිසා. ස්පාවලටත් ඇදෙනවා. ඉතින් දුවේ දූලාට පොත් නිකන්, රෙදි නිකන්, අධ්‍යාපනයත් නිකන්. ඒ හින්දා තමන්ගේ වටිනාම දේවල් නිකන් දෙන්න එපා. දුව ඉපදිලා ඉන්නේ දියණියන්ගේ පමණක් කන්‍යාභාවය හොයන රටක. ඒ නිසා මේක ලංකාව මිසක යුරෝපය නොවන බව සිහි තබාගන්න

-අත්තනායක එම්. හේරත්


# SEASONAL DEALS

20% OFF ON EVERYTHING

## APPLICABLE ON

| | | | |
|---|---|---|---|
| 3 & 4 DEC 2022<br>CREDIT CARD<br>Nations TrustBank mastercard AMERICAN EXPRESS | 6 DEC 2022<br>CREDIT CARD<br>Maximum Bill Value Rs.25,000/-<br>SEYLAN BANK PLC | 7 DEC 2022<br>CREDIT CARD<br>Maximum Bill Value Rs.25,000/-<br>DFCC BANK Keep Growing | 10 & 11 DEC 2022<br>CREDIT CARD<br>Maximum Bill Value Rs.25,000/-<br>SampathCards The responsible choice |
| 14 DEC 2022<br>CREDIT CARD<br>BOC CARDS UNSTOPPABLE YOU | 15 DEC 2022<br>CREDIT CARD<br>NDB bank The future is banking on us | 17 & 18 DEC 2022<br>CREDIT CARD<br>Maximum Bill Value Rs.25,000/-<br>HNB Credit Cards | 20 DEC 2022<br>CREDIT CARD<br>Maximum Bill Value Rs.50,000/-<br>PEOPLE'S BANK Pride of the Nation |

NOLIMIT®
Great Value. Big Smiles









# කුඩු අදින බෝට්ටුවලට නඩු දාන දියකිඳුරියෝ

## දියකිඳුරියන් දර්ශනය වෙන්නේ පිරිමින්ට විතරයි

කල්පිටිය ආශ්‍රිත මුහුදේ ඩොල්පින් සහ තල්මසුන් නැරඹීමට එන දෙස් විදෙස් සංචාරකයන් සඳහා සංචාර මෙහෙයවන්නෙකු වශයෙන් කටයුතු කරන ජූඩ් එම්මානුවෙල් ප්‍රනාන්දු මා කලක සිට දන්නා හිතවතෙකි. එවකට කල්පිටිය තානායම් භාරකරුව සිටි මගේ හිතවත් සම්පත් නිශාන්තගේ දැනහැඳුනුම්කම් මත ජූඩ් හඳුනාගත් මම එකල ඔහුගෙන් එම වෘත්තිය මෙන්ම කල්පිටියේ ජන ජීවිත ගැනද බොහෝ කරුණු දැන කියාගතිමි.

විවිධ කටයුතු සඳහා මා කල්පිටියට ආගිය අවස්ථාවල කල්පිටිය තානායමේදී ජූඩ් සමඟ සම්පත් නිශාන්තත්, මාත් කතා කළ මාතෘකා අතර දියකිඳුරියට ප්‍රධාන තැනක් හිමිව තිබූ අයුරු මට මතකය.

**"මූදේ දියකිඳුරියෝ ඉන්නවා කියන විශ්වාසය මුළුමනින්ම බැහැර කරන්න අපිට කොහොමවත් බෑ. මොකද මේවා අපේ අත්තා, මුත්තා, නත්තා, පනත්තා කාලේ ඉඳලම තිබුණු විශ්වාස. නමුත් මම නම් කවදාවත්ම මූදේ ඔය කියන ජාතියේ දියකිඳුරියෙක් දැකලා නැහැ. ඒ හින්දා මට ඔය ගැන පැහැදිලි අදහසක් දෙන්න බෑ."**

ජූඩ් කීය. නමුදු ඔහු ඒ සමඟම කීයේ පැරණි සමාජය සේම තම ආයතනයෙන් බෝට්ටු සවාරි යාමට එන දෙස් විදෙස් සංචාරකයන් අතරේ හිඳින ළමා සහ තරුණ පිරිස්ද මෙම දියකිඳුරියන් පිළිබඳව මුහුදේදී විමසන බවයි.

විශේෂයෙන් අගනුවර හා තදාසන්න ප්‍රදේශවල ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන සිසු දරුවන් තුළ මෙම දියකිඳුරු උනන්දුව වැඩි වශයෙන් පවතින බවද ජූඩ් වැඩිදුරටත් කීය.



ජූඩ්

**"හොඳයි ඒ සේරම කාරණා පැත්තකට කරමු. මූද මැද්දෙදි කවුරුහරි දියකිඳුරියෙක් දැක්ක කෙනෙකුගේ ආරංචියක් ලැබුණොත් මට කියන්න, මම ඇවිත් ඒ මනුස්සයගෙන් ඒ ගැන සම්පූර්ණ විස්තරයක් ගන්නම්. හැබැයි ඒ ගැන බොරු විස්තර ඇහුවොත් මට ඒකත් අහුවෙනවා කියල කියන්න."** ඒ කතාබහ අවසානයේ මා ජූඩ්ට එසේ කී අන්දමද මතකය.

මෙම දියකිඳුරු සංකල්පය අපගේ දේශීය ජන විශ්වාසයක් නොවේ. ආසියා, යුරෝපා සහ අප්‍රිකා මහාද්වීපවල ජීවත්වන පිරිස් උඩුකය සුරූපී වනිතාවකගේ සහ සිරුරේ යටි කොටස මත්ස්‍යයෙකුගේ ස්වරූපයෙන් යුතු අර්ධ මානව අර්ධ මත්ස්‍ය ජීවීන් විශේෂයක් ගැන විශ්වාස කරති.

එමෙන්ම කිඳුරු හෙවත් කින්නර යන ජීවීන් මුහුදට පමණක් සීමා වී නැත. මිනිස් මුහුණක් සහ අශ්ව ශරීරයක් සහිත සංගීතයෙහි දක්ෂ වූ ජීවීන් විශේෂයක් ගැනද ජන විශ්වාසයක් තිබේ. එහෙත් මෙම දියකිඳුරන් යනුවෙන් හැඳින්වෙන පුරුෂ පක්ෂයේ ජීවීන් ප්‍රජාවක් පිළිබඳ වැඩි සඳහනක් නැත. ඔවුහු බොහෝවිට කාන්තා පාර්ශවය නියෝජනය කරන දියකිඳුරියෝම වෙති.

මෙම කිඳුරියන් කාන්තාවන්ට දර්ශනය නොවන බවටත් පිරිමින්ට පමණක් දර්ශනය වන බවටත් තොරතුරු තිබේ. එමෙන්ම මෙම දියකිඳුරියන්ද කාන්තාවන් මෙන් කොටස් දෙකකින් යුතු බවද පැවසෙයි. ඒ නාවිකයන්ට යහපත සලසන සහ ඔවුනට විනාශය පමුණුවන වශයෙනි. මුහුදේදී විපතට පත්වීමෙන් පසුව දියකිඳුරු දර්ශන දැකීමෙන් දිවි බේරාගත් නාවිකයන් පිළිබඳ තොරතුරු සහ මුහුදේදී දියකිඳුරියන් දර්ශනය වීමෙන් පසු විවිධ අනතුරුවලට ලක්වූ නාවිකයන් පිළිබඳ තොරතුරු මගින් ඒ දියකිඳුරියන්ගේ බෙදීම වෙන්කොට හඳුනාගත හැක.

මෙම දියකිඳුරියන් සම්බන්ධ පුරාණෝක්ති මීට වසර තුන්දහසක් දක්වා අතීතයට දිවයන බව පෙනෙයි. ක්‍රි.පූ. 850දී පමණ ග්‍රීසියේ විසූ හෝමර් නම් කවියාගේ 'ඔඩිසි' කාව්‍යයේද දියකිඳුරියන් පිළිබඳව සඳහන් වෙයි. එමෙන්ම ඇමරිකානු මහාද්වීපයට සංක්‍රමණය වූ ප්‍රථම යුරෝපීය ජාතිකයා ලෙස සැලකෙන ක්‍රිස්ටෝපර් කොලොම්බස් වර්ෂ 1494 දී පමණ තබන ලද සටහන්වලද මෙම දියකිඳුරියන් පිළිබඳ පුරාවෘත්ත සඳහන්ව තිබේ.

දිගුකලක් තිස්සේ සමාජ කරළියේ උච්චාවචනය වෙමින් තිබූ දියකිඳුරියන් පිළිබඳ පුරාවෘත්තය යළි ලෝක අවධානයට ලක්වන ලද්දේ වර්ෂ 1837 දීය. ඒ හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් ලියූ 'පුංචි දිය කිඳුරිය' (The Little Mermaid) නම් සුරංගනා කතාව නිසාය. එමගින්ම ඔහු විසූ ඩෙන්මාර්කය ජාත්‍යන්තර වශයෙන් කෙතරම් ප්‍රසිද්ධියට පත්වූයේද යත් එම කතාව පදනම් කරගනිමින් ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නුවර තනා ඇති දියකිඳුරියකුගේ ප්‍රතිමාවද ලෝක අවධානයට යොමුව තිබේ. එමෙන්ම පුංචි දියකිඳුරිය කෘතිය ඇසුරින් නිෂ්පාදනය කොට 1989 නොවැම්බර් 17දා මුල්වරට තිරගත කරන ලද එනමින් යුතු ඇමරිකානු චිත්‍රපටය යළි දියකිඳුරියන් පිළිබඳ සංකල්පය ලොව වටා පැතිරවීමට සමත් විය. ඇමරිකානු ඩොලර් මිලියන හතළිහක් වැයකොට නිපදවූ එම චිත්‍රපටයෙන් ලැබී ඇති ආදායම ඇමරිකානු ඩොලර් මිලියන දෙසිය තිස්පහකි. ඉන්පසුවද එම පුරාවෘත්තය ඇසුරින් චිත්‍රපට කිහිපයක්ම නිර්මාණය වී තිබේ.

මා සිතන්නේ මගේ හිතවතා ජූඩ් කී අන්දමට අපේ රටේ නාගරික ළමා සහ තරුණ ප්‍රජාව තුළ පවත්නා දියකිඳුරියන් පිළිබඳ උනන්දුවට ඉහත සඳහන් පුංචි දියකිඳුරිය මුල්වන්නට ඇත.

මේ අතර පසුගිය දිනයක කල්පිටිය නාවික හමුදා කඳවුරේ රාජකාරියේ නියුතු මගේ හිතවත් නිලධාරියෙක් මා ඇමතීය. ඔහු කියා සිටි දෙයින් මගේ සිත තුළ යටපත්ව තිබූ දියකිඳුරියන් පිළිබඳ මතකය යළි වේගයෙන් පිබිදුනි.

**"පහුගිය දවසක අපි අත්අඩංගුවට ගත්තු බෝට්ටුවක හිටපු කීපදෙනෙකුගෙන් ප්‍රශ්න කරද්දී ඉන් එක මනුස්සයෙක් දියකිඳුරියෝ දැකපු කතා ගැන දිගින් දිගටම දෙඩවන්න පටන්ගත්තා. අපි අත්අඩංගුවට ගත්තු බෝට්ටුව මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරපු එකක්. කොහොමහරි ඒ මනුස්සයා හොඳමට මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා හිටපු බව අපිට තේරුණා."** ඒ අනුව මෙම දියකිඳුරියන් පිළිබඳ සංකල්ප මිනිස් යටිසිතේ පැලපදියම්ව ඇති බවත් මත්ද්‍රව්‍ය භාවිතය ඇතුළු විවිධ හේතූන් මත ඒවා සජීවී දසුන් සේ යමෙකුට වැටහී යා හැකි බවත් පැහැදිලිය.



## නාවිකයන් සනසන වගේම වනසන දියකිඳුරියෝත් ඉන්නවා



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ



db
ESTD. 1848
DARLEY BUTLER
FRAGRANCE MICROCAPSULES INSIDE
Softny
FABRIC CONDITIONER
සුමුදු පහසක - මතක සුවඳ ඔබේ ඇඳුමට...
Nature Fresh
Comfy Blue
Softny AFTER WASH FABRIC CONDITIONER
රු. 450/- සිට ඉහළට
අලෙවිය සහ බෙදාහැරීම : සී/ස ඩාලි බට්ලර් සහ සමාගම. අංක 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.
www.darleybutler.com
softny@darley.lk
https://www.facebook.com/SoftnySriLanka
පාරිභෝගික අංශය (011) 4766 000




ජීවිත ගොඩනගන INSEE
සංස්ථා
පවුලේ සාමාජිකයෙක්
INSEE
සංස්ථා
සිමෙන්ති
சங்ஸ்தா சீமெந்து
SLS 1697
පෝට්ලන්ඩ් සංයුක්ත සිමෙන්ති
போர்ட்லெண்ட் கலப்புச் சீமெந்து
PORTLAND-COMPOSITE CEMENT - PCC/B-M(V-L)
STRENGTH CLASS - 42.5 N
SKIM COAT
SUPERIOR TILE ADHESIVE
TILE ADHESIVE
TILE MORTAR
INTERIOR SKIM COAT
FLOOR MORTAR
සෑම විසඳුමකටම විශ්වසනීය ශක්තිය INSEE සංස්ථා

පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරී මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැගීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම ‘පවුල’ නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.

# දරුවෝ හිටියාම මොකද? ඉස්සර වගේ මට ආදරෙන් ඉන්න

ගොඩක් ආදරවන්තයින්ගේ මතකයේ රැඳෙන්නේ මුලින්ම අනිත් කෙනා දැකපු දවසෙ මූණේ තිබුණු හිනාව වුණාට, මගේ මහත්තයාගේ ලස්සනම හිනාව මං දැක්කේ එදා නෙවෙයි. විවාහ වුණාට පස්සෙත් නෙවෙයි. ඒ ලස්සනම හිනාව මම දැක්කේ මං අම්මා කෙනෙක් වුණාට පස්සේ. මම වෙනුවෙන්, මගේ දරුවෝ තුන්දෙනා වෙනුවෙන් කරන කැපකිරීම, දරාගැනීම, ඉවසීම කියන මේ හැමදේකටම පස්සෙත් එයාගෙ මූණේ ඇඳෙන හිනාව තමයි මට ලස්සනම...

ඉතින් මට අවස්ථාවක් ලැබෙන හැමවෙලාවකම ඒ කැපකිරීම්, දරාගනීම් වෙනුවෙන් මම දහම්ට ස්තූතිවන්ත වෙනවා. බහුතරයක් පිරිමි දේවල් කරන්නේ ඇගයීමක් බලාපොරොත්තුවෙන් නොවෙන බව ඇත්ත. සමහරවිට බලාපොරොත්තු වුණත් නොලැබෙන බව දන්න නිසා ඇගයීම් නොලබාම යුතුකම් ඉෂ්ට කරන්න ඒ අය හිත් හදාගෙන ඉන්නවා වෙන්න පුළුවන්. හැබැයි එහෙම බලාපොරොත්තු නොවන මොහොතක පුංචි දෙයක් වෙනුවෙන් හරි එයාලට ප්‍රශංසා කළොත් ඒ ඇස් සතුටෙන් දිළිසෙන හැටි ඔයාලට දකින්න පුළුවන් වෙයි.

මගේ පිරිමි යාළුවෝ සමහරවෙලාවට එයාලගෙ පෙම්වතිය, බිරිඳ වෙනුවෙන් කරපු දේවල් මාත් එක්ක කියනවා.

එහෙම වෙලාවට මට දැනෙන සතුට නිසාම ඒ කරපු හොඳ දේ වෙනුවෙන්, ඒක පුංචි දෙයක් වුණත් එයාලට ප්‍රශංසා කරනවා. සතුටෙන් ඉන්න ගැහැනියක් හැමවෙලේම තවත් ගැහැනියකගේ සතුට දැකලා සතුටුවෙනවා මිසක් හූල්ලන්නෙ නෑ.

ගැහැනුන්ව ලේසියෙන් සතුටු කරන්න බෑ කියලා කතාවට කිව්වට, අපි ගොඩක් වෙලාවට පොඩි පොඩි දේවල්වලින් ගොඩාක් සතුටු වෙනවා. එහෙම නැති අයත් ඇති. ඒත් මං වගේම පුංචි පුංචි දේවල්වලින් සතුටු වෙන ගැහැනු තව ඕනතරම් ඉන්න බව මම දන්නවා.

ඇත්තටම මං බලාපොරොත්තු නොවුණු වෙලාවක දහම් මාව සිපගත්තාම මං ඒකෙන් සතුටු වෙනවා. මං හදලා දෙන කෑම එක මං අහන්න කලින් එයා රසයි කියද්දි, මං දුකෙන් ඉන්න වෙලාවට  ඇයි කියලා අහන්නැතුව මගේ අත් දෙකම අල්ලගෙන ඉන්දැද්දී මම පුදුම සතුටක් ලබනවා. මං ගොඩක්ම ආස වැඩට යන්න ගෙදරින් එළියට බහිද්දී වෙලාවට කන්න රෝසි කියලා මගේ නළලට දෙන හාද්දට. මං ආසයි අපේ දරුවෝ ඉස්සරහදිත් දහම් මාව ළඟට අරන් තුරුල් කරගෙන ඉන්නකොට. ඒකට වැඩියෙන්ම ආස නතාරි දූයි ඔව්න්‍යායි. “මමා පපා ලව්... කවායි” කියනවා. තව මේ වගේ පුංචි දේවල් ගොඩක් තියෙනවා ගැහැනියෙක්ගේ හිතේ සතුට සියුම් විදියට ස්පර්ශ කරන.

ඉස්සර මට මේ දේවල් දහම්ගෙන් ලැබුණෙ නෑ. එයා හිතුවේ දැන් අපි කසාද බැඳලා, පරිණතයි, ලොකුයි, ඉස්කෝලේ කාලේ හිටපු බොළඳ අය නෙවෙයි කියලා. එහෙම ඉන්නකොට අපි දෙන්නා අතරේ කතාවක් ඇති වෙච්ච වෙලාවක මං කිව්වා

**ජීවිතේ එක්ක හැල්මේ දුවද්දී දැනෙන මහන්සිය, පීඩනය නිසා සමහරුන්ට ආදරේ මතක්වෙන එකම තැන නිදි ඇඳ විතරක් වෙන්න පුළුවන්. ඒත් ඒක අවස්ථාවක් විතරක් නිසා තමන් කොච්චර ආදරණීයද කියලා පෙන්වන්න ලැබෙන කිසිම අවස්ථාවක් මඟහැරගන්න එපා**

“ගෑනු බැන්දම පරිණත වෙන්නේ නෑ, ඒත් ජීවිතේ ලැබෙන අත්දැකීම් එක්ක තමන්ට ආවේණික විදියට පරිණත වෙනවා. මගේ බොළඳකම තාම මං ගාව තියෙනවා. හැබැයි ඒක මගේ දුර්වලකමක් නෙවෙයි. ඔයා ගාව මං හුරතල් වෙන්න ආස මගේ ඒ බොළඳකම නිසා. ඔයත් ඒ වෙලාවට ටිකක් බොළඳ වෙන්න. මට පරිණත ප්‍රේමවන්තයෙක් ඕනේ නෑ. මට දැනෙන්න ආදරේ දෙන්න” කියලා. ඉස්සර මං මේ දේවල් කියන්නේ කේන්ති අරන් යටිගිරියෙන් කෑගහගෙන. ඒත් දැන් මං මට දැනෙන හැමදේම හරිම සුහදව යාළුවෙක් එක්ක කතා කරනවා වගේ තමයි දහම්ට කියන්නේ. එතකොට එයත් ඒක වඩා හොඳට තේරුම් ගන්නවා. මගේ හිතත් නිදහස් වෙනවා.

ගොඩක් අය තමන්ගේ ලිංගික ජීවිතේ උපරිමෙන් විඳින්න ආසයි. ඒක ඇත්තටම කසාද ජීවිතේ ඇතුළේ තියෙන සුන්දරම දෙයක්. කසාද ජීවිතේ ඇල්මැරුණු ගතියක් නැතුව සතුටෙන් තියාගන්න දෙන්නාට දෙන්නාගේ ආදරණීය එකතුවීම ගොඩක් බලපාන බව අපි හැමෝම දන්නවා. ඒත් සමහර ගැහැනු ඊට වඩා අර මං කිව්ව පුංචි පුංචි දේවල් විඳින්න ආසයි.

අපි නොහිතුවට ගොඩක් වෙලාවට පිරිමිත් ඒ වගේ පුංචි දේවල්වලින් සතුටු වෙනවා. ඒ නිසා චෝදනා කරන්න, අඩුපාඩු හොයන්න ඉස්සර වෙන්න කලින් ඒ ගැනත් හිතන්න වෙනවා.

ආදරේ අමතකම වෙලා, නැත්නම් මඟහැරිලා නිදි ඇඳේදි විතරක් ආදරණීය වෙන ගැහැනු, පිරිමි ඕනතරම් ඇති. හැබැයි ඒ ගොඩක් අය එහෙම තත්ත්වයකට පත්වෙලා තියෙන්නේ ඕනකමින්ම නෙවෙයි. ජීවිතේ එක්ක හැල්මේ දුවද්දී දැනෙන මහන්සිය, පීඩනය නිසා සමහරුන්ට ආදරේ මතක්වෙන එකම තැන නිදි ඇඳ විතරක් වෙන්න පුළුවන්. ඒත් ඒක අවස්ථාවක් විතරක් නිසා තමන් කොච්චර ආදරණීයද කියලා පෙන්වන්න ලැබෙන කිසිම අවස්ථාවක් මඟහැරගන්න එපා.

මහත්තයා වැඩ ඇරිලා ගෙදර ආවම අරක නෑ මේක නෑ, ඒක කැඩිලා කියන්නේ නැතුව උණුසුම්ව වැළඳගෙන “මහන්සිද? තේ එකක් හදන් එන්නම්, බීලම ඇඟ සෝදගන්න” කියන මේ පුංචි වචන ටික සමහරවෙලාවට ඇති පිරිමියෙක්ගේ හිත ආදරෙන් පිරෙන්න. ඉතින් ඒ දේවල් තේරුම් අරන් ඒ ආදරේ දෙන්න පුළුවන් නම් ගොඩක් ප්‍රශ්නවලට උත්තර ඉබේම හම්බවෙනවා.

“ඔයා අපි වෙනුවෙන් මහන්සි වෙනවා, ඒකට ස්තූතියි ගොඩක්.”

“අපිටම හැමදේම අරන් දෙනවනේ. මේක ඔයාට මගෙන්” කියලා නොහිතන වෙලාවක පොඩි තෑග්ගක් දීලා, ආස කෑමක් හදලා දීලා, කේන්තියෙන් නැතුව ආදරෙන් හිතේ තියෙන දේවල් විවෘතව කතා කරලා, පුංචි දේකින් වුණත් අගේ කරන්න පුළුවන් හැමතැනදිම අගේ කරලා එයාලව හිටියාට වඩා ආදරණීය කරන්න පුළුවන් වෙන කාටවත් නෙවෙයි අපිටම තමයි.

විවාහ ජීවිතයක් අවුල් කරගන්න හරිම ලේසියි. රැකගන්නයි ගොඩක් අමාරු. ඒ නිසා මොන වැරදි අඩුපාඩු තිබුණත් අනිත් කෙනාගේ එක හොඳ ගතිගුණයක් හරි හොයාගෙන ආදරේ කරන්න. එහෙම කළාම ගොඩක් දේවල් වෙනස් වෙන බව ඔයාට දැනෙන්න පටන්ගනියි. ගැහැනියක් විදියට ඔයා කැමති පුංචි පුංචි ආදරණීය දේවල්වලට අනිත් කෙනාත් කැමතියි කියලා තේරුම්ගන්න. අනිත් හැමදේම වගේ ආදරේ වුණත් දෙන තරමට තමයි ලැබෙන්නේ.



**ගැහැනියක් විදියට ඔයා කැමති පුංචි පුංචි ආදරණීය දේවල්වලට අනිත් කෙනාත් කැමතියි කියලා තේරුම්ගන්න. අනිත් හැමදේම වගේ ආදරේ වුණත් දෙන තරමට තමයි ලැබෙන්නේ**

■ හෂිනි මනමේන්ද්‍ර


HOME
SLT-MOBITEL
Home 4G
ගෙදරට හයියක්
වැඩිම ආවරණය
හොඳම Data Add-ons
Loyalty Data
HOMEBROADBAND
4GLTE
ශ්‍රී ලංකාවේ වේගවත්ම
බ්‍රෝඩ්බෑන්ඩ් ජාලයෙන් බලගැන්වේ.
www.sltmobitel.lk
SLTMOBITEL
එකම එක සබැඳියාව




# ලුණු ගණුදෙනුව හරියට නොකර කණුකුණු ගාලා වැඩක් නෑ

වැඩිපුර සීනි කෑවහම මොකද වෙන්නේ කියලා මේ මෑතකදි අපි කතා කළා මතක ඇති. ඒ ලිපිය කියෙව්ව දන්න අඳුරන කෙනෙක් "අනේ මම නම් සීනි කන්නේ නැහැ. ඒ නිසා මටනම් කිසි ප්‍රශ්නයක් නැහැ" කියලා මාත් එක්ක මහ උජාරුවට වගේ කිව්වා.

හැබැයි දන්න තරමින් ඒ හාදයා සීනි පංගුවට මදි නොකියන්න ලුණු කනවා. සීනි කන්නේ නැහැ කියලා පම්පෝරි ගහන ගොඩක් උන්දැලා සීනි පෙනුමටම ඉන්න සීනිවල නිවුන් සහෝදරයා ලුණු ගැන වැඩිය හිතන්නේ නැහැ. ලුණු මහත්තයා ගැනත් කතා නොකර අරින්න හොඳ නැහැ කියලා හිතුවේ ඒකමයි.

ලුණු කියන්නේ රසායනික සංයෝගයක්. සෝඩියම් අනු එකකට ක්ලෝරයිඩ් අනුවක් එක්කාසු වෙලා හැදෙන සෝඩියම් ක්ලෝරයිඩ්වලට තමා අපි ලුණු කියන්නේ. ලුණු ගැන කියද්දි කතාවක් මතක් වුණා. ඔන්න 1930 දී සුද්දා ලුණු සම්බන්ධයෙන් ඉන්දියාවට අලුත් නීතියක් පැනෙව්වා. ඒ අනුව ඉන්දියානුවන්ට ලුණු නිෂ්පාදනය සහ විකිණීම තහනම්. ඒ වෙනුවට ලොකු බද්දක් එකතු කරලා ඒ අය ලුණු වික්කා. ලුණු ගන්න සල්ලි නැති නිසා දුප්පත් අයට ලුණු නැතිව කන්න වුණාලු. ඒ නිසා සමහරු ලෙඩ වුණාලු.



ඉස්සර අපේ රටෙත් ලුණු ප්‍රශ්න තිබුණාලු. කුලෙන් අඩු අයට කෑමවලට ලුණු එකතු කරන්න බැරිලු. කාගාව හරි නිතරම ලුණු මුලක් තියේනම් උන්දැ මහ ධනවතෙක් විදියටලු හැඳින්නෙව්වේ

ප්‍රශ්නේ බලාගෙන ඉන්න බැරි තැන මහත්මා ගාන්ධිතුමා අනුගාමිකයෝ පිරිසක් හදාගෙන ලුණු බද්දට විරුද්ධව පාගමනක් ගියා. බය නැතිව ලුණු විකුණන්න කියලා ඉන්දියානුවන්ට කිව්වා. මිනිස්සු ඇහුවේ ගාන්ධි කිව්ව දේ. අන්තිමට තත්ත්වය පාලනය කරගන්න බැරිම තැන සුද්දෝ ලුණු බද්ද හකුළ ගත්තලු.

1789දී ප්‍රංශයේ විප්ලවයක් ඇතිවුණානේ. සාමාන්‍ය ජනතාව බැස්ටීලයට (එකල ප්‍රංශ රජ මාලිගය) පහරදීලා 16 වැනි ලුවී රජාව මරලා දැම්මා. 16 වැනි ලුවී ජනතාවට ලුණු සැපයීම නතර කිරීමත් මේ විප්ලවයට හේතුවුණා කියලයි ඉතිහාසයේ කියැවෙන්නේ.

ඔය රටවල විතරක් නෙමේ ඉස්සර අපේ රටෙත් ලුණු ප්‍රශ්න තිබුණාලු. කුලෙන් අඩු අයට කෑමවලට ලුණු එකතු කරන්න බැරිලු. කාගාව හරි නිතරම ලුණු මුලක් තියේනම් උන්දැ මහ ධනවතෙක් විදියටලු හැඳින්නෙව්වේ. හැබැයි පස්සේ අරගල කරලා අපේ මිනිස්සුත් ලුණු අයිතිය දිනාගෙන තියෙනවා.

ඇත්තටම ලුණු කියන්නේ විප්ලව කරලා දිනාගන්න ඕන දෙයක් තමයි. මොකද ශරීරයේ රුධිර පීඩනය පාලනය කරගන්න වගේම මොළයේ ස්නායුවලින් පණිවිඩ හුවමාරු කරගන්නත් අපිට ලුණුවල අඩංගු සෝඩියම් කියන මූලද්‍රව්‍ය අවශ්‍යයි.

ඔය දේවල් ටික කරගන්න සාමාන්‍ය මනුස්සයෙක්ට දවසකට ලුණු 5gක් (තේ හැන්දක්) ඇති. ඒ ප්‍රමාණයෙන් අපේ අයඩීන් අවශ්‍යතාවය සපුරගන්නත් පුළුවන්. හැබැයි අපේ රටේ ගොඩක් උදවිය ඔය ප්‍රමාණේ වගේ තුන් ගුණයක් විතර ලුණු කනවය කියලයි සමීක්ෂණවලින් ඔප්පු වෙලා තියෙන්නේ. ඔය විදියට වැඩිපුර ලුණු කෑවහම මොකද වෙන්නේ කියලා අපි කතා කරමු. ඒ වගේම ලුණු අඩු කරගන්න උපක්‍රම ටිකක් ගැනත් බලමු.

ඉස්සර හැම ගෙදරකම ලිප මුල්ලේ ලුණු පොල්කට්ටක් තිබ්බා. ලුණු කැටවලට වතුර එකතු කරලා තමයි කෑමවලට ඉස්සේ. එතකොට ලුණු සාන්ද්‍රණේ යම්දුරකට අඩුවුණා. හැබැයි දැන් ගොඩක්දෙනා ලුණු කුඩු විදියට පාවිච්චි කරන නිසා කැවෙන ලුණු ප්‍රමාණය වැඩියි.

ගෙදර කෑමවලට දාන ලුණුවලට අමතරව පිටස්තරිනුත් අපිට ලුණු එකතු වෙනවා. සොසේජස්, බේකන්, මීට්බෝල්ස් වගේ සැකසූ මස්වල ලුණු අධිකයි. ඒ වගේම අල චිප්ස්, ස්නැක්ස්, බටර්, චීස්, මාමයිට්, ටින් කළ කෑම, සීරියල්, පාන් ඇතුළු බේකරි කෑම, රයිස්, කොත්තු, සෝස් වර්ග, බයිට්ස්, පපඩම්, ලුණු දැමූ ආහාරවලත් ඕසෙට ලුණු. ඉතින් එහෙම බැලුවහම අපිට වැඩිපුර ලුනු කැවෙනවා කියන එක ගැන අමුතුවෙන් පැහැදිලි කරන්න ඕනේ නෑනේ?

ඉතින් ටිකක් වැඩිපුර ලුණු කැවහම මොකද වෙන්නේ? මෙන්න මේකයි. ලුණු වැඩිපුර කෑවහම අපේ ඇඟේ සෝඩියම් ප්‍රමාණය වැඩි වෙනවා. ශරීරයේ වතුර රඳවාගන්න සෝඩියම්වලට පුළුවන්. සෝඩියම් වැඩිවෙද්දි අපේ ඇඟේ වතුර වැඩි වෙනවා. මේ වතුර රැඳෙන්නේ ලේ වල. එතකොට අපේ රුධිර පරිමාව වැඩිවෙනවා. එතකොට රුධිර නහර හරහා යන ලේ ප්‍රමාණය වැඩි වෙනවා. අන්න ඒක අධිරුධිර පීඩනය ඇතිවෙන්න හේතුවක්.

ඉඳලා හිටලා වැඩිපුර ලුණු කෑවට කමක් නැතිලු. හැබැයි දිගින් දිගටම ලුණු වැඩිපුර කන්න ගියාම රුධිර නහර වෙනස් වෙන්න, හෘදය දුර්වල වෙන්න, වකුගඩුවල ක්‍රියාකාරිත්වය අඩුවෙන්න එහෙම පුළුවන්. හෘදයාබාධ, අංශබාගය හැදෙන්නත් ලුණු ප්‍රධාන හේතුවක්. ලෝකේ බෝනොවන රෝගවලින් අවුරුද්දකට සිද්ධවෙන මිනිස් මරණ මිලියන 2.5ක් පිටිපස්සේ ලුණු මහත්තයාත් ඉන්නවා.

ලුණු වැඩියෙන් කන එක ලස්සනටත් බලපානවා. ශරීරයේ සෛලවල සහ සමේ සෛලවල තියෙන ජලය ඇදලා ලේ වලට දාන්න සෝඩියම්වලට පුළුවන්. ඉතින් වැඩිපුර ලුණු කෑවහම ශරීරය විජලනය වෙනවා. ලුණු ගොඩක් කෑවම නිතරම වතුර තිබහ හැදෙන්නේ ඒකනේ. මේ නිසා සම වියැළෙන්න පුළුවන්. ඒ වගේම සෝඩියම් නිසා එකතුවෙන අතිරික්ත ජලය අපේ ඇස් යට, උගුර දෙපැත්තේ වගේම බඩෙත් එක්කාසු වෙනවා. එතකොට මූණ, ඇස් යට ඉදිමෙනවා, බඩ පිපෙනවා.

ඉතින් කොහොමද ලුණු කන එක අඩු කරන්නේ? ලුණු කියන්නෙත් සීනි වගේම ඇබ්බැහියක්. ඒ කියන්නේ අපේ ඇඟට වඩා ලුණු ඕනේ අපේ මොළේට. ඉතින් සති දෙකක් ලුණු අඩුවෙන් කෑවොත් ලුණු පුරුද්දත් පාලනේ කරගන්න පුළුවන්.

වෙළඳපොළෙන් ආහාර ගන්නකොට ලේබල බලන්න. රතු ලේබලය=ලුනු 22% වැඩි, තැඹිලි/කහ=5-22% අතර, කොළ= 5% අඩු. රතු සහ තැඹිලි/කහ සංඥව අඩංගු ආහාර පුළුවන් තරම් අඩුකරන්න. ඇසුරුම් කළ නැත්තම් කල්තබාගන්න ආහාර වෙනුවට නැවුම් ආහාරම මිලදී ගන්න බලන්න.

ගෙදර සාමාජිකයෝ හතරදෙනෙක් ඉන්නවා කියලා හිතන්නකෝ. මැනගන්න ක්‍රමයක් තියෙනවා නම් මුලින්ම ලුණු 5g ගානේ හතරක් 5gx4= 20gක් වෙන් කරගන්න. අන්න ඒ ටික ව්‍යාංජනවලට එකතු කරන්න. අනික ගොඩක් අය බත් උයද්දි ඒකටත් ලුණු දානවා. ව්‍යාංජනවලට ලුණු දාන නිසා බත්වලට ලුණු එකතු කරන්නම එපා. සලාද, බීම වර්ග හදද්දි එහෙමත් ලුණු දාන්න එපා.

ව්‍යාංජනයක් ලිපේ තියද්දි ලුණු එකතු කරන්න එපා. එතකොට ආහාරය ඇතුළටම ලුණු උරාගන්නවා. එතකොට හොද්දේ ලුණු රස අඩුවෙන නිසා තවත් ලුණු දාන්න හිතෙනවා. ඒ නිසා කෑම උයලා ඉවර වුණාට පස්සේ ලුණු දාන්න.

කල්තබාගත් ආහාර, ටින් කෑම, ලුණු දැමූ කෑම උයනවා නම් ඒව්වා උයන්න කලින් සෝදන්න. එතකොට යම් ලුණු ප්‍රමාණයක් ඉවත් කරගන්න පුළුවන්.

ගොඩක් වෙලාවට බත්පතින් අපි හොයන්නේ ලුණු රස. ඉතින් කෑමවල ඇත්තම රස අපි දන්නෙම නැති තරම්. ලුණු වෙනුවට සුදුලූනු, ලූනු, කොත්තමල්ලි, අබ, සියඹලා, ගොරකා, සුදුරු, උළුහාල්, සේර, කුරුඳු, කරපිංචා, රම්පෙ වගේ දේ එකතු කරනවා නම් ව්‍යාංජනයක හරි රහ හොයාගන්න පුළුවන්.

වෛද්‍යවරුන් ලුණු කන්නම එපා කියලා තියෙන කෙනෙක් නම් වැඩිපුර මාළු, එළවලු, පලතුරු කන්න. ඒවගෙන් අපේ ඇඟට අවශ්‍ය සෝඩියම් ප්‍රමාණය ලබාගන්න පුළුවන්.

සමහරු ඉන්නවා බත්පත බෙදාගත්තට පස්සේ ලුණු මදි කියලා ලුණු පොල්කට්ටම පිඟානට හලාගන්න. එහෙම කරන්න එපා. පොඩ්ඩක් මනස පාලනේ කරගන්නත් බලන්න. හොද්දට ලුණු මදි කියලා ගෙදර ගෑනිට දෙස් කියන පිරිමිත් ඉන්නවනේ. ගොඩක් ගෙවල්වල පවුල් ප්‍රශ්න ඇතිවෙන්නත් හේතුවක්ලුනේ ලුණු. මේ ලිපිය කියවලා හොද්දට ලුණු අඩු කළාම ගෙදර එහෙම ප්‍රශ්න ඇතිවෙයි කියලා හිතනවා නම් ගෙදර උන්දැට කලින්ම මේ ලිපිය පෙන්වන එකයි හොඳ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




# ශල්‍යකර්මයකින් තොරව අර්ශස් රෝගයට නිසැක සුවයට හෝමියෝපති ප්‍රතිකාර

සමාජයේ බොහෝ දෙනෙක් රහසිගතව පීඩා විඳින කායික රෝගී තත්වයක් ලෙස Hemorrhoid හෙවත් Piles නැත්නම් අර්ශස් හැඳින්විය හැක. ගුද විවරය හා ගුදය ආශ්‍රිත පවතින ප්‍රදේශ වලට රුධිරය



සපයන රුධිර නාළවල යම්කිසි හේතු සාධකයක් මත යෙදෙන පීඩනය නිසා සාමාන්‍ය ලෙස ශිරා රුධිර නාළ ඔස්සේ ඉහළට යන රුධිර නාළ අවහිර වීම නිසා එවිට එම රුධිර නාළ වල රුධිරය එකතු වීම, ඉලිප්පීම, ඉදිමුමකට ලක්වීම අර්ශස් රෝගයයි.

පාද වල දක්නට ලැබෙන Vericose (Vericose Vein) රෝගි තත්වය මෙයට සමාන අවස්ථාවකි.

### අර්ශස් වර්ග

අර්ශස් හට ගැනීම ගුද මාර්ගයට ඇතුළතින් සිදුවන අභ්‍යන්තර අර්ශස් රෝගි තත්වය Internal Hemorrhoids ලෙසද,ගුදය වටා සමට යටින් බාහිරව ඇතිවන අර්ශස් External Hemorrhoids රෝගය ලෙසද හඳුන්වයි.

### රෝග ලක්ෂණ

ගුද මාර්ගය හා විවරය ආශ්‍රිත ගෙඩි හට ගැනිම, ඉදිමීම, පිටතට නෙරා ඒම, මලපහ කිරීමේදී ඇතිවන අපහසුතාවය, දැවිල්ල, ඉඳිකටු අනිනවා වගේ දැනීම, රුධිරය පිටවීම බාහිරව ඇතිවන අර්ශස් රෝග ලක්ෂණ වේ.

ගුද මාර්ගයේ අභ්‍යන්තරව ඇතිවන අර්ශස් ගුද මාර්ගය ඇතුළත හටගනී නමුත් මෙම තත්වය බාහිරව දැනීමට නොහැකි වේ. මෙහිදී රෝගියාට අපහසුතාවය සුලභව දක්නට නොලැබුණත් මලපහ කිරීමේදී ඇති කරන පීඩනයත් සමග වේදනාව රහිත රුධිර වහනය වීම සිදුවේ.

### අර්ශස් ඇතිවීමට හේතු සාධක (Causes)

- **අධික තරබාරුකම**
- **දිගු කාලින මලබද්ධය**
- **දිගු කාලින පවතින කැස්ස**
- **දිනපතා බර ඉසිලීම**
- **දිගු වේලාවක් ඉඳගෙන සිටීම**
- **ව්‍යායාම මදිකම**
- **අඩු තන්තු සහිත ආහාර රටාව**
- **ගුද සංසර්ගය**

### අවදානම් සාධක (Risk Factors)

වයසට යාම ගුද මාර්ගයේ හා ගුදයේ ඇති නහර වලට සම්බන්ධක පටක දුර්වල විම සිදුවේ. ගර්භණී අවධිය උදරය මගින් ගුද මාර්ගය මත අතිරේඛ පීඩනයක් යෙදීම හේතු සාධක වේ.

### සංකුලතා (complications)

දීර්ඝ කාලීනව සිදුවන රුධිරය වහනය වීමත් සමග නිරෝගී රතු රුධිරාණු මගින් සෛල වලට ඔක්සිජන් ($O_2$) සැපයුම අඩාළ වීම රක්තහීනතාවය (Anemia) ඇතිවනු ඇත. එය Full Blood Count වාර්තාවේ පවතින Hemoglobin ප්‍රමාණය අනුව සනාථ කර ගත හැක.

### වැලැක්වීම (Prevention)

පලතුරු, එළවළු, ධාන්‍ය වර්ග, ඉහළ තන්තු සහිත ආහාර අනුභව කිරීම. මේ තුළින් මලපහ මෘදු වන අතර මලපහ පිටකිරීම පහසු වනු ඇත.

දිනකට වතුර විදුරු 6ක් /8ක් වැනි ප්‍රමාණයක් පානය කිරීම තුළින් මලපහ මෘදු විම සිදුවේ.

වැඩි වේලාවක් වාඩිවී සිටීමෙන් වැළකිය යුතුය.විශේෂයෙන් වැසිකිළිය මත වැඩි වේලාවක් වාඩි වී සිටීම මගින් ගුදය තුළ වූ නහර මත පිඩනය වැඩි කරයි.

ව්‍යායාම සිදුකළ යුතුය. ව්‍යායාම තුළින් අතිරික්ත බර අඩුවීම,නිධන්ගත මලබද්ධය හා නහර මත ඇති කරන පීඩනය වැළකීම සිදුවේ.මේ තුළින් අර්ශස් රෝගය වළක්වා ගත හැකිය.

### හෝමියෝපති ප්‍රතිකාර

අර්ශස් රෝග තත්වය දරුණුවට පැවතුනත්, වේදනාකාරී වුවත් ඔබට ඉක්මන් සුවය හෝමියෝපති ප්‍රතිකාර තුලින් ලබා ගත හැක. රෝගය තළ විඳවීම සම්පූර්ණයෙන්ම සුව කිරීම මෙහි ඇති විශේෂත්වයයි. සරල ප්‍රතිකාර ක්‍රමයක් වීමද, පාවිච්චිය පහසු වීමද, තිත්ත රසයෙන් යුක්ත නොවීමද, අතුරු ආබාධ නොමැති වීම මෙම ප්‍රතිකාර ක්‍රමයේ සුවිශේෂිත්වය වනු ඇත.

හෝමියෝපති මුලධර්මයට අනුකූලව රෝග ලක්ෂණ වලට සමාන නිවැරදි ප්‍රතිකාරයට අනුගත වීම ශල්‍යකර්මයකින් තොරව ඉක්මන් සුවයට මග පාදනු ඇත.



සුවහසක් රෝගීන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුවපත් කරන එච්.කේ. හෝමියෝපති ආරෝග්‍යශාලාවේ නිර්මාතෘ වෛද්‍ය අනුෂා හේමකුමාර

ප්‍රතිකාරය අර්ශස් වලට පමණක් නොව ශරීරයේ පවතින සෑම රෝගි තත්වයකම එකවර ප්‍රතිකාර ගත හැක. ප්‍රතිකාරය ප්‍රතිශක්තිකරණ පද්ධතිය උත්තේජනය වීම පවතින රෝග සියල්ලන්ට සුවය අත්දකිනුයේ හෝමියෝපති ප්‍රතිකාර රෝගයට නොව රෝගියාට වීමෙන්ය.

මෙම ප්‍රතිකාර ක්‍රමය ඔබට අනුගත වුවහොත් විඳවීම වෙනුවට ස්ථිර සුවය ඔබ අත්පත් කරගනු නොඅනුමානය.

සටහන ජේ. ඒ. සී. ශාන්ත කුමාර

**විමසීම් :**
**එච්.කේ. හෝමියෝපති හෙල්ත් කෙයාර් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්**
**නො.12, පී.බී. අල්විස් පෙරේරා මාවත, කටුබැද්ද, මොරටුව.**
**0112 637740/ 0112 637741**
**071 8250716 / 071 8250717**



# අපි ඉගෙනගන්න ඕන සල්ලි වියදම් කරන විදිය මිසක් හම්බකරන විදිය නෙවෙයි

## ගයංසා නෙතුශලි

**අලෙවි අධ්‍යක්ෂිකා ශ්‍රී කාන්ත ජුවලර්ස් පුද්ගලික සමාගම**

ලැස්ලෝ හැනේයක්ස් ඇමරිකානු ජාතිකයෙක්. 2010දී ඔහු සතුව තිබුණු බිට්කොයින් (ඩිජිටල් මුදල්) 10,000ක් දීලා පීට්සා දෙකක් අරගන්නවා. බිට්කොයින්වලින් සැබෑ ලෝකෙදි ගණුදෙනුවක් කරපු පළමු කෙනා විදියට ලැස්ලෝ ලෝකෙ පුරා ප්‍රසිද්ධ වෙනවා. ඉතින් ඒ දවස්වල ලැස්ලොට හරි සන්තෝසයි.

ඒ කාලේ ඩිජිටල් සල්ලිවලට ලොකු වටිනාකමක් තිබුණේ නැතුවට පස්සේ බිට්කොයින්ස්වල වටිනාකම එන්න එන්න වැඩිවුණා. අද බිට්කොයින් 10,000ක වටිනාකම කෝටි 2,260යි. ඉතින් අර බිට්කොයින්වලින් පීසා දෙකක් කාපු ලැස්ලෝ දැන් ඒ ගැන හිත හිතා සෑහෙන දුකින් කල් ගෙවනවා කියලයි ආරංචිය.

කිහිපවතාවක්ම ලෝකෙ ධනවත්ම පුද්ගලයා වෙච්චි වොරන් බෆට් 1960දී ඩිස්නි සමාගමෙන් ඩොලර් ලක්ෂ හතරක කොටස් මිලදී ගන්නවා. පස්සේ තවත් අවුරුදු දෙකකින් ඔහු ඒ කොටස් ඩොලර් ලක්ෂ හයකට විකුණනවා. හැබැයි අද ඒ කොටස්වල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන අටකට වැඩියි. ඉතින් එද කරපු ඒ ගණුදෙනුව ගැන සතුටු නැහැයි කියලයි අද වොරන් බෆට් කියන්නේ.

මේ කතා දෙකෙන්ම ගන්න තියෙන දේ නිවැරැදි තැනදි නිවැරැදි තීරණ ගත්තේ නැත්තම් පස්සේ පසුතැවෙන්න වෙනවා කියන එකයි. ව්‍යාපාරයක සාර්ථකත්වය විතරක් නෙමෙයි පෞද්ගලික ජීවිතේ සාර්ථකත්වය පවා රැඳිලා තියෙන්නේ හරි වෙලාවෙදි අපි ගන්න හරි තීරණය නිසා කියලා අපිත් එක්ක කිව්වේ අද කවරය හැඩකරන සොඳුරු යුවතියයි. ව්‍යාපාරයේත් ඇගේත් සාර්ථකත්වයට හේතුවුණු එවැනි තීරණ ගැනත් අපිත් එක්ක කතා කරපු ඇය ගයංසා නෙතුශලී.

> **මම නම් බිස්නස් එකට වුණත් රුපියලක් අයින් කරන්නේ ඒකෙන් රුපියල් පහක් බලාපොරොත්තුවෙන්**

දශක හතරකට එහා ඉතිහාසයක් තියෙන ලංකාවේ අංක එකේ ස්වර්ණාභරණ ව්‍යාපාරයක් වෙන ශ්‍රී කාන්ත ජුවලර්ස් පුද්ගලික සමාගමේ අලෙවි අධ්‍යක්ෂිකාව ඇයයි.

"මගේ තාත්තා කේ.ඒ. සුනිමල්. තාත්තා ව්‍යාපාරික පසුබිමක් තිබුණු පවුලක කෙනෙක් නෙමෙයි. තරුණ කාලෙදි ඔහුට ව්‍යාපාරයක් කරන්න ඕනේ කියලා හිතිලා 1977දී තමයි ඔහු මේ ව්‍යාපාරය පටන් අරගෙන තියෙන්නේ. මුලදි පොඩියට පටන්ගත්තු ව්‍යාපාරය අඩියෙන් අඩිය ඉස්සරහට ගේන්න තාත්තා ගොඩක් කැපකිරීම් කළා. ඉතින් මේ වෙනකොට අපේ ආයතනයේ ශාඛා අටක් තියෙනවා."

ගයංසා ඇගේ පවුලේ බාලයා. ඇයට අක්කලා හතරදෙනෙකුයි අයියා කෙනෙකුයි ඉන්නවලු.

"පොඩි කාලේ ඉඳලා අපි හැදුනේ මේ ව්‍යාපාරයත් එක්කමයි. ඉස්කෝලේ නිවාඩු කාලෙට අම්මලා අපිව බ්‍රාන්ච්වලට එක්කරගෙන යනවා. එතකොට එතැන වැඩ වෙන හැටි අපි බලාගෙන ඉන්නවා."

තාත්තාගේ වැඩකටයුතු ගැන ඒ විදියට බලාගෙන හිටියට පවුලේ ව්‍යාපාරයට සම්බන්ධ වෙන්න පුංචි කාලේදි ගයංසට අදහසක් තිබිලා නෑ.

"තාත්තගේ බිස්නස් එක නැතුව වෙනත් ව්‍යාපාරයක් පටන්ගන්න තියෙනවානම් හොඳයි කියලයි පොඩි කාලෙදි හිතුවේ. තාත්තා ව්‍යාපාරය වෙනුවෙන් කරන කැපකිරීම් දැක්කහම ඒ තීරණය වෙනස් වුණා. මේ ව්‍යාපාරයම තවත් සාර්ථක කරගන්න ඕනේ කියලයි පස්සේ හිතුණේ.

"මම ඉගෙනගත්තේ කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයෙන්. ව්‍යාපාර අංශයෙන් උපාධිය සම්පූර්ණ කරල තමයි ව්‍යාපාරයට සම්බන්ධ වුණේ. තාත්තා මාව දන්න හැදුවේ ඩිරෙක්ටර් පුටුවට. හැබැයි එහෙම එකපාර ඒ තැනට යන්න මට ඕන වුණේ නැහැ. ඒ නිසා මම පොඩිම තැනින් ජොබ් එක පටන්ගත්තා. ව්‍යාපාරයක් සාර්ථක කරගන්න නම් හැම පියවරකම වෙන දේවල් ගැන ව්‍යාපාරිකයට දැනුමක් තියෙන්න ඕනේ කියන එකයි මගේ අදහස."

පහලම තනතුරේ ඉඳලා ඇය පියවරෙන් පියවර ඉස්සරහට එන ගමන් හැමදෙයක්ම ඉගෙනගත්තලු. ඊටපස්සේ තමයි ඇය ආයතනයේ අලෙවි අධ්‍යක්ෂිකාව විදියට වැඩ පටන් අරන් තියෙන්නේ.

"අයියයි මමයි එකතුවෙලා තමයි දැන් ව්‍යාපාරය කරගෙන යන්නේ. මම වැඩ කරන්න ගත්තට පස්සේ ගොඩක් අලුත් තීරණ ගත්තා. කොවිඩ් කාලෙදි රත්තරංවලට ගෙවන්න ඕන පොලිය අඩුකළා. ඉතින් බොහොම ඉක්මනට අපිට ලොකු පාරිභෝගික පිරිසක් හැදුණා.

ඒ වගේම රත්තරං ඩිසයින්ස් වුනත් කාලෙන් කාලෙට අලුත් වෙන්න ඕනේ. නිතරම ලෝකේ ෆැෂන්ස් ගැන හොයන්න ඕනේ. ඒවා කොපි නොකර අපිටම අනන්‍යතාවයක් හදගන්න ඕනේ. ඒ දේවල්වලටත් මම සෑහෙන මහන්සි වෙනවා''

ආයතනයේ දියුණුව වෙනුවෙන් නිවැරදි මොහොතේ නිවැරදි තීරණ ගැනීම වෙනුවෙන් වගේම කෙටි කාලයක් තුළ විශාල පාරිභෝගික සංඛ්‍යාවක් එක්කාසු කරගැනීම වෙනුවෙන් 2022 ශ්‍රී ලංකාවේ හොඳම සියදෙනාගේ සම්මාන (Sri lankan top 100 award) උළලේදි ළාබාලතම අධ්‍යක්ෂිකාව කියන සම්මානය ඇයට ලැබුණා.

"මේ ක්ෂේත්‍රයේ ලොකු තරඟයක් තියෙනවා. ඉතින් ඒ තරඟය දිනන්න නම් ගොඩක් කැපකිරීම් කරන්න, මහන්සි වෙන්න ඕන. අනික සමහර ප්‍රශ්න නිසා අපි මානසිකව වැටුණු තැන් තිබුණා. එකක් තමයි විශ්වාසය කඩවීම. අපි විකුණන්නේ රත්තරං. ඉතින් අපේ ස්ටාෆ් එක ගොඩක් විශ්වාසවන්ත වෙන්න ඕනේ. හැබැයි ඒ විශ්වාසය කඩවෙලා ප්‍රශ්න ඇති වෙච්ච තැන් ඕනතරම් තිබුණා. හැබැයි ඒකටත් විසඳුමක් හොයාගන්න මට පුළුවන් වුණා. දැන් ආයතනයේ හැමදෙයක්ම ආරක්ෂිත විදියට සිද්ධවෙනවා."

තාත්තාගේ ව්‍යාපාරය තිබ්බ තැනටත් වඩා ලොකු තැනට ගෙන්න ලැබුණු එක ගැන දියණියක් විදියට ඇය නිහතමානීව ආඩම්බර වෙන බව ඇගේ කතාවෙන් අපිට තේරුණා.

"සමහර තාත්තලා මහන්සි වෙලා දරුවන්ට ව්‍යාපාර හදලා දෙනවා. හැබැයි ඒ ව්‍යාපාර දියුණුවට ගෙනියනවා වෙනුවට ඒවා නැති නාස්ති කරන දරුවොත් ඉන්නවා. සමහරවිට ඒ තාත්තලා ඒ වෙනුවෙන් කරපු කැපකිරීම් ඒ දරුවන්ට දැනෙන්න ඇරලා නැතුව ඇති. හැබැයි අපේ තාත්තා එහෙම නැහැ. එයා මහන්සි වෙන හැටි එයා අපිට පෙන්නුවා.

තාත්තට හොඳට සල්ලි තියෙනවා කියලා පුංචි කාලෙදි අපි දැනන් හිටියේ නැහැ. එයා ඒක පෙන්නුවෙත් නෑ. තාත්තා පොළොවේ පය ගහලා ජීවත්වෙන ගමන් අපිටත් පොළොවේ පය ගහලා මිනිස්සු වගේ ජීවත්වෙන්න ඉගැන්නුවා. එයා අපිට දේවල් දුන්නෙ ඒ වටිනාකම් එක්ක. ඒ විශ්වාසය රකින එක අපේ වගකීමක් හැටියටයි මම නම් හිතන්නේ."

'මම නම් ශත පනහක් වැටුණත් බිමට නැව්ලා ගන්නවා' කියලා ලංකාවේ ලොකුම සල්ලිකාරයෙක් වෙන ධම්මික පෙරේරා මහත්තයා එකපාරක් කියලා තිබ්බා. ඒ වගේ මිනිස්සු සල්ලිවලට ලොකු වටිනාකමක් දුන්නට අද සමාජයේ ඉන්න ගොඩක්දෙනා සල්ලිවලට වටිනාකමක් දෙන්නේ නැහැ. තේරුමක් නැතිව අනවශ්‍ය දේට සල්ලි වියදම් කරලා පස්සේ පසුතැවෙනවා. ඒ ගැන ගයංසා කිව්වේ මෙහෙම කතාවක්.

"පුංචි කාලේ ඉඳලා අපේ ගෙදර ආර්ථික අඩුපාඩු තිබුණේ නැහැ. හැබැයි එහෙමයි කියලා තාත්තා මහන්සියෙන් හම්බකරපු සල්ලි අම්මා නිස්කාරණේ නාස්ති කළෙත් නැහැ. කවදවත් අපේ ගෙදර විසි කරන්න බත් උයලා නැහැ. ඒ තරම් අම්මා අරපිරිමැස්මෙයි. අම්මගේ ඒ පුරුද්ද අපේ පවුලේ හැමෝටම තියෙනවා.

අපි ඉගෙනගන්න ඕන හම්බකරන්න නෙමෙයි, වියදම් කරන්න. හිතන්නකෝ මාස ගාණක් මහන්සි වෙලා හම්බකරන සල්ලි එක දවසින් වියදම් කරලා දන්න පුළුවන්නේ. ඉතින් කොච්චර හම්බකළත් වියදම් කරන්න දන්නේ නැත්තම් වැඩක් නැහැ. මම නම් බිස්නස් එකට වුණත් රුපියලක් අයින් කරන්නේ ඒකෙන් රුපියල් පහක් බලාපොරොත්තුවෙන්."

අරපිරිමැස්මෙන් වැඩ කළාම ඒ අයට ලෝබ, කුම්මැහි වගේ නම් පටබැඳෙනවා නේද කියලා ඔය කතාව අතරේ මම ගයංසාගෙන් ඇහුවා.

"ලෝබකමයි අරපිරිමැස්මයි කියන්නේ දෙකක්. හරි තැන හරි දේට වියදම් කරන්න ඕනේ. ඒකත් හරියට අර හරි වෙලාවෙදි හරි තීරණ ගන්නවා වගේම තමයි. අතේ සල්ලි තියාගෙනත් අත්‍යවශ්‍යම දේකට වියදම් කරන්නේ නැත්තම් අන්න ඒකට තමයි ලෝබකම කියන්නේ. දැන් අපි ඉන්නේ ලොකු ආර්ථික ප්‍රශ්නෙකනේ. ඉතින් මම අනිත් අයට කියන්නේ පුළුවන් තරම් අරපිරිමැස්මෙන් වැඩ කරන්න."

ගයංසා කියන්නේ ගොඩක් කාර්යබහුල ව්‍යාපාරිකාවක්. ඉතින් ඇගේ වෘත්තීය ජීවිතයයි පෞද්ගලික ජීවිතයයි සමබර කරගන්නේ කොහොමද කියන එක ගැනයි ඊළඟට අපි කතා කළේ.

"මම වැඩ කරන්නේ සැලසුමක් ඇතිවයි. සතියේ දවස් පහ වෙන් කරලා තියෙන්නේ බිස්නස් වැඩවලට. සෙනසුරාද ඉරිද මම වෙනුවෙන් වෙන්කළා. වෘත්තීය ජීවිතේ ගැන හිතන ගමන් පෞද්ගලික සතුට ගැනත් හිතන්න ඕනේ. නැත්තම් ඒ දෙක සමබර කරගන්න අමාරු වෙනවා. ඒ නිසා මොන දේ කළත් තමන් වෙනුවෙන් කාලය වෙන් කරන්න කියලා මගේ ලිපිය කියවන අයටත් කියන්න කැමතියි.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි
ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්



# මල් විකුණන ළමිස්සියකට පෙම් බැඳි අලි ඉලන්දාරියා

## සාලිය



තොරතුරු
මහාචාර්ය අශෝක දංගොල්ල
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)



රේස් එකක් ගියොත් අනිවාර්යයෙන්ම සාලිය පළවැනියා වෙලා තමයි නවතින්නෙ. මම ගොඩක් වෙලාවට එයාගෙ පිටේ යන්නෙම නැතිතරම්. මම බිමින් දුවනවා. මං දුවනවනං එයා දුවනවාම තමයි.

සාලිය පින්නවල සිට කතරගම කිරිවෙහෙර රජමහා විහාරයට එද්දී වයස අවුරුදු පහකි. එද සිටම සාලියව බලාගත්තේ වැලිගමගේ ආනන්ද ජයකොඩි හෙවත් 'බණ්ඩා' ය. ආරම්භයේදී සාලිය බලාගැනීම බණ්ඩාට අභියෝගයක් විය. ඒ සාලිය, බණ්ඩා ගණනකට නොගෙන කෙල්ලක පසුපස යාමට වූ බැවිනි.

කිරිවෙහෙර භූමියේ මල් කඩයක් පවත්වාගෙන යන දුෂානි සාලියගේ සිත් ගත්තාය. අලි බලන්නකු ලෙස බණ්ඩාට එය ලැජ්ජාසහගත සිදුවීමක් වුවද කිරීමට කිසිවක්ද නැත. සාලිය හැමදම මල් කඩයට ගොස් දුෂානි සමඟ උකුළුමුකුළුය. දුෂානිද සාලියට කෑමට මොනවා හෝ සූදනම් කර තබන්නීය. කලාතුරකින් දිනයක කෑමට කිසිවක් නොවුවහොත් මල් කඩයේ වතුර බඳුනෙන් උගුරක් දෙකක් බීම පවා සාලියට සෑහේ. ඔහුට අවැසි දුෂානි බැලීම පමණි.

අවසානයේ මේ අලි මිනිස් ප්‍රේමය නිසා දුෂානිට අශෝකමාලා ලෙසින් නම් පටබැඳිනි. සාලිය - අශෝකමාලා පළහිලව්ව කෙතරම් දුරදිග ගියේද යත් කිරිවෙහෙර ආසන්නයේ ඇති දුෂානිගේ නිවසට පවා සාලිය රැගෙන යාමට බණ්ඩාට සිදුවිය. මේ අලි කොල්ලාගෙයි මල් කෙල්ලගෙයි ප්‍රේමයට බාධා කිරීමට බණ්ඩාට ඉඩ ලැබුණේ නැත. දුෂානිද අලි ඇතුන්ට දැඩි සේ ආදරය කළාය. එනිසා බණ්ඩා කළේ දුෂානිට නොකීවාට ඇගේ උපකාරයෙන් සාලිය බලාගැනීමයි. වෙනත් කිසිඳු මල් කඩයක් සාලිය ගණනකට නොගනී.

සාලිය කුඩා කල බණ්ඩාට තවත් නොසිතූ ඇබැද්දිවලට මුහුණදීමට සිදුවිය. අලියා පිට නැගී යාම සඳහා අලියාට කර හුරු කිරීමට කටයුතු කරන සමයේ බණ්ඩා මාරාන්තික අත්දැකීමක් ලැබීය. බණ්ඩා සාලියගේ කර මත නැගී එද්දී පන්සල් ඉඩමෙන් පිටත වැව අසල පාර අයිනේ තවත් අමුත්තෙක් සිටියේය. ඒ, **'ෂර්ලි'** නමැති පෝනියායි. තමා සමඟ සිටි සගයකු වූ ප්‍රියන්ත අමතා **"ආන්න ෂර්ලිත් ඉන්නවා"** යැයි පවසා, **"ආ ෂර්ලි"** යනුවෙන් බණ්ඩා පෝනියා ඇමතීය.

**"මං එහෙම කිව්වා විතරයි සාලිය හැරිලා දුවන්න ගත්තා. එයා එවෙලෙ ෂර්ලිට බයවුණා. ඒ දිවිල්ල නතර වුණේ සෙල්ල කතරගමටම දුවලා. මම බහින්නද? පනින්නද? හෙණ්ඩුවත් වීසි කරලා දැම්මා. අනික අලියා දුවද්දී උඩ බලාගෙන දුවන්නෙ. මං එතකොට මෙයාගෙ කන් දෙක අල්ලන් පිටේ දිගා වෙලාම හිටියා. එයා කිලෝමීටර දෙකහමාරක් විතර දුවද්දී මම එහෙම්ම හිටියා. ඊටපස්සෙ ආපහු මුකුත් නොවුණ ගාණට පන්සලට ආවා."**

පොඩි කාලේ එලෙස දිවිල්ල පටන්ගත් සාලිය අවසානයේ ධාවන ශූරයෙක් වූයේය. ඇතැම්විට ඊට අත්පොත් තැබූ ගුරුවරයා ෂර්ලි යැයි සිතීමටද ඉඩ තිබේ. එද ඇරඹූ දිවිල්ල බොහෝවිට අවසන් වූයේ ජයග්‍රහණයකිනි.

**"රේස් එකක් ගියොත් අනිවාර්යයෙන්ම සාලිය පළවැනියා වෙලා තමයි නවතින්නෙ. මම ගොඩක් වෙලාවට එයාගෙ පිටේ යන්නෙම නැතිතරම්. මම බිමින් දුවනවා. මං දුවනවනං එයා දුවනවාම තමයි. මං ඉතින් අනිත් අලින්ගෙන් පරිස්සම් වෙන්න ඕනෙ. මොකද යට කරන් දුවන්න පුළුවන් හින්ද. කොහොම හරි මෙයා පළවැනියා වෙනවා කියන එක මට විශ්වාසයි."**

අද වනවිට සාලිය වයස අවුරුදු 26ක තරුණ, සවිමත් අලි කොල්ලෙකි. පැරණි පෙම් කතාවලටද තිත තබා ඇත. අශෝකමාලාගේ ප්‍රේමයට තිත තැබූවද සාලිය බණ්ඩා සමඟ ඉතාම හොඳින් සබඳතාව පවත්වාගෙන යයි. ඉඳහිට චණ්ඩිකම්ද පෙන්නයි. වෙනත් අලි බලන්නන් කෙරෙහි වැඩි මනාපයක් නැති සාලිය බණ්ඩාට හැරුණුවිට අවනත තවත් කීපදෙනෙකුට පමණි.

විශේෂ ස්තුතිය - කිරිවෙහෙර රජමහා විහාරාධිපති රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති පණ්ඩිත කොබවක ධම්මින්ද නායක ස්වාමීන් වහන්සේට


F.A.Ads

ඔබට මුදල් හදිස්සියක්ද? නැත්නම් ඔබේ වටිනා රන් භාණ්ඩ සින්න වෙන්න යනවාද?

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා
පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර
1% ක අඩුම පොලියට ලබා ගන්න
ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න
විශේෂ සහන රැසක් සමගින්
නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාළයි

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| කොටහේන | 0702 539 382 | ගම්පහ | 0779 230 549 |
| වැල්ලවත්ත | 0710 870 686 | කළුතර | 0776 167 149 |
| ගුෑන්ඩ්පාස් | 0742 379 739 | හලාවත | 0779 256 191 |
| මොරටුව | 0766 227 059 | මාතර | 0705 979 237 |
| පානදුර | 0767 952 286 | ගම්පොල | 0710 870 735 |
| වෙන්නප්පුව | 0710 869 378 | නාවලපිටිය | 0710 870 706 |
| ගාල්ල | 0705 979 274 | හැටන් | 0778 790 372 |
| කුරුණෑගල | 0766 227 061 | කෑගල්ල | 0703 583 363 |
| දිගන | 0778 156 738 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බේරුවල | 0740 920 356 | පුත්තලම | 0771 201 861 |
| මතුගම | 0771 201 860 | මහියංගනය | 0771 201 862 |
| මොණරාගල | 0771 201 852 | වත්තේගම | 0742 551 103 |
| බදුල්ල | 0771 201 863 | හපුතලේ | 0760 677 018 |
| කල්පිටිය | 0761 605 803 | මාතලේ | 0702 539 389 |
| කටුගස්තොට | 0779 476 206 | තලවකැලේ | 0710 871 009 |
| නාඋල | 0763 226 230 | රාගල | 0710 870 703 |
| කන්තලේ | 0742 572 585 | පුඩළුඔය | 0740 929 541 |
| පොතුවිල් | 0771 201 855 | මස්කෙලිය | 0760 909 822 |
| වැලිමඩ | 0778 764 751 | පුස්සැල්ලාව | 0742 531 360 |
| බගවන්තලාව | 0742 588 267 | අච්චුවේලි | 0743 865 368 |
| ආගරපතන | 0765 930 715 | | |

# මේ ලස්සන එකී මට දීපන් කිය කියා බාබලා තරඟෙට ලංසු තිබ්බා

## ඕමාන් වල අතරමං වී සිටින කාන්තාවක්



නිලූකා ප්‍රියදර්ශනී

විදෙස් රැකියා නියෝජිත ආයතන කිහිපයක් කාන්තාවන් රවටා සංචාරක වීසා ක්‍රමයට මැදපෙරදිගට විකුණන මිනිස් ජාවාරමක් ගැන 'ධරණී' හෙළිදරව් කළේ පසුගිය වසරේ නොවැම්බර් මාසයේදීය. මෙම ජාවාරමේ ගොදුරු බවට පත්වී මැදපෙරදිග අසරණ වූ කාන්තාවන් බොහොමයක් සිටින බවද ඒ වනවිටත් දැනගන්නට ලැබී තිබිණි. පසුව අප වහාම ඒ ගැන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ව දැනුවත් කළද ඔවුන්ගේ ප්‍රතිචාරය වූයේ එවැන්නක් සිදුවිය නොහැකි බවයි. නමුත් නැවතත් මේ මාතෘකාව ගැන රටේම අවධානය යොමු වී ඇති නිසා මෙම ජාවාරමට හසුවී මැදපෙරදිග අසරණව සිටින තවත් කාන්තාවන් කිහිපදෙනෙකු සම්බන්ධ කරගැනීමට අප කටයුතු කළෙමු.

"මම ඩුබායි ගියේ මරදානේ ABC කියන විදේශ රැකියා ආයතනයෙන්. මේ අය කාන්තාවන්ව පිටරට යවන්නේ ඩුබායි රටේ කම්පැණිවල හොඳ පඩියකට රස්සාවල් අරන් දෙනවා කියලා කටවචනෙට පොරොන්දු වෙලා. මගෙත් එක්ක තවත් අටදෙනෙක් ගියා. ඒ අය ගියෙත් කම්පැණි රස්සාවල් ලැබෙයි කියන බලාපොරොත්තුව ඇතුව. හැබැයි අපි ඩුබායිවලින් බැස්සට පස්සේ ඒ කියපු කතා සේරම වෙනස් වුණා."

එසේ කියන්නී දැනට ඕමානයේ සිටින 39 හැවිරිදි නිලූකා ප්‍රියදර්ශනී ය. හම්බන්තොට පදිංචි නිලූකා 2021 වසරේ දෙසැම්බර් මාසයේදී ඩුබායි රාජ්‍යය බලා ගියේ එරට ආයතනයක සේවිකා අබෑර්තුවක් සඳහාය. එහෙත් එහි ගිය පසු ඇයට සිදුවී ඇත්තේ දින ගණනක් කාමරයක සිරගතව සිට බාබලා සහ නානලා තබන ලන්සු වලට ඇඟ විකුණන්නටය.

"අපිව රට යවන්නෙ විසිට් වීසාවලින් කියලා මම දැනගත්තෙ රට යන දවසෙ එයාර්පෝට් එක ඇතුළෙදි. ඒ වෙලාවෙ මම අපිත් එක්ක නිතරම සම්බන්ධවෙලා කතා කරපු නයනා අක්කා කියන කාන්තාවගෙන් ඒ ගැන ඇහුවා. එතකොට එයා මට කිව්වෙ ඩුබායි යන එක ඔයාලා හිතන තරම් ලේසි පහසු දෙයක් නෙවෙයි නිලූකා කියලා, ඒකට ගොඩක් සල්ලි ඕන කරනවා කියලා. අපිට ඒ තරම් සල්ලියක් වියදම් කරන්න නැති නිසා විසිට් වීසාවලින් යවන්නෙ කියලා කිව්වා. සැකයක් තියෙනවා නම් අනිත් අයගෙනුත් අහලා බලන්න කිව්වා. ඊටපස්සෙ මං ඒ අයගෙනුත් අහලා බැලුවම කියපු කතාව ඇත්ත නිසා හිතේ තිබුණ බය නැතිවුණා."

නිලූකා කියන ආකාරයට මෙම ජාවාරමට සෘජුවම සම්බන්ධ කාන්තාවක් සහ පිරිමින් තිදෙනෙකු ඇත. එක් අයෙකු අංගොඩ කොහිලවත්තේ පදිංචිකරුවෙකු වෙන සබ්රින් නමැති මුස්ලිම් පුද්ගලයෙකි. මෙම පුද්ගලයා හට සතියකට වරක් මරදාන ABC විදේශ රැකියා ආයතනය වෙත ගෙන යා යුතු කාන්තාවන් ප්‍රමාණයක් පවරා ඇත. ඒ රැගෙන ගිය මොහොතේ පටන් අදාළ කාන්තාවන්ට අවශ්‍ය සියලු ලියකියවිලි සකසා දී, ගුවන් තොටුපොළට රැගෙන යන මොහොත දක්වා සියලු කටයුතු කරන්නේ ඔහුය.

සබ්රින්ගේ කාර්යය එතැනින් අවසන්ය. එතැනින් පසු මෙම කාන්තාවන්ගේ වගකීම භාරදෙන්නේ දැනට ඩුබායි අජ්මාන් නගරයේ පදිංචිව සිටින නයනාට සහ ශාඩ්ටය. නයනා මෙරට කළුතර උතුර ප්‍රදේශයේ පදිංචිකාරියක වන අතර ශාඩ් යනු කලින් කී සබ්රින්ගේ පුතණ්ඩියාය. මොවුන් දෙදෙනාගේ රාජකාරිය වන්නේ අදාළ කාන්තාවන්ව දින පහක් පමණ ඩුබායි කාමරවල රහසිගතව රඳවාගෙන ශම්සුදීන් නමැති මහාපරිමාණ ජාවාරම්කරුවෙකුට විකිණීමය. පසුව මෙම කාන්තාවන් ඩුබායි සීමාව පසු කරමින් ඕමාන් වෙත රැගෙන යනු ලබන්නේද ශම්සුදීන් විසිනි.

> අපිත් එක්ක ගියපු සමහරක් ලස්සන ගෑනු ළමයින්ව එදා රෑම බාබලා ඇවිල්ලා වාහනවල දාගෙන ගියා. අදටත් ඒ අය ජීවත්වෙනවද මැරිලද කියලවත් ආරංචියක් නෑ

"එදා ශම්සුදීන් මාවයි තවත් ගෑනු අය දහඅටදෙනෙකුයි ඩුබායි සීමාවෙන් පන්නගෙන ඕමාන්වලට අරන් ගියා. එතකොට එතැන හිටපු සේරම ගෑනු අය මහහයියෙන් කෑගහලා අඬනකොට මම ශම්සුදීන් එක්ක එතැන රණ්ඩු වුණා. ඒත් වැඩක් වුණේ නෑ. පස්සේ අපිව ඕමාන්වල තට්ටු පහක විතර බිල්ඩින් එකක හිර කරගෙන ඉඳලා ජනවාරි පළවැනිදා පාන්දර වෙද්දි සේරමලා පෝලිම් ගැස්සුවා. ඊටපස්සේ පාන්දර 2.45ට විතර මාව අරන් යන්න පිලිපීන් ගෑනු කෙනෙක් ආවා. මාව විකුණන උන් ඒ ගෑනු කෙනාට රියාල් හයදස් ගාණක් දීලා උඹේ ඉතුරු ගාණ හෙට දෙන්නම් කිව්වා. සල්ලි අරන් ඒ ගෑනුකෙනා මාව ඇදගෙන ගිහින් ඒ බිල්ඩින් එකේම පස්වැනි තට්ටුවේ කාමරේක හිර කරලා ඒ කාමරේම හිටපු තවත් ගෑනු කෙනෙක්ට ගහලා බිම දිගේම ඇදගෙන ගියා. පස්සේ අපිව පිරිමි දෙතුන් දෙනෙක් ඉස්සරහ පෝලිමට තියලා ගණන් කතා කළා. එතකොට ඒ ආපු උන්ගෙන් එකෙක් මාව පෙන්නලා කිව්වා මේ ලස්සන එකීව මට රියාල් 1800කට දීපන් කියලා.



ගෞතමනි

ඒත් එක්කම තව මිනිහෙක් කිව්වා ඒකිව මට රියාල් 2500කට දීපන් කියලා. පස්සේ උන් එතැන හිටපු බාබාට මං වෙනුවෙන් ඇඩ්වාන්ස් එකක් දුන්නා. ඒත් එක්කම ආරංචි වුණා අපිත් එක්ක හිටපු ශ්‍රියාණි කියලා කෙනෙකුට කසෙන් ගහලා අමාරු වෙලා ඉස්පිරිතාලෙට ගිහින් දලා කියලා. පස්සෙ උන් මාවත් ඇදගෙනම ඉස්පිරිතාලෙට ගියා.

එතැනදී මං දැන් ඉන්න ගෙදර ගෑනු කෙනයි, එයාගේ මනුස්සයයි, බාබලා එක්ක රණ්ඩු කරලා මාව එයාලගෙ ගෙදර වැඩට ඉල්ල ගත්තා. ඒත් මං දන්නෙ නෑ එහෙම කළේ කොහොමද කියලවත්. ඒ වුණත් අර ඇඩ්වාන්ස් කරපු පිරිමි මාව ඇදගෙන යන්න කලින් මං මේ ගෙදරට ආවා. ඒ ආවා කියලත් වුණේ කබලෙන් ලිපට වැටුණු එක. කන්න බොන්න නොදී, අඳින්න නොදී, මගේ රත්තරන් බඩු, ෆෝන්, පාස්පෝට් සේරම අරන් තියාගෙන එදා ඉඳන් අද වෙනකල් හිරකරගෙන වැඩ ගන්නවා. මේ වෙනකොට මගේ පපුවේ ඇදුම් අඳින්නත් බැරිවෙන තරමට ලොකු ගෙඩියක් ඇවිත් තියෙනවා. ඒවට බෙහෙත් ටිකක් අරන් දෙන්න කිව්වම කුණුහරුපෙන් බැනලා ගහනවා."

පසුව නිලූකා විසින් මේ ගැන වරින් වර මරදානේ ABC විදේශ රැකියා ආයතනය වෙත දැනුම් දුන්නද පලක් වී තිබුණේ නැත. ඇය පවසන්නේ එහි නියෝජිතයින් විසින් ඇගේ දුරකතන අංකය පවා අවහිර කර දැමූ බවකි. එහෙත් පසුගිය දිනවලදී මෙරට මාධ්‍ය මගින් මෙම ජාවාරමේ සුලමුල හෙළි කරන්නට ගත් නිසා ඔවුන් විසින් නැවතත් නිලූකාව අමතා තිබුණි. එසේ අමතා කියා තිබුණේ ඔවුන් පිළිබඳ කිසිවෙකුටත් නොපවසන ලෙසයි. ඔවුන් කියන ආකාරයට කටයුතු කළහොත් නිලූකාව හැකි ඉක්මනින් නැවතත් මෙරටට ගෙන්නා ගැනීමට කටයුතු කරනා බවත් පවසා තිබුණි.

"ඒ කිව්වත් කිසිම දෙයක් කළේ නෑ. බැරිම තැන මම ආපහු එම්බසියට ගිහින් කිව්වා කොහොමහරි ලංකාවට යවන්න කියලා. එතකොට සල්ලි හොයාගෙන වරෙල්ලා කියලා බැනලා ගහලා එලවගත්තා."

කුරුවිට පදිංචි විසි දෙහැවිරිදි ගෞතමනි ද පසුගිය දෙසැම්බර් 31 වනදා ඩුබායි බලා ගොස් තිබුණේ ඔය කියන ABC විදේශ රැකියා ආයතනය හරහාය.

"මට මේ ඒජන්සි එක ගැන කිව්වෙ අල්ලපු ගෙදර කෙනා. පස්සේ මාසෙකින් විතර මගේ අතට මොනවද මන්දා කොළ වගයක් ගෙනැත් දීලා කිව්වා මේවා රට යනකොට ගොඩක් වැදගත් නිසා කාටවත්ම පෙන්නන්න එපා කියලා. ඒවගේ තිබුණ කිසිම දෙයක් කියවගන්නවත් මම දැනගෙන හිටියේ නෑ. අන්තිමට රට යන දවසේ එයාර්පෝට් එකේදි මගේ වීසා එක බලලා මොකටද යන්නෙ කියලා ඇහුවම මං ගත්කටටම කිව්වා රස්සාවකට යනවා කියලා. එතකොට එතන හිටිය නිලධාරී මහත්තුරු කිව්වා විසිට් වීසාවලින් රස්සාවල් කරන්න යන්න දෙන්න බෑ කියලා. පස්සේ මම ඒජන්සියට කතා කරලා ඒ ගැන කිව්වහම ඒජන්සි එකේ අය එයාර්පෝට් එකේ නිලධාරී මහත්තුරු කට්ටියකට කතා කළා. ඒ කතා කළාට පස්සෙ මුලින් යන්න දෙන්න බෑ කියපු අය පස්සේ කරදරයක් නැතුව ෆ්ලයිට් එකටම යන්න දුන්නා. ඩුබායිවලදි දවස් පහක් අපිව හිරකරලා තියාගෙන ගහලා බැනලා බලෙන්ම ලියුම්වලට අත්සන් අරගෙන වෑන් තුනකින් ඕමාන්වලට අරගෙන ගියා. ඒ අරන් ගියාට පස්සෙ අපිත් එක්ක ගියපු සමහරක් ලස්සන ගෑනු ළමයින්ව එදා රෑම බාබලා ඇවිල්ලා වාහනවල දාගෙන ගියා. අදටත් ඒ අය ජීවත්වෙනවද මැරිලද කියලවත් ආරංචියක් නෑ. තව සමහරුන්ව කාමරවලට අරගෙන ගිහින් ඔෆිස්වල රස්සාවල් දෙන්නම් කියලා බාබලා එක්ක එකට ඉන්න කියලා අපි ඉස්සරහම කසවලින් ගැහුවා. ඒ ගහලා බලෙන්ම ඇදගෙන හෝටල්වලට අරගෙන ගියා. ඊටපස්සෙ ඒ ගෑනු ළමයි අපිට වොයිස් මැසේජ් එවලා තිබුණා එයාලව හෝටල්වල තියාගෙන හොඳටම කරදර කරනවා කියලා.

ඇත්තටම මම ලංකාවෙන් යනකොට විසිට් වීසා කියන්නේ මොකක්ද කියලවත් විසිට් වීසාවලින් ඇවිල්ලා රස්සාවක් කරන්න බෑ කියලවත් දැනගෙන හිටියේ නෑ. අනේ ඒක නිසා අත්දෙක එකතු කරලා වැඳලා කියන්නම් අපිට අනුකම්පා කරලවත් මේ නරකාදිගෙන් බේරගන්න."

පසුව මේ සම්බන්ධව අප කළ විමසීමකදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උසස් නිලධාරියෙකු කියාසිටියේ මෙවැනි කතාවකි.



නිලූකා දැනට වෙසෙන ඕමානයේ නිවස

# විසිට් වීසාවලින් රට යන ගෑනු ඔක්කොම සීයට සීයක් මෝඩත් නෑ අහිංසකත් නෑ

## විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඉහළ නිලධාරියෙක්

"ඇත්තටම මේක ඒජන්සි කියලා කියාගත්ත හොර ජාවාරම්කරුවන් පිරිසක් විසින් කරගෙන යන මාෆියාවක්. මේ වෙනකොට අපිට ලැබිලා තියෙන තොරතුරුවලට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ ගැන වැඩිදුර පරීක්ෂණ ආරම්භ කරලා තියෙනවා.

හැබැයි මෙන්න මෙහෙම දේකුත් පැහැදිලිවම කියන්න තියෙනවා. මේ විදියට විසිට් වීසාවලින් රට යන කාන්තාවෝ හැමෝම සීයට සීයක් අහිංසක නෑ. මොකද සමහරුන්ගේ මූණවල් දැක්කම අපිට පේනවා විසිට් වීසා එකක් අරන් ඩුබායිවල ඕමාන්වල සංචාරය කරන්න තියා තමන් ඉන්න ගෙදර ඇඩ්‍රස් එකවත් හරියට ලියාගන්න දන්නේ නෑ කියලා. නමුත් කවුරුහරි පුද්ගලයෙක් අපි ළඟට ඇවිත් විසිට් වීසා එකක් පෙන්නලා කිව්වොත් මම යන්නේ මගේ සැලෝන් එකට බඩු ටිකක් ගේන්න එහෙම නැත්නම් ඩුබායිවල හරි ඕමාන්වල හරි ඉන්න සහෝදරයෙක් බලලා එන්න කියලා එහෙම අයව නවත්වන්න අපිට නීතිමය බලයක් නෑ. මොකද මූණවල් බලලා, හැසිරෙන විදිය අනුව නීතිය ක්‍රියාත්මක කරන්න හැකියාවක් නැහැනේ. ඒ නිසා කොළඹ හතේ කාන්තාවක් වුණත් මුලතිව් කාන්තාවක් වුණත් විසිට් වීසා එකක් අරගෙන ආවොත් නීතියේ හැටියට අපිට එයාගේ ගමනට බාධා කරන්න බැහැ. නමුත් සමහර අවස්ථාවලදී මේ මිනිස්සු කරන්නේ බොරු කියලා දැන දැනමත්, පස්සේ අමාරුවේ වැටෙනවා කියලා දැන දැනත් සමහරක් අවස්ථාවලදී ඒ අයට යන්න දෙන්න අපට සිද්ධ වෙනවා. මොකද ඒක ඒ පුද්ගලයාගේ මානව අයිතිවාසිකමක් නිසා. අනික අර ජාවාරම්කරුවන් විසින් මේ අයට සූක්ෂමශීලීව බොරු උගන්වනවා. උදාහරණයක් විදියට මඩකලපුව, මූතූර් වගේ ප්‍රදේශයක ඉන්න කාන්තාවක් මේ වගේ ජාවාරම්කරුවෙකුට අහුවුණොත් කොළඹට ගෙනැල්ලා විසිට් වීසා එකකින් රට යවන්න හරිම ලේසියි. මොකද ඒ වගේ කාන්තාවන්ට මේ දේවල් ගැන වැඩි දැනුම් තේරුම් නැති නිසා. ඊටපස්සේ ඒ අයට කියනවා විදෙස්ගත වෙන්න විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලක්ෂ ගණන් සල්ලි ගෙවන්න ඕන නිසා එයාර්පෝට් එකෙන් ඇහුවොත් සංචාරයකට හරි සහෝදරයෙක් බලන්න යනවා කියන්න කියලා. සමහරක් වෙලාවට විසිට් වීසා ළඟ තියාගෙන මේ වගේ බොරු කියන අයගෙන් තමන්ගේ වගකීම තමන්ම බාරගන්නවා කියලා අපි ලියුම් පවා අරගෙන තියෙනවා. එහෙමවත් මේ මාෆියාව ටිකක් හරි නවත්තගන්න පුළුවන්වෙයිද කියලා උත්සාහ කරලා බලන්නයි අපි එහෙම කරන්නේ. නමුත් ඉතින් කැරපොත්තෝ මරලා ඉවරයක් කරන්න බෑ වගේ ඔය විදියට අපිව අන්දලා ඩුබායි යන පිරිසක් කාලෙකට පස්සේ ඕමාන්වලින් මතුවෙන්න පටන්ගන්නවා. ඊටපස්සේ සංචාරක වීසාවලින් ගියා කියලා අපිටත් ඒ අයව අතඅරින්න බෑ. මොකද හරි හෝ වැරදි ශ්‍රී ලාංකික කාන්තාවකට ඒ වගේ හිරිහැර වෙනවා නම් ඒ ගැන බලාගෙන ඉන්න එක මානුෂීය නැති නිසා. ඒත් කොහෙවත් ඉන්න ජාවාරම්කරුවන්ට ලක්ෂ ගණන් සල්ලි දීලා සංචාරක වීසාවලින් රට ගිහින් දැන දැනම අමාරුවේ වැටිලා රටේ සල්ලිවලින් දඩ ගෙවලා ගෙන්නගන්න කියලා අපට චෝදනා කළාම හරිද? එහෙම යන කී දෙනෙක්ව අපි රටේ සල්ලිවලින් ගෙන්න ගන්නද? කොච්චර දඩ ගෙවලා ගෙන්න ගත්තත් අනිත් පැත්ත හැරෙනකොට ඕමාන්වල ආයෙම මේ වගේ අය පිරිලා. ඒ නිසා අපි මේ වෙනකොට මුලින්ම මේ මාෆියාව නවත්තන්න අපි අවශ්‍ය පියවර අරන් තියෙනවා. මොකද ඒ ඇරෙන්න කලින් කිව්වා වගේ ටුවරිස්ට් වීසාවලින් රට යන එක නවත්තන්න අපට නීතිමය අයිතියක් නැති නිසා. ඒ වගේම මේ වෙනකොට මේ කාන්තාවන්ගේ දඩ මුදල ඉවත් කරගන්න ඩුබායි සහ ඕමාන් රාජ්‍යයන් එක්ක අපි සාකච්ඡා කරමින් ඉන්නවා. එහෙම වුණොත් කැබිනට් පත්‍රිකාවක් දාලා මේ අයව අපේ රටට ගෙන්න ගන්න කටයුතු කරනවා. නමුත් විදෙස්ගත වෙන කාන්තාවන්ට මම බොහොම කාරුණිකව මේ දේ කියන්න ඕන. විසිට් වීසාවලින් කාන්තාවන්ව විදෙස්ගත කරවන මේ මාෆියාව මේ වෙනකොට රට පුරාම ජාලයක් විදියට පැතිරිලා තියෙනවා. ඒ නිසා විසිට් වීසාවලින් රට ගිහින් කවදාවත් රස්සාවක් කරන්න බෑ කියලා තේරුම්ගන්න. ඔබේ ආරක්ෂාව ඔබ සැලකිලිමත් වෙන්න. රැකියාවකට විදෙස්ගත වෙනකොට අන්තිම මොහොතේ හරි ඔබ යන්නේ විසිට් වීසා එකකින් කියලා දැනගන්න ලැබුණොත් කවුරු කොහොම මොනවා කිව්වත් ඒ ගමන යන්න එපා."

■ ලිහිණි මධුෂිකා

2 වන සංවත්සර කලාපය



# ගන්න පඩිය හැරෙන්නත් මදිනම් මේ ටික කරලා බලන්න

ක්‍රි.පූ. 103-89 වළගම්බා පාලන සමයේදී 'බැමිණිතියා සාය' කියලා මහා දරුණු සාගතයක් ඇතිවුණා. අපේ රටට ඒ තරම් දරුණු දුර්භික්ෂයක් ඇතිවුණු පළවැනි වතාව ඒක කියලයි රසවාහිනිය, සද්ධර්මාලංකාරය, අටුවා වගේ වංශකතාවල කියැවෙන්නේ.

දිගින් දිගටම ආපු ආක්‍රමණ නිසා වළගම්බා රජ්ජුරුවන්ට කාලයක් සැඟවිලා ඉන්න සිද්ධවුණා. එහෙමයි කියලා රට ආක්‍රමණය කරපු පිටදේසක්කාරයන්ට කෘෂිකර්මය සහ වාරි කර්මාන්තය නඩත්තු කරන්න උවමනාවක් තියෙන එකක්යැ! ඒ නිසා තමයි ඔය කියන සාගතය ඇතිවුණේ. අවුරුදු 12ක් පුරාවට සාගතේ තිබුණා. කන්න බොන්න නැතිව මිනිස්සුන්ගේ මස් දියවෙලා ඇටකටු පේන්න ගත්තා. දනේ සපයගන්න බැරිව මහරහතන් වහන්සේලා දොළොස්දහක් පිරිනිවන් පෑවා. දුර්භික්ෂයේ උච්ඡතම අවස්ථාවෙදි මිනිස්සු මිනිස්සුන්ව මරාගෙන කාලා තමයි ජීවත්වෙලා තියෙන්නේ. අතේ සහල් මිටක් තියෙන කෙනෙක් එහෙම දැක්කොත් ඔහුව මරා දලා ඒ සහල් මිට උදුරාගත්තාලු.

කොටසක් එහෙම මැරෙද්දි මොළේ පාවිච්චි කරපු මිනිස්සු කැලේ ඇතුළට රිංගලා කැලෑ අල, කොළ කාලා ජීවත්වෙලා තියෙනවා. පස්සේ අවුරුදු ගාණකින් ආයේ රට ස්වයංපෝෂිත වෙද්දී අර කැලෑ වැදිච්ච මිනිස්සු ටික එළියට ආවලු.

මේ කතාවෙන් ලිපිය පටන්ගත්තේ කාගෙවත් හිත් තිගස්සන්න හිතාගෙන එහෙම නෙමෙයි. බැමිණිතියා සායෙදි වෙච්ච බරපතළ ප්‍රශ්න නොවුණත් අපි දැනටමත් ඉන්නේ ලොකු ආර්ථික අර්බුදේක.

"මේ අහේනිය අපිට ඉබේ කඩාපාත් වුණේ නෑනේ" කියලා දැන් කෙනෙක්ට හිතෙන්න පුළුවන්. ඇත්ත. මේ ප්‍රශ්න ඇතිවෙන්න හේතුව අවුරුදු ගාණක් තිස්සේ අපිම පත්කරගත්තු මිනිස්සු. ඒ අය පත්කරගත්තෙත් අපිම නිසා අපිටත් මේ වගකීමෙක් කොටසක් දරන්න වෙනවා.

රටේ සාධනීය තත්ත්වයක් වෙනුවෙන් අරගල කරන්න, කතා කරන්න. හැබැයි පෞද්ගලිකව තනි තනි මිනිස්සු හැටියටත් අපිට මේ ප්‍රශ්නෙට මුහුණදෙන්න වෙනවා. ඒ වෙනුවෙන් මේ වෙලාවේ අපිට කැපකිරීම් කරන්නත් වෙනවා. කාලෙන් කාලෙට ලෝකෙට එක එක ප්‍රශ්න ඇතිවුණා. ලෝක යුද්ධ, ස්වභාවික විපත්, වසංගත ඒ ප්‍රශ්න ඉස්සරහා ලෝකේ ඉස්සරහට ගියා. හැමදේම අනිත්‍යයි කියනවා වගේ මේ ප්‍රශ්නත් තාවකාලිකයි. ඉතින් එතකල් අපිට අල්ලගෙන ඉන්න වෙනවා. මනසින් නොවැටී තියෙන දේවල් කළමනාකරණය කරගෙන අල්ලගෙන හිටියොත් අර බැමිණිතියා සායෙදි නොවැටී හිටපු අය වගේ අපිටත් දවසක ඉර පායයි. ආර්ථිකේ ශක්තිමත් කරගෙන, තියෙන දේවල් කළමනාකරණය කරගෙන නොවැටී ඉන්නේ කොහොමද කියලා ප්‍රවීණයන් කිහිපදෙනෙක් එක්ක කතා කරන්න හිතුවේ ඒකයි. මේ එහි පළමු ලිපිය.



ජ්‍යේෂ්ඨ මනෝඋපදේශිකා
**එෂාමා කාරියකරවන**

තව සති දෙක තුනකින් අලුත් අවුරුද්දක් ලබනවා. ජ්‍යේෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා එෂාමා කාරිකරවන මහත්මිය මේ කියන්නේ අලුත් අවුරුද්දේ වියදම් කළමනාකරණය කරන්නේ කොහොමද කියලයි.

"ජනවාරි පළමුවැනිදා කියන්නේ අලුත් අවුරුද්දක ආරම්භක දවස. ඒ අලුත්බව අලුත් අවුරුද්දෙ අපිට අලුත් හැඟීමක් ගේනවා. ඒ නිසා ගොඩක් අය ගෙවල්වල අලුතින් තීන්ත ගානවා, අලුත් බඩු ගන්නවා, අලුත් ඇඳුම් ගන්නවා. හැබැයි මේ තියෙන ආර්ථික අර්බුදය එක්ක අපි තව ණයවෙලා හෝ තියෙන මුදල් ටික වියදම් කරගෙන කලින් අවුරුදුවල කළා වගේම ජනවාරිය පටන්ගන්න ඕනද? එහෙම නැතුව අලුත් වෙන්න විදියක් අපිට නැද්ද?

ගොඩක් අය ජනවාරියේදි ගෙදර තියෙන පරණ බඩු විසි කරලා දනවා. ඒ කරලා අලුතෙන් බඩු ගන්නවා. හැබැයි මේ වෙලාවෙදි අතේ මිටේ කීයක්හරි වැඩිපුර තියෙනවා නම් කරන්න ඕන තමන්ට අත්‍යවශ්‍යම නොවෙන දේවල් මිලට ගන්න ඒ සල්ලි වියදම් කරන එකනම් නෙවෙයි. ඒ නිසා මධ්‍යම පංතිය සහ ඉන් පහළ ඉන්න පිරිසට මේ කියන ටික බොහොම වැදගත් වෙයි කියලා අපි හිතනවා.

මධ්‍යම පංතියේ බොහෝදෙනා භාණ්ඩ මිලදීගන්න පුරුදුවෙලා ඉන්නේ ක්‍රෙඩිට් කාර්ඩ්වලින්. දැන් උත්සව කාලෙත් නිසා එක එක ආයතන වට්ටම් දෙන්න පටන්ගන්නවා. ඉතින් වට්ටම 50% 30% කියලා දැක්කම සමහරුන්ට ගෙදරට ඕන නැති දේවල් පවා අරගන්න හිතෙනවා. හැබැයි මේ අවුරුද්දේ එහෙම කරන්න යන්න එපා. ගෙදරට තීන්ත ගාන වැඩ, අලුතින් බඩු ගන්න වැඩ තියෙනවා නම් ඒක අවුරුද්දක් පස්සට දාන්න. ඒ වෙනුවට ගේ දොර ලස්සනට පිළිවෙලට අස්පස් කරන්න. බඩුමුට්ටු එහෙම තියන පිළිවෙල ටිකක් වෙනස් කරලා බලන්න. එතකොටත් අර නැවුම් ගතිය ගන්න පුළුවන්.

ඇත්තටම ටිකක් කල්පනා කරලා බැලුවොත් අපි ජීවිතේ අවශ්‍යතා කියලා හදාගෙන තියෙන ගොඩක් දේවල් අනවශ්‍ය දේවල්. එක්කෝ යාළුවා සුම්බා ක්ලාස් යන නිසා මමත් යන්න ඕන කියල හිතනවා. ඔෆිස් එකේ කෙනෙක් බ්‍රෑන්ඩඩ් ඇඳුම් අඳින නිසා මමත් ණයවෙලා හරි බ්‍රෑන්ඩඩ් අඳින්න ඕන කියලා හිතනවා. යස අගේට බස් එකේ, කෝච්චියේ එන්න යන්න පුළුවන්කම තියෙද්දී අල්ලපු ගෙදර කෙනා ස්ටාෆ් බස් එකක යන නිසා වැඩි ගාණක් ගෙවලා එහෙම එකක යන්න හිතෙනවා.

ඒ විදියට තමන්ගේ අවශ්‍යතා හරියට හඳුනාගත්තේ නැති කොච්චර මුදල් ලැබුණත් වියදම් කරන්න ඕනෑතරම් දේවල් තියෙනවා. හැබැයි මේ වෙලාවේ ඒ විදියට හිතෙන හිතෙන දේවල් කරන්නේ නැතුව ටිකක් මොළේ කල්පනා කරලා වැඩ කළොත් පුද්ගලිකව තමන් වැටිලා ඉන්න ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න පුළුවන්.

මුල්ම දේ තමන්ට දැන් තියෙන රැකියාව රැකගන්න. මේ දවස්වල ගොඩක් අයට රැකියා අහිමිවෙලා. රැකියා අහිමිවෙච්ච අය කිහිපයක්ම ඔවුන්ගේ පීඩනය නැති කරගන්න මාව මුණගැහෙන්න ආවා. ගොඩක් ආයතනවලට තමන්ගේ සේවකයන්ට පඩිනඩි ගෙවාගන්න බැරි තත්ත්වයක් තියෙනවා. එතැනදි ආයතනයේ සේවක කප්පාදුවක් කරන්න ඔවුන්ට සිද්ධ වෙන්න පුළුවන්. ඉතින් තමන්ගේ ආයතනයට නැතිව බැරි කෙනෙක් වෙන්න. ගන්න පඩියට වැඩ කරනවා වැඩි කියලා සෘණාත්මක දේ හිත හිතා ඉන්නේ නැතිව මහන්සි වෙලා වැඩ කරන්න. එතකොට ඔබ ඒ ආයතනයට අත්‍යවශ්‍ය මනුස්සයෙක් වෙනවා.

ඊළඟ කාරණාව ආහාර. ගෙදර ඉන්න අයගේ ගාණට අවශ්‍ය ප්‍රමාණයට කෑම උයන්න. කුස්සියේ දේ අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න. කන්න නැතිව දස් ගාණක් මිනිස්සු දුක් විඳින රටක බත්ඇටයක්වත් විසි කරන්න එපා.

ගොඩක් අය කරන්නේ සල්ලි දීලා ගෙදර ළමයින්ට වස දෙන එකනේ. සකස් කරපු මස්, ටින් කෑම වගේ දේ ගෙදරට ගේන එක අවම කරන්න. ඒ වෙනුවට දරුවන්ට කටට රහට පෝෂණීය ආහාර ගෙදරම හදලා දෙන්න. ඒකට විවිධ උපක්‍රම භාවිතා කරන්න අම්මලාට පුළුවන්. ඉඩ තියෙන හැටියට ගෙදරට අවශ්‍ය දේවල් වවන්න පටන්ගන්න. ගෙවතු වගා කරද්දි ගොඩදෙනා අවධානය යොමු කරන්නේ එදිනෙදා භාවිත කරන එළවලු ගැන. හැබැයි මුංඇට, කව්පි, අල, බතල වගේ බත් වෙනුවට පිරිමහගන්න පුළුවන් දේ ගැනත් වැඩි අවධානයක් දක්වන්න.

අනික ලේසියට පහසුවට, උජාරුවට සුපර් මාකට්වලින්ම බඩු ගන්න පුරුදුවෙච්ච කෙනෙක්නම් එක සතියක් සිල්ලර කඩෙන්, පොළෙන් බඩු ටිකක් අරගෙන බලන්න. හිතුවට වඩා මුදලක් ඔබේ අතේ ඉතිරි වේවි. ඒකට එක හේතුවක් තමයි සුපර් මාකට්වලට වඩා කඩේ, පොළේ බඩුවල ගණන් අඩුවීම. අනිත් කාරණාව තමයි සුපර් මාකට් එකකට ගියාම අපිට පාට පාටින් තියෙන ලස්සන ලස්සන කෑම බීම දැක්කම ගන්න හිතාගෙන නොගියත් ඒවා මිලදී ගන්න පෙළඹවීමක් ඇති කරනවා. හැබැයි අවශ්‍යම බඩුවල ලැයිස්තුවක් හදාගෙන පොළට ගියාම එහෙම ප්‍රශ්නයක් වෙන්නේ නෑ. ඒ නිසා හැම විකල්පයක්ම උත්සාහ කරලා බලන්න.

ඊළඟට අපි වැඩියෙන්ම සල්ලි වියදම් කරන්නේ ඇඳුම්වලට. මොකද ගොඩක් අයට හැම මාසෙම ඇඳුම් ගන්නේ නැතිව බැහැ. පුළුවන් තාක්කල් භාවිතා කළාට පස්සෙත් සිවුරක්වත් අපතේ දාන්න එපා

# මනෝ ලෝකවල හදාගත්තු අවශ්‍යතාවලට ඇත්ත ජීවිතේදී සල්ලි වියදම් කරන්න ගියාම බංකොලොත් වෙනවා තමයි

කියන එකයි බුද්ධ වචනය. ඒ සිවුර මුලින්ම ඇතිරිල්ලක් විදියටත් පස්සේ බුමුතුරුණු විදියටත්, ඊටත් පස්සේ පාපිස්නාවටත් පාවිච්චි කරලා ඒක පොළෝපිස්නාවක් විදියටත් භාවිතා කරලා බිත්තියේ මැටියට එකතු කරන්න කියලයි බුදුන් දේශනා කරලා තියෙන්නේ. හැබැයි දැන් ගොඩක් අය එක ඇඳුමක් අඳින්නේ එක දවසයි. ආයේ ඒ ඇඳුම වෙන කෙනෙක් දකිනවට ලැජ්ජලු. හැබැයි ඒක අපි ඔලුවෙන් හදාගත්තු ප්‍රශ්නයක්.

ලෝකේ බලශක්තිය වැඩියෙන්ම වැයවෙන්නේ ඇඳුම් හදන්න කියලා මට දැනගන්න ලැබුණා. ඉතින් ඇඳුම් නිෂ්පාදනයෙදි පරිසරයට ලොකු හානියක් වෙනවා කියලා දැනගත්තු දා ඉඳලා මම වෘත්තීය වැඩවලට භාවිතා කරන්නේ අඳුම් හයයි. ගෙදර භාවිතයට තියෙන්නෙත් ඇඳුම් සුළු ප්‍රමාණයක්. ඉතින් එකම සාරිය ඇඳන් රූපවාහිනී වැඩසටහන්වලට ගියාම එකම ඇඳුම ඇඳන් එන්නේ ඇයි කියලා සමහරු අහනවා. එකම ඇඳුමෙන් මාව දකින ඇතැම් අයට ලොකු ප්‍රශ්නයක්.

අනිත් අය අපේ ඇඳුම් ගැන මොනවා හිතනවාද කියලා වද වෙන්න අවශ්‍ය නැහැ. මෙයා හැමදම එකම ඇඳුම අඳින්නෙ ඇයි කියලා කෙනෙක් හිත හිතා ඉන්නවා නම් ඒක එයාගේ ප්‍රශ්නයක් මිසක අපේ ප්‍රශ්නයක් නෙමෙයි.

අනික අපි ඇඳුමක් ගත්තහම ඒ සතුට තියෙන්නේ ඒක අඳින පළවැනි දවසේ විතරයි. හැබැයි දැන් අපි ඉන්නේ ඊට වඩා සංකීර්ණ තත්ත්වයක. අනිත් අයටත් ඇඳුම් හයක් තියාගෙන අඳින්න කියලා නෙමේ මම කියන්නේ. මේ වෙලාවේ ඇඳුම්වලට ලොකු වියදමක් කරන්නේ නැත්තම් අපිට ලොකු ඉතිරියක් කරගන්න පුළුවන් කියන එකයි. ඉතින් දරුවන්ටත් ඇතිතරම් ඇඳුම් තියෙනවා නම් ඔවුන්ටත් කාරණා පැහැදිලි කරන්න.

ඊටපස්සේ ගෙදරට ගන්න අනවශ්‍ය දේවල් අඩු කරන්න. කඩේට ගියාම ඕන එකයි එපා එකයි හැම එකම ගන්න යන්න එපා. ඒ වගේම ගන්න දේවල් අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න. උදාහරණයක් විදියට ෂැම්පු බෝතලයක් ගන්න. වෙනදා දවස් පහක් ෂැම්පු ගාලා නෑවා නම් දැන් දවස් දෙකක් ෂැම්පු ගාන්න. ඉතිරි දවස් ටික වෙරළු කොළ ටිකක්, ගොඩපර ගෙඩියක් තලලා ගාලා බලන්න. ෂැම්පු ගාද්දි නැති නිරෝගීකමක් ඔලුවට දැනෙයි.

ඊළඟට ප්‍රවාහනය. මම දන්න කාන්තාවෝ තුන්දෙනෙක් එකතුවෙලා ත්‍රීවීලර් එකක් කතාකරගෙන ගෙදරට අවශ්‍ය කළමනා ගන්න යනවා. ත්‍රිවීලර් එකේ ගාස්තුව තුන්දෙනාම බෙදාගන්නවා. ඒක ඔයාලටත් හොඳ යෝජනාවක්.

ඒ වගේමයි ජලය සහ විදුලිය. වතුර ටිකක් බොන්න ඕන වුණාම සමහරු වතුර වීදුරුවක්ම පුරෝගන්නවා. දත් මදිනකල්, සබන් ගානකල් ටැප් ඇරගෙන ඉන්නවා. ඒ වගේ බොරු නාස්ති අවම කළොත් ජල බිල් අඩු කරගන්න පුළුවන්. කරන්ට් එකත් එහෙමයි. එකපාර සතියෙම ඇඳුම් මැදගන්න. වොට් ගාණ අඩු විදුලි බල්බ පාවිච්චි කරන්න. අනවශ්‍ය විදියට විදුලි උපකරණ පාවිච්චි කරන්න එපා. අපි මේ වෙලාවේ අපේ ජාතික විදුලි පද්ධතිය ගැනම හිතන්න ඕනේ.

මේ වෙලාවේ පවුලේ ආදරය සතුටත් බොහොම වැදගත්. අගහිඟකම්වලිනුත් සතුට හොයාගන්න පුළුවන්. වාහනවලින් ට්‍රිප් ගියා නම් කෝච්චියෙන් ගිහින් බලන්න. ඒක දරුවන්ටත් හොඳ අත්දැකීමක් වෙයි.

සාමාන්‍යයෙන් පුංචි දරුවෝ දකින දේ ඉල්ලනවනෙ. මේ වෙලාවේ අත්‍යවශ්‍ය නොවන දේට මුදල් වියදම් කරන්න බැරි බව ආදරෙන් දරුවන්ට කියලා දෙන්න. අපිට මේ නරක කාලෙ ගෙවාගන්න පුළුවන්. ඒ කාලේ එනකල් අපි අපිව රැකගමු. අපේ ආදරණීයන්ව රැකගමු. විශේෂයෙන්ම අපේ හිත් රැකගමු. මොකද සතුට කියන එක තියෙන්නෙම අපේ හිතේ."

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි


AUTOWHEEL
පවුලේ අවන්හල දැන් විවෘතයි
ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක
සජීවී සංගීතය සමඟින්


එකක මිල රු:395/-
AA CEYLON Estd. 1904
ලංකා ඔටෝමොබයිල් සංගමය
40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත, කොළඹ 03.
විමසීම්: 077 - 4369013 ( ක්‍රිෂෝන් )



මනාලියන් හැඩගැන්වීම කොණ්ඩා කැපීම හා රූපලාවන්‍ය උසස් ඩිප්ලෝමා පාඨමාලාව
වැඩිදෙනාගේ ඉල්ලීම පරිදි දැයේ තරුණ දූදරුවන්ට කෙරෙන මෙහෙවරක් උදෙසා මෙම පාඨමාලාව පැවැත්වේ.


City & Guilds Approved Centre
මෙහෙයවීම
ප්‍රවීණ රූපලාවන්‍ය විශාරද, පාඨමාලා උපදේශිකා.
සුසී සමරසේකර
(තායිලන්තය, ඉන්දියාව, මැලේසියාව, සිංගප්පූරුව විශේෂ පුහුණුව ලත් ක්ෂේත්‍රයේ වසර 25ක පළපුරුදු රූපලාවන්‍ය පාඨමාලා උපදේශිකා)
2023-1 වන කණ්ඩායම සඳහා දැන් සිසුන් බඳවා ගැනේ.
01. මනාලියන් හා යෙහෙලියන් හැඩගැන්වීම (උඩරට, පහතරට, හින්දු, මුස්ලිම්, බටහිර) 02.මල් කලඹ සැකසීමේ විවිධ ක්‍රම (ප්‍රායෝගික පුහුණුව ලබාදේ) 03. Bridal Make-up, Normal Make-up, රූපවාහිණි වීඩියෝ හා විවිධ අවස්ථාවන් වලට ගැලපෙන පරිදි අතිනවීන Make-up ක්‍රම 04. Bridal Hair Style, Normal Hair Style, සඳහා දැනුම සහ ප්‍රායෝගික පුහුණුව 05. ජාත්‍යන්තර කොණ්ඩා කැපීමේ අතිනවීන ක්‍රම හා කොණ්ඩා කැපීමට භාවිතා කරනා සියළු උපකරණ පිළිබඳ දැනුම ලබාදීම 06. විවිධ සමට ගැලපෙන Normal, Skin Glow, Skin Lightning, Thermo Herb, Gold, Herbal facial ඇතුළු සියළු ෆේෂල් පිළිබඳ ප්‍රායෝගික දැනුම හා පුහුණුව 07. Straightening, Rebonding, Hair Relaxing, Perming කිරීමේ නවීන ක්‍රම 08. නවීන විලාසිතාවලට සාරි ඇන්දවීමේ ප්‍රායෝගික දැනුම හා පුහුණුව 09. හිසකෙස් වර්ණ ගැන්වීමේ නවීනතම ක්‍රම 10. පැසුනු හිසකෙස් වර්ණ ගැන්වීම හා දැනගත යුතු ඉතා වැදගත් කරුණු 11. High Sequence, Galvenic, Facial Steamer, Head Steamer, Vacume Spray, Wart removing Machines ඇතුළුව රූපලාවන්‍යාගාරය තුල භාවිතයට ගන්නා සියළු උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා දීම. 12. රූපලාවන්‍යාගාරයක් ආරම්භ කර එය නිසි පරිදි පවත්වාගෙන යෑමට උපදෙස් ලබා දීම (Salon Management), ජපානයේ ප්‍රචලිත Concave කලාවේ කොණ්ඩා කැපීමේ ක්‍රම රැසක් සමගින් අතිනවීන තාක්ෂණික ක්‍රම උපයෝගි කරගනිමින්
කොටස් 50කට අධික අංග සම්පූර්ණ පාඨමාලාවකි.
අභියෝග හමුවේ දක්ෂ රූපලාවන්‍ය ශිල්පියෙකු වී ජිවිතය ජයගන්න ...
අපගේ අරමුණ දක්ෂ රූපලාවන්‍ය ශිල්පී/ශිල්පිණියන් දැයට දායාද කිරීමයි.
● තම අභිමානයෙන් ස්වයං රැකියාවක් ලෙස නිවසේ සිට විශාල ආදායමක් උපයා ගැනීමට අවශ්‍ය දැනුම ලබා දේ
පාඨමාලා කාලය මාස 06 යි
පාඨමාලා ගාස්තුව රු. 29900/-
මුලින් රු. 3000/= ක් ගෙවා ඉතිරිය කොටස් වශයෙන් ගෙවිය හැක.
සතියට එක් දිනක් පන්ති පැවැත්වේ.
පාඨමාලාව අවසානයේ මනාලියන් දැක්ම සහ Diploma සහතික ප්‍රදානෝත්සවය කොළඹ BMICH හිදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්වේ
මෙම පාඨමාලාව සඳහා මූලික දැනුමක් අවශ්‍ය නොවේ. ● වයස් සීමාවක් නොමැත.
මීගමුව ජයනි (බස් නැවතුම්පල ඉදිරිපිට) ජන: 06/13/20/27 සිකුරාදා පෙ.ව. 10.00-1.00
කිරිබත්ගොඩ-මාකොළ Salon Susee රූපලාවන්‍යාගාරය Keels Super ඉදිරිපිට ජන: 08/15/22/29 ඉරිදා පෙ.ව. 10.00-1.00
මහනුවර Salon Susee රූපලාවන්‍යාගාරය ජන: 10/17/24/31 අඟහ. පෙ.ව. 10.00-1.00
කුරුණෑගල බාලදක්ෂ මූලස්ථානය තව්වේරිය පාර RED CROSS ඉදිරිපිට ජන: 11/18/25 පෙබ: 01 බදාදා පෙ.ව. 10.00-1.00
salon susee Bridal, Hair & Beauty Academy
විමසීම්: 0778 360 660 0776 544 897 0773 499 719
www.salonsusee.lk salonsusee

## කෙටි කතාව

# දවල්ට ගෙවල්වල තනියම ඉන්න නෝනලා අල්ලගන්න ලේසියි සර්



“අම්මා මම ඉස්සරහ ගෙදරට ගිහින් එන්නම්. දොර වහගෙන ඉන්න. වෙන කවුරුත් ආවට දොර අරින්න එපා.” කී ඔහු ලහි ලහියේ නිවසින් පිට වූවේය.

“පුතේ මේ නැහැදිච්ච කොල්ලෝ කුරුට්ටෝ ටිකක් බෝ වෙලා මේ පැත්තේ.” වැඩ ඇරී පැමිණි පුතණුවන්ට කුසුම් පැවසුවේ සුසුමක් හෙළමිනි.

“ඇයි අම්මා? මොකද්ද වුණේ?” මාධව විමසුවේ පුදුමයෙනි.

“මේ සතිය පුරාම සැරින් සැරේ ගේට්ටුවේ බෙල් එක ගහනවා. මම ගිහින් බලද්දී එකෙක්වත් නැහැ පේන්න. මේ වයසක මට මොන වදයක්ද කියන්නකෝ පුතේ සැරින් සැරේ ගිහින් ගේට්ටුව ඇර ඇර බලන එක.” කුසුම් කිවේ කළකිරීමෙනි.

“කීයට වගේද අම්මා ඔය වැඩේ වෙන්නේ?”

“දවල් 10 ඉඳන් හවස 3 වෙනකම් සැරින් සැරේ බෙල් ගහනවා පුතේ. නිදාගන්නවත් නැහැනේ.”

මාධව කල්පනාවට වැටුණේ පසෙකින් වාඩිවෙන ගමන්ය.

“මේ ඉස්කෝලේ දවස්නේ. කොහොමද දවල්වරුවේ ඉස්කෝලේ ඉන්න ඕනේ ළමයි බෙල් කර කර යන්නේ? එහෙනම් ඉස්කෝලේ යන වයස පහුවුණ කවුරුහරිද මේ වැඩේ කරන්නේ? මේ පැත්තේ එහෙම කොල්ලෝ කුරුට්ටෝ නැහැනේ.”

“අම්මේ හෙට ඉරිදා මම ගෙදරනේ. අපි බලමු හෙටත් මේ වැඩේ වෙනවද කියලා.” කියූ මාධව නාන කාමරයට ගියේය.

සෙනසුරාදා උදේම අවදි වූ මාධව මිදුලට බැස අවට පරීක්ෂා කරන්නට පටන්ගත්තේය. ගේට්ටුවේ කලින් නුදුටු තීන්ත පැල්ලමක් දුටු මාධව විස්මයට පත් වුවේය. එය සූරා දැමූ මාධව නිවස තුළට ගියේ අම්මාගෙන් ඒ ගැන විමසන්නටය.

“අම්මා දැක්කද ගේට්ටුවේ සුදු තීන්ත පැල්ලමක් තියෙනවා?”

“ඔව් පුතා දැන් සතියක් විතර.” ඇය පිළිතුරු දුන්නාය.

“අපේ ගේට්ටුවේ ඇයි කවුරුවත් තීන්ත ගාන්නේ?” මාධව කල්පනාවට වැටුණේ නිහඬවමය.

“ශික් මට  තාම බැරි වුණානේ කැඩුණු සීසීටීවී කැමරාව හදාගන්න.” මාධව කල්පනා කළේ මීට සති දෙකකට පෙර කැඩුණු සීසීටීවී කැමරාව ගැන සිහි කරමිනි. එය ඇද වී පහතට එල්ලෙමින් තිබුණු අතර මාධව උපකල්පනය කළේ කුරුල්ලෙකුගේ බලපෑමෙන් එසේ සිදුවන්නට ඇති බවය. එහෙත් මාධවට එකවර බියක් දැනෙන්නට පටන්ගත්තේ නිවසේ සිට අතුරුදන් වූ බලු සුරතලාව සිහිවීමෙනි. එය සිදුවූයේද මේ මාසය ඇතුළතය.

බලු පැටියාව සොයාදෙන කෙනෙකුට රුපියල් 20,000ක ත්‍යාගයක් දෙන බව පවසමින් දැන්වීම් පළ කළා මිස මින් පෙර සැකයක් ඇති නොවුණේ ඇයි දැයි මාධව කල්පනා කළේ හිසෙහි අත ගසාගෙනය.

“අම්මා මම ඉස්සරහ ගෙදරට ගිහින් එන්නම්. දෙර වහගෙන ඉන්න. වෙන කවුරුත් ආවට දෙර අරින්න එපා.” කී ඔහු ලහි ලහියේ නිවසින් පිට වූවේය.

“මාලින්ද අයියේ, මට උදව්වක් කරපන්. අපේ ගේ ඉස්සරහ උඹලගේ කැමරාවට අහුවෙනවා නේද? සැක හිතෙන කවුරුත් ගැවසුණාද කියලා මට බලාගන්න ඕනේ.” මාධව කියද්දී මාලින්ද පසුගිය මාසයේ දර්ශනයන් මාධවට පෙන්වූවේය.

“මේ බෙල් ගහගෙන වේගයෙන් යන්නේ බයික් කාරයෝ දෙන්නෙක්නෙ.”

“මචන් මේ බලපන්. කවුරුහරි උඹේ ගෙදර ෆොටෝ ගන්නවා.” මාලින්ද දර්ශනයන් මාධවට පෙන්වමින් කිවේ පුදුමයෙනි.

“පොඩ්ඩක් හිටපන් මේ සති තුනකට විතර කලින් කාත් එක්කද මේ අම්මා ගේට්ටුව ගාව කතා කර කර ඉන්නේ? මුන් මොනවා හරි බඩු ටිකක් විකුණන්න හදනවා වගේ අම්මට.” තවත් දර්ශනයක් දුටු මාධවට කියැවුණි.

වහාම නැවතත් නිවසට ගිය මාධව නිවසට ගොස් ඒ ගැන අම්මාගෙන් විමසා සිටියේය.

“මාලින්ද අයියේ, මට උදව්වක් කරපන්. අපේ ගේ ඉස්සරහ උඹලගේ කැමරාවට අහුවෙනවා නේද? සැක හිතෙන කවුරුත් ගැවසුණාද කියලා මට බලාගන්න ඕනේ.” මාධව කියද්දී මාලින්ද පසුගිය මාසයේ දර්ශනයන් මාධවට පෙන්වූවේය

“අනේ පුතේ මට අමතක වුණානේ. ඒ දරුවෝ මොනවද මන්දා ඉලෙක්ට්‍රික් බඩු වගයක් අරන් ආවා විකුණන්න. මට ගන්නමත් හිතුණා පව් නිසා. ඒත් ඕවා පස්සේ කැඩෙයිද නොදන්නා නිසා මම ඒ දරුවන්ට කිව්වා මම අපේ පුතාගෙන් අහලා තියන්නම් කියලා. ඒ දරුවෝ ටික ආයේ එනවා කිව්වේ හරියටම මාසෙකින්.” අම්මා කියද්දී මාධවගේ සැකය සනාථ විණි.

නගරයේ ජීවත්වන අයියාවද දැනුවත් කළ මාධව ඊළඟ සතියේ නිවසේ රැඳී සිට වැඩ කිරීමේ අවසරය කාර්යාලයෙන් ලබාගත්තේය. අයියාට නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම නොමැති නිසා ඔහු නිවාඩු දමා මහගෙදරට පැමිණියේය. රහස් කැමරාවක් ගේට්ටුවෙහි සවිකර, සිදුවන දේ පිළිබඳව පොලිසියේ වැඩ කරන සිය මිතුරෙකුද දැනුවත් කළ දෙසොහොයුරන් දෙදෙනා නිවසේ රැඳී සිටියේ සිදුවන දේ දැන ගන්නටය.

ඊළඟ සතියේ විකුණුම්කරුවන් දෙදෙනා නැවත පැමිණ තිබුණි.

“අම්මා බොහොම ස්තූතියි අපෙන් බඩු ගත්තට. මහන්සියි අම්මා. අපිට වතුර ටිකක් දෙන්න පුළුවන්ද?” ඔවුන් පවසනු මාධව සහ සොයුරා කැමරාවෙන් බලා සිටියෝය.

“ආ දරුවෝ ඇවිත් මිදුලේ බෙන්ච් එකෙන් වාඩිවෙන්න.” වෙනසක් නොපෙන්වා ඔවුන්ට කී කුසුම්ද නිවස තුළට පැමිණියාය.

විකුණුම්කරුවන් දෙදෙනා බෙන්ච් එක පසුකර නිවස දෙසට පැමිණෙනවාත් සමඟම පොලිසියේ මිතුරන්ට ඇමතුමක් දුන් මාධව සහ දෙසොහොයුරන් විසිත්ත කාමරය දෙසට පැමිණියෝය.

කුසුම් මුළුතැන්ගෙයට ඇතුළු වූ අතර එක විකුණුම්කරුවෙකු විසිත්ත කාමරයේ පුටුවක් මත මාධව විසින් තියා තිබූ ටැබ් යන්ත්‍රය අතට ගත්තේය. ඔවුන් සොරුන් බව ස්ථිර කරගත් සොයුරන් දෙදෙනා වහාම ඔවුන් ඉදිරියට ගිය අතර කලබල වූ දෙදෙනා පලා යන්නට උත්සාහ කළෝය. නමුත් අනෙක් පසින් පොලිසිය පැමිණි අතර සොරුන්ව ඔවුන්ගේ ග්‍රහණයට හසුවිණි.

“සර් අපි බඩු විකුණන්න යනවා වගේ ගෙවල්වල ඉන්නේ කවුද කියලා ඔත්තු බලනවා. අපි බොරුවට අපි රැකියා විරහිත උපාධිධාරීන් කියලා කියනවා. ගොඩක් වෙලාවට ගෙවල්වල තනියම ඉන්නෙ ගැහැනු අය. එතකොට අපිට අනුකම්පා කරනවා. සතියක් දෙකක් පුරාවට අපි චෙක් කරනවා දවල්ට එයාලා තනියමද ඉන්නේ කියලා. ඒකයි අපි ගේට්ටුවේ බෙල් එක ගහන්නේ. හැමදාම ගේට්ටුව අරින්න එන්නේ එකම ගැහැනු කෙනා නම් සාමාන්‍යයෙන් දවල් කාලයේ ගෙදර ඉන්නේ ඒ ගෑනු කෙනා විතරයි කියලා අපි ස්ථිර කරගන්නවා. සීසීටීවී කැමරාව කැඩුවේ, බල්ලව හොරකම් කළෙත් අපි තමයි සර්.” ඔවුන් පාපොච්චාරණය කර තිබිණි.

“එතකොට ගේට්ටුවේ තීන්ත ගෑවේ?”

“ඒ අපි ආරක්ෂාව අඩු ගෙවල් මාර්ක් කරගන්න ක්‍රමයක් සර්. අනිත් එක ඒ පැල්ලම ගෙදර කෙනෙක් අයින් කරන්නේ නැත්තම් ඒකෙන් අපි තේරුම් ගන්නවා ගෙදර මිනිස්සු ගෙදර ආරක්ෂාව ගැන වැඩිය හිතන්නේ නැහැ කියලා. අනිත් එක අපි කඩපු කැමරාව මේ වෙනකම් හදලා තිබ්බෙත් නැහැ. නැතිවුණ බල්ලව හොය හොයා හිටියා මිසක් අලුත් බල්ලෙක්ව ගෙනාවෙත් නැහැ. ඉතින් මේ ගෙදර අයට සිද්ධ වෙන කිසිම දෙයක් ගැන සැකයක් ඇති වුණේ නැහැ කියලා අපිට ස්ථිර වුණා.” ඔවුන් වැඩිදුරටත් විස්තර කර තිබිණි.

කුසුම්ගේ අවිවාහක ඥාතී සොයුරියක් නිවසේ නවත්වා ගන්නට මාධව තීරණය කළේ ඉන් අනතුරුවය.

■ සමාධි ධයස්



# ඩේටින් ඇප් එකෙන් හමුවුණු පෙම්වතාගෙන්

## බඳිමුද ඇහුවාම මරලා ෆ්‍රිජ් එකේ දාලා



ශ්‍රද්ධා වෝකර් ඇඟිලි ගනිමින් බලා සිටියේ 'මගේ වස්තුවේ අපි කසාද බඳිමු' කියා අෆ්තාබ් පුනාවාලාගේ මුවෙන් පැවසෙන තුරුය.

ශ්‍රද්ධා හා අෆ්තාබ් හමුවනවිට ශ්‍රද්ධාගේ වයස අවුරුදු විසිහතරකි. ඔවුන් හමුවුණේ ඩේටින් ඇප් (Dating App) එකක් හරහා සිදුවූ දැන හඳුනාගැනීමක් මතය. ඒ දිල්ලියේදීය.

සුන්දර සිනහවකට හිමිකම් කී ශ්‍රද්ධා දුටුමනින්ම අෆ්තාබ්ගේ හිතේ ඈ ගැන කැමැත්තක් ඇතිවිය. ශ්‍රද්ධාද අෆ්තාබ්ගේ අත අල්ලාගත්තේ ජීවිත කාලයම එකට ඉඳීමේ ප්‍රාර්ථනය සිතේ දරාගෙනය. කඩවසම් තරුණයෙකු වූ අෆ්තාබ් තම ආගමේ නොවීම ඇය ගැටලුවක් කරගත්තේ නැත.

පළමු හමුවීමෙන් පසු ඔවුනගේ ආදරය දළුලා වැඩිනි. හින්දු චාරිත්‍රයට අනුව අෆ්තාබ්ගේ මනාලිය වන්නට දින ගනිමින් උන් ශ්‍රද්ධාට අෆ්තාබ් කීවේ ඈ අසන්නට බලා සිටි වදන් පෙළ නොවේ.

**"ශ්‍රදී.... අපේ ගෙදරින් ඔයාට කැමති නෑ... ඒත් දෙවියන්ගේ නාමෙන් මං ඔයාව අමතක කරන්නේ නැහැ. අපි අලුත් ජීවිතයක් පටන්ගමු."**

ඒ වනවිටත් ඔවුනගේ ජීවිතයේ අලුත් පරිච්ඡේදයක් පෙරළී තිබුණි. ඔවුන් නිදහසේ හමුවූ අතර, සමාජශීලී තරුණියක වූ ශ්‍රද්ධාත් අෆ්තාබුත් ප්‍රේමයේ සුන්දරත්වය රිසි සේ විඳගනිමින් සිටියේ, නීතිපොතේ විවාහය ලියා තබන්නටත් කලිනි.

**"අපේ ගෙදරත් අපේ සම්බන්ධෙට කැමති නෑ. ඒත් අපි අපේ ගෙදර යං අෆ්තාබ්. අම්මාව මං කොහොමහරි කැමති කරගන්නම්."**

ශ්‍රද්ධා කීවාය. ශ්‍රද්ධා එසේ කීවත් ඇය සිය පෙම්වතාව නිවසට කැඳවාගෙන එද්දි පවුලේ වැඩිහිටියෝ කැමැත්තක් පෙන්නුවේ නැත. අෆ්තාබ්ගේ මාපියන් ව්‍යාපාර කළ බැවින් අෆ්තාබ් අත මුදල් ගැවසිණි.

**"අපි කසාද බඳින්නේ කවදද...?"**

ශ්‍රද්ධා අසන්නේ සන්සුන්ව නමුත්, පසුව ඔවුන් අතර ගැටුම් ඇතිවෙන්නට මූලිකම හේතුව වූයේත් එම වදන් පෙළයි.

කාලය ගෙවී යමින් තිබුණි. ටික දිනක් ශ්‍රද්ධා කසාදය ගැන ඔහුට මතක් කළේ නැත. මතක් කළත්, අෆ්තාබ් ඒ සෑම මොහොතකම ඒ කතාව මගහැර ගියේය. ඇතැම්විට ඔහු දින දෙක, තුන ගෙදර ආවේ නැත. ශ්‍රද්ධාගේ මාපියන්ටද අෆ්තාබ්ගේ මේ ගතිගුණ ඇල්ලුවේ නැත. දිනක් අෆ්තාබ් නිවැසියන් සමඟ ඇතිවූ ආරවුලකින් පසු දෙදෙනා වෙනම නිවසක පදිංචියට ගියහ.

ඒ අනුව ඔවුන් මුම්බායි සිට දිල්ලියට ආවේ මෙම අවුරුද්දේ පෙබරවාරි මාසයේයි.

එම නිවස ඔවුන් කුලියට ගත්තේ මෙහ්රාලි ප්‍රදේශයේ මහල් නිවාස සංකීර්ණයකිනි. ඊට යාබදව ඇත්තේ කැලෑබද ප්‍රදේශයක් නමුත් ඒ පරිසරය ශ්‍රද්ධාගේ සිත් ගත්තාය.

මාස දෙක තුනක් ගතවිණි. ශ්‍රද්ධා බලාපොරොත්තු වූ කිසිවක් ඇයට ලැබුණේ නැත. ඕනෑම මොහොතක අෆ්තාබ් තමන් හැරයනු ඇතැයි ඇයට නොයෙක්වර සිතී තිබිණි.

**"අෆ්තාබ් මට ගහනවා. බණිනවා. මට ගෙදරින් යන්න කියලත් කියනවා."**

මැයි මාසයේ දිනක ශ්‍රද්ධා සිය මවට දුරකතනයෙන් කීවාය. තාත්තාත් සහෝදරයාත් තමන් හා හිත් අමනාප වුනත් ඈ ඉඳහිට අම්මා සමඟ දුක බෙදාගත්තාය. ඇයට ළඟම මිතුරු මිතුරියන් සිටියත් පවුල් ප්‍රශ්න ඔවුන් හා කතා කරන්නට ගියේ නැත.

මේ අතර ඔහු එක් සන්ධ්‍යාවක අලුත් ශීතකරණයක් ගෙන ආවේය. ඇපල්, දෙඩම්, මිදි වාගේ පලතුරුත් මස්, මාළුත් එහි ගෙනැවිත් දැමුවේය.

**"රණ්ඩු නොකර කාලා බීලා ඉන්න."**

අෆ්තාබ් කීවේය. එහෙත් මේ කුමන දේ කළත් කළයුතුම දෙය ඔහු මග හරිනවා යැයි ශ්‍රද්ධාට සිතුණි.

ඇය තවත් දිනක තම විවාහය ගැන අෆ්තාබ්ට මතක් කළාය. එදා ගේ දෙක වෙන්නට දෙන්නාම කෑ ගසාගත්තේය. ගුටිබැටද හුවමාරු විනි. ඒ වෙනදා මෙන් නොවේ. අෆ්තාබ් ඇයගේ ගෙල සිර කරගෙන සිටියේය.

ටික වෙලාවකින් ශ්‍රද්ධා නිසලව කඩා වැටුණාය. අෆ්තාබ් ඇගේ සිරුර කුස්සියට ඇදගෙන ගියේ ඉන් පසුවය.

**"අෆ්තාබ් පුනවාලා ඇයගේ සිරුරේ කොටස් කැබලි කරලා අලුත් ශීතකරණයේ ගබඩා කරලා තිබුණා. ඒ කැබලිවලින් කොටසක් රහසේම ඔවුන් පදිංචි නිවස අසල තියෙන වනාන්තරයට ගිහින් දාලා තියෙනවා."**

ඒ මෙහ්රාලි පොලිස් ස්ථානයේ නිලධාරියෙකු මාධ්‍යයට දුන් ප්‍රකාශයකි.

අෆ්තාබ්ගේ ක්‍රියා කලාපය හෙළිවෙන්නේ මෙම සිද්ධියෙන් මාස කිහිපයකට පසුය. එනම් මීට දින කිහිපයකට පෙර ශ්‍රද්ධා අතුරුදන්ව ඇතැයි ඇගේ පියා විසින් පොලිසියට කරන ලද පැමිණිල්ලකට අනුවය. ඔහු එම පැමිණිල්ල කරන්නේ ඇයගේ මිතුරෙක් ලබාදුන් තොරතුරක් නිසාය. ඒ මාස ගණනාවක සිට තම කෙටි පණිවුඩවලට ඇය ප්‍රතිචාර දක්වා නැති බවට අදාළ මිතුරා ශ්‍රද්ධාගේ සහෝදරයාට ලබාදුන් ඇමතුම නිසාය.

ශ්‍රද්ධා ඝාතන චෝදනාවලට අත්අඩංගුවට පත් අෆ්තාබ් ඇයගේ සිරුරු කොටස් බැහැර කළායැයි කී වනාන්තර ප්‍රදේශයද හඳුනාගෙන තිබිණි.

කලක සිට ඔහු සියල්ල සැලසුම් කර ඇති බවද කියැවේ. කුලී නිවසකට යෑම, ශීතකරණය මිලදීගැනීම ඉන් කිහිපයකි. මේ අනුව අෆ්තාබ්ට හිමි දඬුවම් නීතියෙන් ලැබෙනු ඇත. නමුත් ශ්‍රද්ධාට යළි ජීවිතය ලැබෙන්නේ නැත.

දුටුමනින් විවිධ ඇප් හරහා හඳුනාගනිමින් සිහින ලෝකවල සැරිසරන බොහෝදෙනෙකුගේ ජීවිතවල ඉරණම මෙවැන්නකි. ශ්‍රද්ධා ලොවට කියාදෙන පාඩම එයයි.

■ දීපා වසන්ති එදිරිසිංහ






# ‘පැන්ඩා’ නම දැම්මේ කැන්ගරුවෙක්

# ඒ වුණාට මමනම් කතා කරන්නේ බබා කියලා

## පරණ තිසරව ආයෙමත් දකින්න මං ආසාවෙන් ඉන්නේ

### තිසර පෙරේරාගේ බිරිඳ ෂෙරමි දිනූෂිකා

**කලක් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ කවුරුත් ආදරය කළ ක්‍රීඩකයා වූයේ ඔහුය. ඔහු පිත්තත් රැගෙන ක්‍රීඩා පිටියට එන්නේ කොයි මොහොතේද ඒ බොහෝ අවස්ථාවල ක්‍රීඩාලෝලීන්ට දැකගන්නට ලැබුණේ අලංකාර මල් වෙඩි සංදර්ශනයක් බඳු ඇස් පිනායන අන්දමේ පිතිහරඹයකි. ඒ තුළ වැඩිපුරම තිබුණේ යෝධ හයේ පහරවල්ය. එපමණක් නොව මේ ක්‍රීඩකයාට ඕනෑම මොහොතක පන්දුවද හොඳටම හුරුය. පිටියේ සිටින්නේ ලෝකයේ දක්ෂතම පිතිකරුවා වුවද ඔහු පන්දු යැවීමට පැකිළෙන්නේ නැත. එසේම තවත් විටෙක ඔහු පිටිය සිසාරා පියඹායන්නේ රැකගන්නට නොහැකි උඩපන්දු පවා රැකගන්නටය. ඒ නිසාම ඉරියව් තුනෙන්ම රජ වූ සැබෑම තුන් ඉරියව් ක්‍රීඩකයෙකු ලෙස මේ ක්‍රීඩකයා හැඳින්විය හැකිය. ඒ වෙන කවුරුත් නොව ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු තුන් ඉරියව් ක්‍රීඩක තිසර පෙරේරා ය. ඉතින් තිසර ගැන මේ කතාබහ ඔහුගේ ආදරණීය බිරිඳ වන ෂෙරමි දිනූෂිකා සමඟිනි.**

**අපට මුලින්ම කියන්න තිසර ඔබට මුණගැහුනේ කොහොමද?**

අපි දෙන්නම එකම ගමේ. ඒ කියන්නේ මිනුවන්ගොඩ. ඉතින් පොඩි කාලේ ඉඳලා අපි අපිව දන්නවා. මට මතකයි හතරෙ පන්තියේ ඉඳලා තිසරයි මමයි අපි දෙන්නම එකම දහම් පාසලේ එකම පන්තියේ හිටියේ. ඒ යාළුකම තමයි පස්සේ කාලේ ආදරයකට හැරුණේ.

***කෙනෙක්ට කැමති වෙන්නත් මොකක්ම හරි විශේෂ හේතුවක් තියෙන්න එපැයි. ඇත්තටම ෂෙරමි තිසරට කැමති වුණේ ඇයි?**

ඇත්තම කිව්වොත් මට තිසරට අකමැති වෙන්න හේතුවක් තිබුණේ නෑ. අනික මං එයාව පොඩි කාලේ ඉඳන්ම දන්නවනේ. එකම ගමේ හින්ද අපේ පවුලයි එයාගේ පවුලයි හරි එකතුයි. ඒක නිසා තිසර මට කැමතියි කියපු ගමන් මමත් කැමති වුණා.

**එදා තිසර ක්‍රිකට් තෝරගනිද්දි පෙම්වතිය විදියට අකමැතිවුණේ එහෙම නැද්ද?**

අනේ නෑ. හැබැයි මං ඉස්සර ක්‍රිකට් ගැන ලොකුවට දන්නේ නෑ. ඇත්තම කිව්වොත් ක්‍රිකට් මැච් එකක් බලන්නෙවත් නෑ. තිසර ඉස්කෝලේ කාලේ මැච්වලට යනකොට මට කියනවා “අද ටීවී එකේ මං පෙන්නනවා බලන්න” කියලා. මං ඉතින් බලනවා. ඔය විදියට තමයි මමත් ක්‍රිකට්වලට උනන්දු වුණේ. කොහොමහරි එයා ජාතික කණ්ඩායමට ආවට පස්සේ නම් එයා ඉන්න කිසිම මැච් එකක් මගඇරියේ නැතුව බැලුවා.

**ඒ කියන්නේ තිසර ක්‍රිකට් ක්‍රීඩකයෙක් විදියට ක්‍රීඩා කරපු හැම තරඟයක්ම බලන්න ගියාද?**

ලංකාවේ තිබුණු මැච්වලට නම් ගොඩාක් වෙලාවට ගියා. විදෙස් සංචාරවලට යද්දිත් මං ගොඩාක් වෙලාවට එයා එක්ක ගියා. එහෙමත් වෙලාවක තමයි ටීවී එකෙන් මැච් එකක් බැලුවේ.

**තිසර ක්‍රීඩා කරපු තරඟ අතරින් අමතකම නැති තරඟයක් ෂෙරමිට තියෙනවද?**

එක සැරයක් නවසීලන්තයට එරෙහිව එයා එක්දින තරඟයකදි පන්දු 74කදී ලකුණු 140ක් ගැහුවා. ඒ අංක හත පිතිකරුවා විදියට ඇවිත්. මට මතකයි එදා තිසර හයේ පහරවල් 13ක් ගැහුවා. වාසනාවකට වගේ මං එදා මැච් එක බලන්න ගිහින් හිටියේ. ඉතින් මුළු රටම කතා කරපු තිසරගේ ඒ ඉනිම ඇස් දෙකෙන්ම බලන්න මටත් පුළුවන් වුණා. ඒක ගැන මට හරිම සතුටුයි. මොකද නිකන් හරි ඒ අවස්ථාව මට මගඇරුණා නම් ගොඩාක් දුක හිතෙන්න තිබුණා.

**2014 විස්සයි විස්ස ලෝක කුසලාන අවසන් මහා තරඟයත් ශෙරමිට අමතක නැතුව ඇති නේද?**

අනේ ඒ මැච් එකත් කවදාවත්ම මට අමතක වෙන්නේ නෑ. එදා ලෝක කුසලානය ශ්‍රී ලංකාව දිනනකොට ජයග්‍රාහී අන්තිම ලකුණ රැස්කළේ තිසර. බිරිඳ විදියට ඒ මොහොතේ ඇතිවුණු හැඟීම වචන කරන්න අදටත් මට තේරෙන්නේ නෑ.

**එදා තරඟයෙන් පස්සේ තිසර ඔයාට කිව්වේ මොනවද?**

එහෙම විශේෂ දෙයක් නම් කිව්වේ නෑ. ඒත් එයා කවදාවත් නැතිතරම් සතුටින් එදා හිටියේ. හැබැයි මැච් එකට කලින් නම් මට කිව්වා “මං තනියම හරි මේ මැච් එක ගහනවා” කියලා. එහෙම කරන්න පුළුවන් කියලා මැච් එකට යද්දි ලොකු විශ්වාසයකින් හිටියේ. අන්තිමේ කුමාර් සංගක්කාරත් එක්ක එයාටම ඒක ඉවර කරන්න ලැබුණා.

**සාමාන්‍යයෙන් ක්‍රිකට් ක්‍රීඩකයින්ට තරුණියන්ගේ දැඩි ආකර්ෂණයක් ලැබෙනවනේ. ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක් විදියට ඒක ඔබට දැනුණේ කොහොමද?**

තිසරගේ බිරිඳ විදියට ඒ ගැන මට තිබුණේ සතුටක්. මොකද ඒ වෙනකොට අපි විවාහවෙලානේ හිටියේ. ඒක නිසා මට එයා ගැන බයක් තිබුණේ නෑ. මොකද එයා මගේ කියලා මං දන්නවා. ඉතින් ගොඩාක් අය ආදරේ කරපු තිසර මගේනේ කියන නිහතමානී ආඩම්බරය මට තිබුණා.

**එතකොට ක්‍රිකට් ක්‍රීඩකයෝ කියන්නේ කාර්යබහුල අය. ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක් විදියට ඒක ඔබට දැනුණේ කොහොමද?**

තිසර කොච්චර කාර්යබහුල වුණාත් එයා කාර්යබහුලයි කියලා මට දැනුණේ නෑ. මොකද මං නිතරම එයා එක්කම හිටියා. මුලදි මං කිව්වා වගේ එයාගේ හැම තරඟයක්ම වගේ මං බලන්න ගියා. විදෙස් සංචාරයකට ගියත් මමත් එයා එක්ක ගියා. ඒක නිසා ලොකුවට එහෙම දෙයක් දැනිලා නෑ.

**තිසර පෙරේරා හොඳින්ම දස්කම් අතර සිටියදී තමයි එක්වරම ජාතික කණ්ඩායමට සමුදුන්නේ. එයා ඒ තීරණය ගන්න ඉක්මන්වුණා වැඩියි කියලා ඔබට හිතිලා නැද්ද?**

බොරු කියන්න ඕන නෑ මට නම් ඒක එදත් හිතුණා අදත් හිතෙනවා. ඒත් එයා ඉතින් එයාටම හිතිලා ජාතික කණ්ඩායමෙන් සමුගත්තා. ඒක එයාගේ තීරණය. මං බල කරන්න ගියෙත් නෑ. මොකද ක්‍රිකට් තෝරගත්තේ එයා නිසා ඒකට සමුදෙන එකත් එයාම බලලා තීරණය කරන්න ඕනේ. ඒත් ඉතින් මං නම් අදටත් එයා ජාතික කණ්ඩායම නියෝජනය කරනවා බලන්න කැමතියි.

**එහෙම සමුගත්තට පස්සේ තිසර ඒ සමුගැනීම ගැන පස්සේ කාලේ පසුතැවිලා එහෙම නැද්ද?**

එහෙම නම් දැනිලා නෑ. ඒත් මෑතකදි මැච් බලන ගමන් කීපසැරයක්ම කිව්වා “අපරාදේ ඒ මැච් එකේ මං හිටියා නම් ගහනවා” වගේ කතා. එයා ගොඩාක් වෙලාවට මැච් බලද්දි කියනවා ඉතින් එයාට ඒ බෝලේ වැටුණා නම් ගහන විදිය ගැන එහෙම. ඒ වෙලාවට මං නම් කියනවා “ඔයාට තව කාලයක් ක්‍රිකට් ගහන්න තිබුණා අපරාදේ ඉක්මන් වුණේ” කියලා. ඇත්තටම එයාට තව කාලයක් ක්‍රිකට් ගහන්න තිබුණා.

**තිසර සමුගත්තට පස්සේ එදා තිබුණු ජනප්‍රියත්වය අදටත් එයාට ලැබෙනවද?**

ඇත්තටම ලැබෙනවා. ගොඩාක් තැන්වලදි ක්‍රිකට් ක්‍රීඩකයෙක් විදියට ආදරේ කරන අය එයාගේ ළඟට ඇවිත් කතාබහ කරලා සෙල්ෆියක් එහෙම ගහගෙන යනවා. එයාලා අදටත් තිසරව අමතක කරලා නෑ. සමහර වෙලාවට තිසරම මට හිනාවෙවී කියනවා “මං ක්‍රිකට් ගහන කාලෙවත් ෂෙරමි මෙච්චර ප්‍රසිද්ධ නෑනේ” කියලා.

**සාමාන්‍යයෙන් ක්‍රිකට් ක්‍රීඩකයෝ විවිධ විලාසිතා කරනවා. තිසර එහෙම විලාසිතා නොකළේ ඔබට බයේද?**

(සිනාසෙමින්) අයියෝ නෑ. ඇත්තම කිව්වොත් එයා එහෙම විලාසිතාවලට ආස නෑ. මං තමයි එයාට “කොණ්ඩේ මේ විදියට කපන්න අර විදියට කපන්න” කියලත් කියන්නේ.



# තරහා යන්නේ නැති කෙනෙක් එක්ක මම කොහොමද අනේ රණ්ඩු වෙන්නේ?

**තිසර පිටියේදී නම් ගොඩාක් නිවුණු ක්‍රීඩකයෙක්. ගෙදරදීත් එහෙමද?**

(සිනාසෙමින්) ගෙදරදීත් ඒ විදියම තමයි. චුට්ටක්වත් සැර නෑ. නිවිලම තමයි ඉන්නේ. මොකක් හරි හේතුවකට මට තරහා ගියත් එයාට නම් ලේසියකට තරහා යන්නේ නෑ. ඒ වගේමයි එයා ටිකක් සංවේදී වැඩියි. පොඩ්ඩක් ඇත්නම් හිත උණුවෙනවා.

***දෙන්නා ගෙදර ඉන්නකොට පොඩි පොඩි රණ්ඩු එහෙම වෙන්නේ නැද්ද?**

අනේ ඉතින් රණ්ඩු වෙන්න එයාට තරහා යන්නේ නෑනේ. ඒ නිසා අපි දෙන්නා වැරදිලාවත් රණ්ඩු වෙන්නේ නම් නෑ.

**ක්‍රිකට්වලදී නම් තිසරට ගොඩාක් අය කියන්නේ 'පැන්ඩා' කියලා. ඔයත් කතා කරන්නේ එහෙමද?**

(සිනාසෙමින්) අනේ නෑ. මං නම් තිසර කියලා කතා කරන්නේ. බබා කියලත් කියනවා. ඔය පැන්ඩා කියන නම දැම්මේ ඕස්ට්‍රේලියානු ක්‍රීඩකයෙක්. මට නම නම් මතක නෑ.

**එයා වැඩිපුරම සතුටින් හිටපු දවස ෂෙරමිට මතකද?**

මං හිතන්නේ එයා වැඩිපුරම සතුටුවුණේ 2014 විස්සයි විස්ස ලෝක කුසලානය දිනපු දවසේ තමයි. ඒ සතුට මං එයාගේ මුණෙන්ම දැක්කා.

**මේ වෙනකොට තිසර එක්ක ගෙවන ජීවිතේ කොයි වගේද?**

දැන් එයා ගොඩාක් වෙලාවට ඉන්නේ ගෙදර. ඒ නිසා නිදහසේ සතුටින් අපි ඉන්නවා. අපි දැන් පදිංචි බත්තරමුල්ලේ. අපේ අම්මලයි එයාලගේ අම්මලයි නම් මීනුවන්ගොඩ ඉන්නේ.

**ෂෙරමි තිසරට කියලා තේ හදගන්නවා කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) අනේ කවුද ඒ කතාව කිව්වේ? ඒක මෙහෙමයි. තිසරට ගොඩාක් රසට තේ හදන්න පුළුවන්. මං ආසයි ඉතින් එයා හදන තේ බොන්න. ඒක එයත් දන්නවා. ඒ නිසා හිටපු ගමන් එයා මටත් එක්ක තේ හදනවා.

***රසට තේ හදන්න පුළුවන් නම් එයාට කටට රසට උයන්නත් පුළුවන් ඇති නේද?**

එයාට තේ හැදුවට උයන්න නම් බෑ. ඒත් මට නම් කටට රහට උයන්න පුළුවන්.

**තිසර වැඩිපුරම කන්න ආස එහෙම මොනවද?**

බතුයි, පරිප්පුයි, පොල් සම්බෝලයි, කරවල තෙල් දලයි තියෙනවා නම් කොල්ලට වෙන මුකුත්ම ඕන නෑ. ඒ තරමටම ඒවට ආසයි. එයා ගෙදර ඉන්න දවසට ඒ දේවල් ඉතින් හදලා දෙනවා.

**තිසර අදටත් ජාතික කණ්ඩායමේ හිටියා නම් දස්කම් පෙන්නයි කියලා ඔබ හිතනවද?**

අනිවාර්යයෙන්ම. මොකද එයා ක්‍රිකට් පිටියේ හිටපු සැබෑම දක්ෂයෙක්. හොඳ තුන් ඉරියව් ක්‍රීඩකයෙක්. අත දිගෑරලාම විශ්වාසයකින් හයක් හතරක් ගහන්න එයාට පුළුවන්. අමාරු ඕනම වෙලාවක හොඳට පන්දු යවලා කඩුල්ලක් ගන්න එයාට පුළුවන්. ඒ වගේම හොඳට පන්දු රකින්න පුළුවන්. ඒ නිසා වද ක්‍රිකට් පිටියේ පෙන්නපු දස්කම් අදටත් එයාට පුළුවන් කියලා මං විශ්වාස කරනවා.

***අවසාන වශයෙන් අපට කියන්න තිසරට ආදරේ කරන අයට ආයෙමත් ඔහු ක්‍රීඩා කරනවා දකින්න ලැබෙන්නේ කවදද?**

ඉදිරියේ තියෙන 'ලංකා ප්‍රිමියර් ලීග්' (LPL) ක්‍රිකට් තරගාවලියට එයා ක්‍රීඩා කරනවා. තිසර තමයි 'ජැෆ්නා' කණ්ඩායමේ නායකයා. ඒ වගේම විදෙස් ලීග් තරගාවලි කීපයකම තිසරව ඉදිරියේදී දකින්න පුළුවන්. ඒත් එක්කම එයා සේවය කරන යුද හමුදාවේ මැච්වලදීත් ඉදිරියේදී තිසරගේ වැඩ බලන්න පුළුවන්. මමත් ඒ මැච්වලදි පරණ තිසරව ආයෙමත් දකින්න හරිම ආසාවෙන් බලාගෙන ඉන්නවා.

■ රුවන් එස්.සෙනවිරත්න



# කඳුළු ගෑස් කාලා බිම බදාගෙන ඉන්නවා දකිද්දී එංගලන්තෙ හිටියත් මගේ පපුව පිච්චුණා

**ෂිරෝමා ද සිල්වා**
**ජෙහාන් අප්පුහාමිගේ මව**

"මම ගොව්පොළට පා නගමින් සිටියදී කුරුසිය කරේ දරා පාරේ ඇදෙන ඔහු දිටිමි. ජනසමූහයක් ද, ඔහු පිටුපස ගමන් ගත්හ. මම ද ඔහු ළඟින් ම ගමන් කරන්නට වීමි. කුරුසිය බරින් ඔහු කීප වතාවක් ම බිම ඇද වැටිණි. ඔහුගේ ශරීරයද හෙම්බත් වී තිබුණේය."

ජේසුස් වහන්සේ වම් උරහිසේ කුරුසියක් තියාගෙන කල්වාරි කන්ද නැගපු හැටි සීමෝන් සිරන්වුස් (ජේසුස් වහන්සේගේ ගෝලයෙක්) පැහැදිලි කරලා තියෙන්නේ එහෙම.

එදා කුරුසියේ ඇණ ගහලා වද දීලා මරාදපු ජේසුතුමා පාස්කු දවසෙ මරණෙන් නැගිටිනවා. ඒ නිසා පාස්කුව කිතුණු භක්තියන්ගේ මංගල්‍යය.

ඒ මංගල්‍යය සමරන්න ගියපු අහිංසක මිනිස්සු සිය ගාණක් 2019 පාස්කු ඉරිදා බෝම්බ ගහලා මරලා දැම්මා. හැබැයි ඒ අයට තාමත් සාධාරණයක් වෙලා නැහැ. ඒ සාධාරණේ ඉල්ලලා අරගලේ කාලෙදි මනුස්සයෙක් මීගමුව කටුවාපිටිය පල්ලියේ ඉඳලා ගෝල්ෆේස් එකට පාගමනක් යනවා.

කිලෝ 30ක් බර කුරුසියක් වම් උරහේ තියාගෙන කිලෝමීටර 40ක් පයින් ගියපු ඒ මනුස්සයා වෙන කවුරුත් නෙමෙයි, ජෙහාන් අප්පුහාමි. ඔහු ජනප්‍රිය රංගන ශිල්පියෙක්. ටෙලි නාට්‍ය, චිත්‍රපට වගේම වේදිකාව එක්කත් ගණුදෙනු කරන නොම්මර එකේ නළුවෙක්.

රට වෙනුවෙන් ඒ වගේ දෙයක් කරන පුතෙක් ලැබිච්ච එකම අම්මා කෙනෙක්ට ආඩම්බර වෙන්න පුළුවන් කාරණාවක්. ඉතින් ඒ ආඩම්බර අම්මා එක්ක ඒ පුතා ගැන කතා කරන්න අපිට අවස්ථාවක් ලැබුණා. මේ ජෙහාන් අප්පුහාමිගේ මව ෂිරෝමා ද සිල්වා එක්ක කරපු කතාබහක්.

"මම නුවරඑළියේ. තාත්තා අශ්වාරෝහකයෙක්. සිරිමාවෝ මැතිනියගේ ආණ්ඩුව කාලේ අශ්ව රේස් තහනම් කළා. ඊටපස්සේ අපි මාරවිලට ආවා. එහෙදි තමයි මට පුතාගේ තාත්තව හම්බුණේ. ජෙහාන් පුතා පවුලේ හතරවැනියා. එයාට අක්කලා දෙන්නෙකුයි, නංගි කෙනෙකුයි, අයියා කෙනෙකුයි ඉන්නවා."

**පුංචි කාලෙදි ජෙහාන් දඟයිද?**

"අනේ නැහැ. පුතා හරිම අහිංසකයි. පොඩි කාලේ අයියා වරදක් කරලා අපි එයාට බනින්නහම ඒකට අඬන්නෙත් ජෙහාන් පුතා. අනික එයා ඉස්සර ඉඳලම මිනිස්සුන්ට හරි ආදරෙයි. ඒ නිසාද මන්දා පුතාට ඉක්මනින්ම මිනිස්සු ආකර්ෂණය වෙනවා."

පුංචි කාලේ ඉඳලා පොතපතේ වැඩටත් ජෙහාන් දක්ෂ බවත් ඇය කිව්වා.

"2001දී මම නර්සින්වලට එංගලන්තෙට ගියා. එදා ඉඳලා මම තාම ජීවත්වෙන්නේ එහේ. රට යනකොට පුතාට 16යි. මම ගියාට පස්සේ එයාලගේ තාත්තා තමයි එයාලව බලාගත්තේ. තේ එක පවා හදලා ළඟට දෙන තාත්තා කෙනෙක් පුතාට හිටියේ. 2012දී එයා නැතිවුණා. යාළුවෝ වගේ හිටපු නිසා තාත්තගේ වියෝව පුතාට දරාගන්න අමාරු වුණා."

බැලූ බැල්මට දඩබ්බර, රැඩිකල් චරිතයක් වගේ පෙනුණට ජෙහාන් කියන්නේ බොහොම සංවේදී මනුෂ්‍යයෙක් බවයි ඇය කිව්වේ.

"පුතා ඉගෙනගත්තේ හලාවත ශාන්ත මේරීස් ඉස්කෝලෙන්. ඒ කාලේ ඉඳලා පුතා රඟපාන්න දක්ෂයි. පුංචි කාලෙදි දහම් පාසල් නාට්‍යවලට එහෙමත් සම්බන්ධ වුණා. එකපාරක් පුතා මංගල සේනානායකගේ වැඩමුළුවකට සහභාගී වුණා. ඊටපස්සේ තමයි වේදිකා නාට්‍යවල රඟපාන්න පටන්ගත්තේ. පස්සේ රූපවාහිනී නාට්‍ය, චිත්‍රපටවලටත් සම්බන්ධ වුණා.

'සය පෙති කුසුම' චිත්‍රපටය වෙනුවෙන් සාක් සිනමා සම්මාන උළෙලේ හොඳම නළුවා සම්මානය ලැබුණා. රංගනය වෙනුවෙන් සරසවි සම්මාන, රාජ්‍ය සම්මාන, යෞවන සම්මාන එහෙමත් අරගෙන තියෙනවා."

ජෙහාන්ගේ බිරිඳ ගයාත්‍රි මහේෂි. ඔවුන්ට ගැහැනු දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. ඒ පවුල ගැන ජෙහාන්ගේ අම්මා කිව්වේ මෙහෙම කතාවක්.

"ඒ දුවත් හරි හොඳයි. මගේම දුවක් වගෙයි. පුතා ගෙදර වැඩවලට දුවට උදව් කරනවා. වෙලාවකට උයනවා. ඒවා දැක්කම මට ගොඩක් සතුටුයි. පුතා බිරිඳට ගෙදර වැඩවලට උදව් කරනවට සමහර අම්මලා කැමති නැහැ. ඒක හරි වැරදියි. දරුවෙක් වුණත් කසාද බැන්දට පස්සේ ඒක වෙනම පවුලක්. ඉතින් මම එයාලා වෙනුවෙන් දේවල් කරනවා. එයාලගේ සතුට දිහා බලලා සතුටු වෙනවා ඇරෙන්න ඒ පවුල්වලට ඇඟිලි ගහන්න යන්නේ නැහැ."

අම්මා ඒක කිව්වේ උපදේශාත්මක ස්වරූපයෙන්.

**අරගලේ කාලේ පුතා කුරුසිය කරේ තියාගෙන යනකොට මොකද හිතුණේ?**

"එතකොට මම හිටියේ එංගලන්තෙ. හැබැයි මම දිගටම ඔන්ලයින් බලාගෙන හිටියේ. පොඩි කාලෙදි පුතා හලාවත සෙබස්තියන් මුනිඳුන්ගේ පල්ලියේ ක්‍රිස්තු චරිතය රඟපෑවා. ඒ නිසා එයාට කුරුසිය හුරුයි.

පුතා ඒ ගමන පටන්ගත්තේ පොඩි පිරිසක් එක්ක. ඒත් මගදි එයාට ලොකු පිරිසක් හැදුණා. එයා ගමන පටන්ගත්තු වේලේ ඉඳලා මම දෙවියන්ට යාඥා කළා. මගේ පුතා කිලෝමීටර ගාණක් පයින් ගියේ සෙරප්පු නැතිවයි. ගෝල්ෆේස් එකට යනකොට පුතාගේ පිට ලෙලි ගිහිල්ලා.

ඊටපස්සෙ පොලිසියෙන් කඳුළු ගෑස් කාලා පුතා බිම බදාගෙන ඉන්නවා මම දැක්කා. එවෙලේ මගේ පපුව පිච්චිලා ගියා. එහෙ ඉඳගෙන තනියම ඇඬුවා. හැබැයි රට වෙනුවෙන් එයා කළ දේ ගැන මට ගොඩක් ආඩම්බරයි. අපි කවදාහරි අරන් යන්නේ අනිත් අයට කළ දේවල්. එහෙම බැලුවම මගේ පුතාට අරන් යන්න ගොඩක් දේවල් තියෙයි."

අම්මා ජෙහාන් ගැන කතා කළේ බොහොම ආඩම්බරෙන්, ආදරෙන්. රට ගැන හිතන දරුවන් හදපු ඈ වගේ අම්මලා ගැන අපිටත් ආඩම්බරයි කියලා අපි ඇයට සමුදුන්නා.



■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.



# රජාගේ හැටපස් මංගල්ලෙටත් නැතුව බැරිවුණු කොහොඹ

## කොහොඹ තෙල්වලින් බාම් එකක්



සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

ඉන්දියාවෙන් පිටුවහල් කරපු විජය කුමාරයා තම්මැන්නාවෙන් ගොඩබහිද්දි කුවේණි හිටියේ කපු කටිමින්ලු. පස්සේ ඔහු යක්ෂ ගෝත්‍රික කුමාරිකාවක් වෙච්චි කුවේණිව විවාහ කරගන්නවා. කුවේණිගේ උදව් ඇතිව යක්ෂ ගෝත්‍රය පරාජය කරලා ලංකාවේ රජවෙනවා. රජ වුණාට පස්සෙ මධුරාපුරෙන් ගෙනාපු ආර්ය කුමාරිකාවක් විවාහ කරගෙන, දරු දෙන්නත් එක්කලා කුවේණිව එළවලා දානවා.

විජය එළවලා දාපුවහම කුවේණි ආයෙත් ගියේ නෑදෑයෝ ගාවට. සනුහරේ පාවා දුන්නු වරදට ඒ උදවියත් කුවේණිව එළෙව්වා. වෙච්චි අවනඩුව දරාගන්න බැරිව විජය රජුට ශාප කරලා කුවේණිය දිවිනහගන්නවා. ඔය තමයි කවුරුත් දන්න කතාව.

දැන් කියන්නේ ඊටපස්සේ වුණාය කියන කතාව. කුවේණිගේ ශාපේ පලදෙන්න තරම් කාලයක් විජය රජතුමා ජීවත්වුණේ නැතිලු. විජයගෙන් පස්සේ රජකමට පත්වුණේ පඬුවස්දෙව් රජු. විජය රජුට කළ ශාපය පල දුන්නේ ඉන්පසු රාජ්‍යත්වයට පත්වෙච්චි ඔහුටලු.

කුවේණිගේ සාපේ නිසා රජුට වසූරිය රෝගය හැදුනා කියලයි විශ්වාසය. වසූරිය කියන්නේ දෙවියන්ගේ රෝගයක්ලු. ඉතින් දෙවිරෝග සුව කරන්න නම් දෙවියන් වෙනුවෙන් යාතුකර්ම කරන්න ඕනෙය කියලයි ඒ කාලේ විශ්වාසය වුණේ.

ඒ මොන දෙවියන්ටද දන්නවද? කොහොඹ ගහට අධිපති දෙවියන්ට. අනුරාධපුර මහමෙව්නා උයනෙදි කොහොඹ දෙවියන් වෙනුවෙන් හැටපස් මංගල්‍යයක් පැවැතුවායින් පස්සේ රජුගේ රෝගය ඉබේටම වගේ සුව වුණාලු. ඒ හැටපස් මංගල්‍යයටම තමයි කොහොඹා කංකාරිය කියලා හඳුන්වන්නෙත්.

කොහොඹවලට රෝග සුවකිරීමේ හැකියාවක් තියෙන බව ඒ කාලේ උදවියත් විශ්වාස කළාය කියන්න හොඳම උදාහරණය ඔය කතාව.


සංස්කෘත වෛද්‍ය ග්‍රන්ථවල කොහොඹ හඳුන්වලා තියෙන්නේ 'නිම්බ', 'අරිෂ්ට' කියන නම්වලින්. කුෂ්ඨ රෝග ඇතුළු සමේ රෝග, ඇස් ලෙඩ, සෙම් ලෙඩ සහ බෝවන රෝගවලට කොහොඹ ගුණදායකයි කියලා ආයුර්වේදයේ සඳහන්.

කොහොඹ ගහක් අවට සුළඟට පවා ශරීරයේ විෂ නැති වෙනවාය කියලලු ඒ කාලේ උදවිය විශ්වාස කළේ. ඒ නිසා ඒ අය කොහොඹ ගහට දේවත්වයෙන් සලකලා තියෙනවා. දැන් නැති වුණාට ඉස්සර හැම ගෙදරකම වගේ කොහොඹ ගහක් වවලා තිබුණාලු.

පැපොල, වසූරිය, කම්මුල්ගාය වගේ වසංගත ලෙඩ හැදෙන්නේ දෙවියෝ කෝප වුණාම කියලයි ඒ කාලේ විශ්වාසය වුණේ. හැබැයි දෙවියන්ගේ ලෙඩ ගැන අදටත් අපේ ගැමි සමාජයේ විශ්වාස තියෙනවා.

ඉස්සර ඔය ලෙඩ හැදුනහම මුලින්ම කරන්නේ ගේ ඉස්සරහා කොහොඹ අත්තක් එල්ලන එකලු. ගෙදර ඇත්තෙකුට දෙයියන්ගේ ලෙඩක් හැදිලය කියලා අහල පහල උදවියව දැනුවත් කරන එකයි ඒකේ අරමුණ. ඊටපස්සේ ලෙඩේ හැදුන කෙනාගේ නිදිපළේ (නිදාගන්නා ස්ථානය) බිමට, වහලයට අමු කොහොඹ කොළ අතුරනවා. කොහොඹ ඉස්මෙන් සිරුර සෝදලා කොහොඹ තෙලින් දුම් අල්ලනවලු. ඔහොම කරද්දි හත් දවස යන්න කලින් ලෙඩේ සුවයිලු.

ඉස්සර විතරක් නෙමේ අදත් කොහොඹවලින් විවිධ චර්ම රෝගවලට ප්‍රතිකාර කරනවා. වෙළඳපොළේ නීම් සබන්, නීම් ෆේස්වොෂ්, නීම් පැක් කියලා ඔය තියෙන්නේ කොහොඹ යුෂ අඩංගු නිෂ්පාදන තමයි.



**අද අපි කතා කරන්නේ කොහොඹ තෙලින් කරන වැඩක් ගැන.**

මේක කොහොඹ තෙල්වලින් හදන බාම් එකක්. සමේ ඇතිවෙන කැසීම්, පුංචි බිබිළිවලට වගේම සමේ වියළිබවටත් මේ බාම් එක පාවිච්චි කරන්න පුළුවන්. ගොඩක් හොඳ ප්‍රතිඵල තියෙන නිසා ස්වයං රැකියාවක් විදියට පටන්ගත්තොත් හොඳ ඉල්ලුමක් තියෙයි.

හැබැයි මේක ඖෂධයක්නේ. ඒ නිසා ස්වයං රැකියාවක් විදියට කරනවා නම් රජයේ පිළිගත් ලියාපදිංචි වෛද්‍යවරයෙක්ගෙන් සහතික කරවගෙන ආයුර්වේද අමාත්‍යාංශයේ අනුමැතිය ගන්න ඕනේ කියන එකත් කියන්න ඕනේ.



**1**

මුලින්ම කේතලයට වයිට් සොෆ්ට් පැරෆීන් සහ බීස්වැක්ස් දාලා ඩබල් බොයිල් ක්‍රමයට දිය කරගන්න.

දැන් අමුද්‍රව්‍ය ගැන බලමු. කොහොඹ තෙල් 50ml, වයිට් සොෆ්ට් පැරෆීන් (White Soft Paraffin) 50g, බීස්වැක්ස් (Beeswax) මේකට අවශ්‍ය කරනවා. අවශ්‍ය නම් විතරක් සමට හිතකර සුවඳ ද්‍රව්‍යයක් එකතු කරන්න පුළුවන්. ඒ වගේම සුදු යකඩ කේතලයකුත් අවශ්‍යයි. බාම් අසුරගන්න වීදුරු බෝතල් පාවිච්චි කරන්න.

මේ අමුද්‍රව්‍ය මිලදී ගන්නකොට ප්‍රමිතියෙන් වැඩි හොඳම අමුද්‍රව්‍ය ගන්න ඕනේ. පිටකොටුවේ වේල්ල වීදියෙනුත් මේවා මිලදී ගන්න පුළුවන්.





**2**

පස්සේ දියකරගත්තු මිශ්‍රණයට කොහොඹ තෙල් එකතු කරගන්න.

ටිකක් නිවෙන්න තියලා අවශ්‍ය නම් විතරක් සුවඳ එකතු කරගන්න.

පස්සේ ඇසුරුම් කරන්න. ඇසුරුම් කරන්න කලින් මිශ්‍රණය ඝණ වුණොත් නැවතත් ඩබල් බොයිල් කරන්න. 20g නීම් බාම් එකක් රුපියල් 300-400 මිලකට අලෙවි කරන්න පුළුවන්.

තවත් විස්තර දැනගන්න 0714766819 මේ අංකයට කතා කරන්න.






■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# සුදු මහත්තයා තමයි ඔයාලා නැති අඩුව මගෙ හිතෙන් මකන්නේ



## ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

98 කොටස

චතුමිණී ගෙදර ගිය බව ඇසූ නිසා තේනුක හිතේ බයක් නැතුවම අම්මා දකින්නට යන්නට සූදානම් වුණේය. ඔහුගේ හිතේ තමන් වෙනුවෙන්ම සියුම් පසුතැවිල්ලක් ඇතිවුණේ, අම්මා මගහැරීම නිසාය. ඇය මතක් කරනතුරුම අම්මා දැකීම ඔහුට අමතකව තිබුණේය. ඉස්සර ඇය සතියකට වරක් ආවද ඒ ගමන් අම්මාටත් එහා මෙහා වී තිබුණේය. ඔහු උදේ සාප්පුවට නොයන නිසා අංජනා ඇල්ලේපොලත් සාප්පුවට නොයා නිවසේ නැවතුණාය.

"මේ පාර විතරයි මං තනියම අම්මා බලන්න යන්නේ. ඊළඟට ආයේ කවදහරි යන්නෙ ඔයත් එක්කයි නෝනා..."

තේනුක තෙන්නකෝන් ඇයට කීවේ මුසාවාදයක් නොවේ. තේනුක සෙනෙහෙලතා මැණිකේ හමුවන්නට යාමේ එකම අරමුණ ඇය දැකීම පමණක් නොවේ. ඇගේ අතින් ඉවූ බත් කටක් කෑමත් නොවේ. ඇය සමඟ කතා කරන්නට තවත් කාරණා කීපයක් විය. එයින් ප්‍රධානම කරුණ වූයේ අංජනාගේ අප්පච්චිගේ දානේ ගෙදරට ඇයට ආරාධනා කිරීමයි. තේනුක තෙන්නකෝන්ගේ සැලසුම වූයේ අංජනාගේ අම්මා කොළඹ කැඳවා එන්නට පෙර එහිදී මේ සියල්ල ගැන අම්මාට දැනුවත් කර ඔවුන් හඳුන්වාදෙන්නටයි. මේ සම්බන්ධයට අම්මා කිසිසේත් අකමැති නොවන බව ඔහු දන්නේය. ඔවුන් උඩරට මිනිසුන් නිසා අම්මා හොයන කුලගොත්ද හොඳින්ම පෑහෙන බවත් ඔහු දැන සිටියේය.

"පරෙස්සමින් ගිහින් එන්න එහෙනම්... ඔයා අම්මගෙන් කෑම කාලනෙ එන්නේ..."

ඇගේ නළලත සිඹ යන්නට සූදානම් වෙද්දී අංජනා ඇසුවාය.

"ඔයාටත් මං කෑම ගේන්නම්... ටීවී එක හරි බලන්න. යාළුවන්ට කාලෙකින් කතා කළෙත් නෑනේ... ඒ වැඩ ටික කරනකොට කාලෙ හරි යයි..."

අංජනා ඔහු සමීපයෙන්ම පඩිපෙළ බැස කාරය ළඟට ආවාය. තේනුක තෙන්නකෝන්ගේ කාරය ගේට්ටුවෙන් පිටව නොපෙනී ගියාට පසු ගේට්ටුව වසා දමා ඇය ආයෙත් උඩුමහලට නැංගාය.

> "ලංකාවට ගෙන්නගත්තේ ඔයාව ළඟින් තියාගන්න... ඒත් මට තේරෙන්නෙ නෑ මොකද්ද මේ අපලෙ කියලා..."

ජීවිතේ කිසිදක නොදැනුණ පාලුවක් වැනි හැඟීමකින් ඇය පෙළෙන්නට විය. ඒ නිසාම ඈ දුරකතනය අතට ගෙන අම්මා හා කතා කරන්නට ගත්තාය.

තේනුක තෙන්නකෝන්ට ඇමති නිල නිවසට යන්නට ඒ තරම් වේලාවක් ගත වුණේ නැත. කොහොමත් දවල් වෙනතුරු එහි රැඳෙන්නට ඔහුගේ බලාපොරොත්තුවක් නොවීය. අම්මා වෙනුවෙන්ම ගත් පයිනැපල් ගැටෝ කේක් එකත් අතින් ගෙන ඔහු කාරයෙන් බසින විටත් සෙනෙහෙලතා මැණිකේ කාරයේ දොරකඩය. ඇය මොහොතක් වෙලා පොඩි පුතු දෙස බලා සිටියාය. සෙනෙහෙලතා මැණිකේගේ හිතට ඔහු දැක්මත් දුකක් වුණේය. මේ තරම් ආදරේ කරන පොඩි පුතු නිතර දෙවේලේ දකින්නට නොලැබීම ඇගේ හිතට දුක පිරෙව්වේය. ඒ හැඟීමෙන්ම ඇය පුතුව අත ගෑවාය.

"ලංකාවට ගෙන්නගත්තේ ඔයාව ළඟින් තියාගන්න... ඒත් මට තේරෙන්නෙ නෑ මොකද්ද මේ අපලෙ කියලා..."

සෙනෙහෙලතා මැණිකේ ඔහුත් සමඟ නිල නිවස තුළට යන ගමන් කීවේ පශ්චාත්තාපය පිරුණු හැඟීමෙන්මය. ඇගේ උරහිසට උඩින් අත දැමූ තේනුක අම්මාගේ මුහුණ දෙස බලා සිනාසුණාය.

"ඒ අපලෙ අපි අපි ඇති කරගත්ත ඒවා. අම්මා ඒ ගැන කල්පනා කරන්න එපා. මං කොහොමත් මේ යන රටාවට ආස නෑ කියන එක අම්මා දන්නවනේ. එකම අවුල මට ඇවිත් අම්මව දකින්න තියෙන එකත් චතුමිණී නැති කළා..."

තේනුක සෙනෙහෙලතා මැණිකේ අතහැර සැටියේ ලස්සනට ඉඳගෙන ඔවුන් දෙස බලා සිටින සිම්බා ළඟට ගොස් ඉඳගත්තේය. සිම්බා ඔහු හඳුනන්නා සේ සිනාසෙමින් බලාසිටියේය.

"සුදු මහත්තයා, අඳුරනවද මේ මාමව... ඔය ලස්සනට හිනාවෙවී වලිගෙ වනන්නෙ මගෙ මැණික අඳුරනවද මේ මාමව..?"

අම්මා ඇගේ සුරතලා හා කෙතරම් බැඳීමකින් ඇත්දැයි ඒ වචනවලින් ඔහුට වැටහුණේය.

"ඔයාලා නැති අඩුව මගෙ හිතෙන් මකන්නේ සුදු මහත්තයා තමා..."

සැටියේ අනෙක් පසින් ඉඳගත් සෙනෙහෙලතා මැණිකේගේ ඇකයට පැනගත් සිම්බා අතගාමින් ඇය කීවාය.

"මාමා තාම චතුමිණීට ගෙයක් අරන් නැද්ද අම්මෙ..?"

තේනුක ඇසුවේ නිශ්ශංක රාජපක්ෂ ඇත්තටම ඇය වෙනුවෙන් ගෙදරක් මිලදීගෙන දෙනවාදැයි දැනගන්නටත් එක්කය.

"බැලුවා කිව්වා ඒත් ඒවා හරි ගියෙ නෑ කියන්නේ... අනික ඉතින් ගෑනු ළමයි ගෙවල් අරන් කොළඹ නවත්තනවා කියන්නෙත් ලේසි නෑ. කවුරුහරි වැඩිහිටියෙක් ඉන්න එපැයි... චතුමිණී වගේ කෙනෙකුට තනියම ගෙදරක ඉන්න පුළුවනැයි... සමන්තිනීට තමා ඉන්න එන්න වෙන්නේ..."

"මගේ ෂොප් එක ළඟම සැලොන් එක දලා දුන්නා වගේ මං ඉන්න ගේ හොයනවද දන්නෙ නෑ ඒ කිට්ටුවෙන්ම ගේත් අරන් දෙන්න..."

තේනුක සිනාසුණාත් සෙනෙහෙලතා මැණිකේ ඒ ගැන අලුතෙන් සිතුවාය. ඇත්තටම සොහොයුරා එහෙම කරන්නටත් බැරිකමක් නැති කෙනෙකි.

"පුතා සිම්බා එක්ක ඉන්නකෝ... මං ඉක්මනට තේ ටිකක් හදන එන්නම් කතා කරන්න..."

සෙනෙහෙලතා මැණිකේ ගෙතුළට යන දෙස බලා සිටි සිම්බාද සැටියෙන් පැන ඇය පස්සෙන් දිව්වේය. තේනුක ඒ ඇසිල්ලේ අංජනාට ඇමතුමක් ගත්තේය. බිලූටුතය කලබලයට ගෙන එන්නට බැරිවී තිබුණු නිසා ඔහු දුරකතනය කන තබාගත්තේය.

"කම්මැලිද..?"

ඇගේ කටහඬ ඇසෙද්දී ඔහු ඇසුවේය.

"අම්මත් එක්ක කතා කළා. ලබන සතියෙ ආයේ අපි එහෙ යන්න එපැයි... දානෙට..."

"ඔව්... යමු... ඊටපස්සෙ ආයේ ඕනනම් එකපාරක් යයි... ඊටත් පස්සෙ ඉතින් ඔයාටයි මටයි ආයෙ මාතලේ යන්න වෙන්නෙ නෑ..."

තේනුක බොහෝ දුර හිතා එසේ කීවත්, එය නොතේරුණ නිසාමදෝ අංජනාගේ හිතට පහදා දිය නොහැකි හැඟුමක් ඇතිවුණේය. බියක් වැනි හැඟීමකින් ඇගේ සිතිවිලි සිතිවිලි වැසී ගියා වැන්න.

"එහෙම කියන්න එපා, නරක කතා..."

"ඇයි නෝනා... මොකද්ද නරක කතාව..?"

"ආයෙ අපි දෙන්නා මාතලේ යන්නෙ නෑ කියන එක..."

"ඉතින් ඇත්තනේ... දානෙන් පස්සෙ අම්මලත් කොළඹ එනවනෙ... ඒ ආවම අපි ආයෙ මොනවට එහෙ යනවද?"

අංජනා නිහඬ වුණාය. එය ඇත්තක් වුවත් එවන් කතාවලට ඇගේ හිත අකමැති බව ඔහුට පහදන්නට වෙනත් විදියක් ඇත්තේ නැත. සෙනෙහෙලතා මැණිකේ විසිත්ත කාමරයට එන බව තේනුක දැනගත්තේ ඇය සිම්බා හා කතා කරනු ළං ළංව ඇසීමෙනි. ඔහු ඇය හා කළ කතාව අවසන් නොකරම ඇමතුම අවසන් කළේය. සෙනෙහෙලතා මැණිකේ ඔහුට කෑම මේසයටම කතා කළෙන් තේනුක නැගිට එහි ගියේය. කෙසෙල්, කජු අලුවා සහ ඔහු ආසම පැණි වළලුද සමඟ වූ තේ මේසයක් එහි විය.

"මෙච්චර මොකද... අම්මා හැදුවද?"

පුටුවක් ඇද එතැනින් ඉඳගනිමින් ඔහු ඇසුවේය.

"මං හැදුවේ ඔයාටමයි. මේ කෑම ඔයා මිසක් මේ ගෙදර කන්න කෙනෙක් නෑ පොඩි පුතා... ඔයාට ගෙනියන්නත් මං පාර්සලයක් හැදුවා..."

ඔහුගේ පුටුවේ පිටුපසින් හිටගෙන ඇය කීවාය.

"අම්මා ලබන සතියෙ සෙනසුරාද ඉරිද මාතලේ එන්න පුළුවන්ද..?"

එක්වරම තේනුක තෙන්නකෝන් ඇසුවෙන් සෙනෙහෙලතා මැණිකේ ඕනෑකමින් පුතුගේ මුහුණ දෙස නැවී බැලුවාය.

"ඇයි පුතා..? ඊටත් ලේසි දුරක්ද.. යන්න නම් ආසයි. ගෙවල් පැත්තෙත් ගිහින් එන්න පුළුවන් එහෙම වුණොත්... ඒත් ඔයා මාතලේ එන්න කියන්නේ..?"

ඇය ඔහු ඉදිරියෙන් වූ පුටුවෙන් ඉඳගනිමින් ඇසුවාය.

"එහෙ ඉන්නවා අම්මට අඳුන්නලා දෙන්න විශේෂ කෙනෙක්..."

තේනුක කීවේ තේ කෝප්පය දෙස බලාගෙනම නිසා සෙනෙහෙලතා මැණිකේගේ මුහුණේ ඉරියව් සැනින් වෙනස් වී යනු දුටුවේ නැත.

ලබන සතියට...

# කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ පුංචිම කෙල්ලට A 9 යි



**"එක පාරක් අම්මා මට ක්‍රිකට් අතඅරින්න කිව්වා. ක්‍රිකට් නිසා මට ඉගෙනගන්න බැරිවෙයි කියලයි අම්මා හිතුවේ."**

දකුණු අප්‍රිකානු කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ ඉදිරිපෙළ පිතිකාරියක් වෙච්චි ලෝරා වොල්වර්ඩ් මාධ්‍යට කියපු කතාවක්.

ලෝරා ක්‍රිකට්වලට යනවට ලෝරාගේ අම්මා බයවුණාලු. ක්‍රිකට් ගහන්න නැත්නම් ක්‍රීඩා කරන්න ගියාම ළමයින්ට පොතපතේ වැඩ කරගන්න වෙලාවක් නැතිවෙයි කියලනේ ගොඩක් දෙමව්පියෝ හිතන්නේ. හැබැයි ඒ කතාව බොරු කියලා ලෝරා ඔප්පු කළා.

ක්‍රිකට් ගහපු නැති පාඩම් කරන්න වෙලාව ඕනාවටත් වඩා තිබුණු ළමයි සේරම පරාද කරලා 2017දී ලෝරා විශ්වවිද්‍යාලයේ වැඩිම ලකුණු එක්ක උපාධිය ගන්නවා. දැන් ඇය වෛද්‍ය ශිෂ්‍යාවක්.

ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත කියන කතාව බොරු කරපු ලෝරා වගේ විශේෂ අය කොච්චර මේ ලෝකේ ඉන්නවද. උත්සාහය, කැපවීම තියෙනවා නම් ඕනම දෙයක් කරන්න පුළුවන් කියන එක විතරයි ඒ අය විශ්වාස කරන්නේ.

ඔය කතාව බොරු කියලා ඔප්පු කරපු ලෝරා වගේම විශේෂ කෙනෙක් එක්ක කතා කරන්න අපිටත් පුළුවන් වුණා. ඇය විශ්මි ගුණරත්න. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරපු ළාබාලතම ක්‍රිකට් ක්‍රීඩිකාව තමයි ඇය. ගම්පහ රත්නාවලී ඉස්කෝලේ ඉගෙනගන්න විශ්මි ක්‍රිකට් ගහන ගමන් සාමාන්‍ය පෙළ විෂයන් නවයටම ඒ (A) නවයක් අරගෙන.

විශ්මි ඇගේ වැඩකටයුතු ටික කළමනාකරණය කරගත්තේ කොහොමද කියලා අපි ඇයගෙන් ඇහුවා. සෙල්ලම් නිසා ළමයින්ට ඉගෙනගන්න බෑ කියලා හිතන අම්මලාටත් ඇගේ කතාව වැදගත් වෙයි.

**විශ්මි ක්‍රිකට් ගැහුවේ කොයි කාලේ ඉඳලද?**

පුංචි කාලේ ඉඳලා. මගේ අයියයි, අක්කයි, මමයි අපි තුන්දෙනාම පොඩි කාලේ ඉඳලාම ක්‍රිකට් ගහන්න කැමතියි. ඒ කාලේ අපි තුන්දෙනා එකතුවෙලා ක්‍රිකට් ගහනවා. ඔය අතරේ අයියට ලෙදර් ගහන්න ඕනේ කිව්වා. ඊටපස්සෙ තාත්තා අපි තුන්දෙනාවම ක්‍රීඩා සමාජෙකට එක්කරගෙන ගියා. එතකොට මට අවුරුදු අටයි.

> **මම කැකිරාව ජයසිරිපුර මහා විද්‍යාලයට එරෙහිව පන්දු 128කින් නොදැවී ලකුණු 417ක් ගැහුවා. හයේ පාරවල් 29ක්, හතරේ පාරවල් 49ක් එක්ක. ඒ වගේ වාර්තාගත දීර්ඝ ඉනිමක් ක්‍රීඩා කරන්න පුළුවන් වුණ එක ගැන ගොඩක් සතුටුයි.**

**ක්‍රිකට් ගහන්න යද්දි ඉස්කෝලේ වැඩ අතපසු වෙයි කියලා හිතුණේ නැද්ද?**

පුංචි කාලෙ ඉඳලා මට වෛද්‍යවරියක් වෙන්න හීනයක් තිබුණා. ඉතිං ක්‍රිකට් ගහන ගමන් හොඳට ඉගෙනගන්නවා කියන අධිෂ්ඨානෙත් මගේ හිතේ තිබුණා. මට ඒ දෙකම පුළුවන් කියලා මම දන්න නිසා බය නැතිව ක්‍රිකට්වලටත් ගියා. අනික 'ක්‍රීඩාව විතරක් කරලා මදි හොඳට ඉගෙනගන්නත් ඕනේ' කියලා තාත්තාත් නිතරම කියනවා. ඒ වචනත් හැම මොහොතෙම මගේ හිතේ තියෙනවා .

**ක්‍රිකට් ගහන ගමන් පාඩම් කරන්න වෙලාවක් තිබුණද?**

ඕනම දේකට උවමනාවක් තියෙනවා නම් වෙලාව කළමනාකරණය කරගන්න එක අමාරු නැහැ. ක්‍රිකට් ගැහුවට වෙලාව ලැබිච්චි ගමන් පාඩම් කරනවා. දවල් පුහුණුවීම් කළොත් අනිවාර්යයෙන්ම රෑට පාඩම් කරනවා. මුලින්ම අපි පදිංචි වෙලා හිටියේ වරකාපොළ අල්ගම. ඉගෙනගත්තේ අල්ගම කනිෂ්ඨ විද්‍යාලයෙන්. එහෙ ඉද්දි ශිෂ්‍යත්ව විභාගයත් හොඳට පාස් වුණා. පස්සෙ තමයි රත්නාවලී එකට ගියේ. ක්‍රිකට්වලින් ගමනක් යන්න පුළුවන් වුණොත් රත්නාවලී එකට ගියාට පස්සෙයි.

**ක්‍රීඩා කරන ගමන් පාඩම් කරන විදිය අනිත් අයටත් කියලා දෙන්න කැමතිද?**

විභාගය කියලා මම ක්‍රිකට් නැවැත්තුවේ නැහැ. ඒ අතරත් පුහුණුවීම් එහෙම කළා. හොඳට පාඩමුත් කළා. විභාගෙට සති දෙකක් වගේ තියෙද්දි හොඳට සැලසුම් කරලා පාඩම් කළා. මුල් සතියේ කළේ පාඩම් කළ එක විතරයි. ඊටපස්සෙ සතියේ ප්‍රශ්නපත්‍ර කළා. එහෙම තමයි මම නම් පාඩම් කළේ.

**දැන් එතකොට විශ්මි උසස් පෙළ කරන්න හිතාගෙන ඉන්නේ මොන අංශෙන්ද?**

ගණිත අංශයෙන්.

**ගණිත අංශය කියන්නේ ටිකක් අමාරු අංශයක්නේ. එතකොට ක්‍රිකට් අතාරිනවද?**

අපෝ නෑ. මොන අංශෙන් ගියත් ක්‍රිකට් නම් අතාරින්නේ නැහැ. ඒ තරම් මම ක්‍රිකට්වලට ආදරෙයි.

**පාසල් බාලිකා ක්‍රිකට් ඉතිහාසයේ ක්‍රීඩිකාවක් ලබාගත් වැඩිම ලකුණු වාර්තා කළෙත් විශ්මි නේද?**

ඔව්. ඒක මට කවදාවත් අමතක වෙන්නේ නැහැ. එදා මම කැකිරාව ජයසිරිපුර මහා විද්‍යාලයට එරෙහිව පන්දු 128කින් නොදැවී ලකුණු 417ක් ගැහුවා. හයේ පාරවල් 29ක්, හතරේ පාරවල් 49ක් එක්ක. ඒ වගේ වාර්තාගත දීර්ඝ ඉනිමක් ක්‍රීඩා කරන්න පුළුවන් වුණ එක ගැන ගොඩක් සතුටුයි.

**වයසින් පොඩි වුණාට විශ්මි ජාතික ක්‍රිකට් කණ්ඩායමත් නියෝජනය කරපු ක්‍රීඩිකාවක්. ඒ ගැනත් ටිකක් කතා කරමු.**

ක්‍රිකට් ටීම් එකට එකතුවෙන්න ගොඩක් අය බලාගෙන ඉන්නවනේ. ඒත් එතැනට යන්න ලේසි නැහැ. හැබැයි හිතුවටත් වඩා ඉක්මන්ට ටීම් එකට යන්න මට පුළුවන් වුණා. ඒ ගැන මම වගේම ගෙදර අයත් ගොඩක් සතුටු වෙනවා.

**විශ්මි චමරි අතපත්තු වගේ වෙන්න ආසයි කියන්නේ ඇත්තද?**

ඇත්ත. චමරි අක්කා වගේ අත දිගඇරලා බෝලෙට රිදෙන්න ගහන්න ආසයි. එතකොට පීඩනය වුණත් දැනෙන්නේ හරි අඩුවෙන්. කොහොමත් මම පාසලෙත් ප්‍රසිද්ධ ප්‍රහාරාත්මක පිතිකාරියක් විදියට තමයි. මම චමරි අක්කා එක්ක සෙල්ලම් කරලත් තියෙනවා.

**ක්‍රීඩාවලින් හොඳ අනාගතයක් පේද්දි ඉගෙනගන්නේ මොකටද කියලා හිතන මිනිස්සුත් ඉන්නවා නේද?**

මොනම ක්‍රීඩාවක්වත් දිගටම කරන්න පුළුවන්ද බැරිද කියලා අපිට කියන්න බැහැ. හිතන්නකෝ ආබාධයක් එහෙම ආවොත් මට ක්‍රිකට් ගහන්න බැහැනේ. හැබැයි ඉගෙනගෙන තිබුණොත් මට වෙන පැත්තකින් හරි යන්න පුළුවන්. අනික ඉගෙනගන්න දෙයක් කවදාවත් අහක යන්නේ නෑ කියලනේ කතාවටත් කියන්නේ.

**ඉතින් විශ්මි තවත් දවස් කිහිපයකින් තව ලොකු වගකීමක් පැවරෙනවා නේද?**

ඔව්. ඒක ගොඩක් ලොකු වගකීමක් තමයි. 2023 ජනවාරි මාසේ 19න් පහළ කාන්තා ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය පටන්ගන්නවා. මේ පාර කණ්ඩායමේ නායකයත්ව පැවරිලා තියෙන්නේ මට. පළවැනි වතාවට ඒ ලෝක කුසලානය ලංකාවට ගේන්න ලොකු හීනයක් තියෙනවා. අපේ කණ්ඩායමට ඒක කරන්න පුළුවන් කියලා ලොකු විශ්වාසයක් තියෙනවා.

**විශ්මිගේ හීන ජයගන්න හයිය වෙන අයවත් මතක් කරමු.**

අම්මා තාත්තා තමයි ලොකුම හයිය. ඒ වගේම පාසලේ විදුහල්පතිතුමිය ඇතුළු මට උගන්වපු සියලුම ගුරුවරුන්ව මතක් කරනවා. මගේ ක්‍රිකට් ගමනට උදව් කරන පුහුණුකරුවන් හැමෝමවත් මේ වෙලාවේ ආදරෙන් මතක් කරනවා

**විශ්මි අනිත් අය වෙනුවෙනුත් දෙයක් කියන්න කැමතිද?**

මම හිතුවට වඩා ඉක්මනින්ම මගේ ඉලක්කවලට ආවා. කාන්තා ජාතික ක්‍රිකට් කණ්ඩායමට තරඟ කළා. සාමන්‍ය පෙළ හොඳට සමත් වෙලා අධ්‍යාපනයටත් හොඳ අඩිතාලමක් දාගත්තා. ඉතින් හිතුවොත් ඕනම දෙයක් කරන්න පුළුවන් කියන එකයි මට අනිත් අයටත් කියන්න තියෙන්නේ.

■ රුවන් එස්.සෙනවිරත්න

සංවර්ධිත බැංකු ඇබෑර්තු
★ කුඩා හා මධ්‍ය පරිමාණ බැංකු ශාඛා සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)
0712 564 715 | 0774 024 155
0703 346 072 | 0702 725 731
0761 125 624 | 0702 231 694

දිවයින පුරා නිවෙස් වල නැවතී වැඩ කිරීමට කැමති ගෘහසේවිකාවන් අවශ්‍යයි.
ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම්, දරුවන් බලාගැනීමට හා මහළු හෝ රෝගී වූ අය බලාගැනීමට කැමති අය අමතන්න.

වැටුප රුපියල් 35,000 - 40,000
ආහාර ඇතුළු සියලු පහසුකම් නොමිලේ
072 945 9247

# වඳුරෙකුට දැලි පිහිය වෙනුවට තුවක්කුවක් හම්බවෙලා

# පස් හැවිරිදි පුතුට වෙඩි තියලා



කතරගම, දෙටගමුව ගමේ පදිංචි දිනේෂ් ත්‍රීරෝද රථ රියැදුරෙකි. 31 හැවිරිදි ඔහුට පස් හැවිරිදි පුංචි පුතෙක්ද සිටියේය. දෙටගමුවේ පදිංචි අනිත් ඇත්තන්ට මෙන් මෑතක පටන් දිනේෂ්ටත් වඳුරන්ගේ ඔච්චම් හිසරදයක් වී තිබුණි. මේ ගමේ ජීවත් වූ කවුරු කවුරුත් සිටියේ ඒ කරදරයෙන් හෙම්බත්වය. ඇතැමුන්ට කුස්සියේ ඇති බත් මුට්ටිය පවා මුර කරන්නට සිදුවූයේ හැරෙන පමාවට වඳුරන් එයද උස්සන් දුවන නිසාය. අවසන වෙනත් විසඳුමක් නැති තැන දිනේෂ් මේ කරදරයෙන් ගැලවෙන්නට සිතා නිවසට වායු රයිෆලයක් ගෙනාවේය.

"මේ ඇහුනද? ඕක පොඩි එකාට එහෙම අහුවෙන්න තියන්න එපා."

ඒ දිනේෂ්ගේ බිරිඳ සඳුනිය. පස් හැවිරිදි ජනිදුගේ ආරක්ෂාව ගැනද සිතමින් දිනේෂ් ගෙන ආ වායු රයිෆලය නිවසේ වූ අල්මාරිය උඩ තැබුවේය.

එයින් දින කීපයකට පසු දිනේෂ්ගේ බාල සොහොයුරා වන දහඅට හැවිරිදි කසුන් ඒ නිවසට ආවේ නෑනා ලවා ලිපියක් ලියා ගැනීමටයි.

"මේ අපි සෙල්ලම් කරමුද?"

නිවසට ආ සැනින් කසුන්ට ඒ ඉල්ලීම පුංචි ජනිදුගෙනි. එතැන් පටන් දෙදෙනාම සෙල්ලමේය. වෙලාව යනවා දැනුණේද නැත. එක්වරම නිවස අසළ වූ සියඹලා ගසෙන් හුරුපුරුදු විලාපයක් ඇසුණි. ඒ විලාපය වඳුරන්ගේය.

"අපි වඳුරන්ට හොඳ පාඩමක් උගන්වමු."

එසේ කී ජනිදු කසුන්ව ගෙතුළට කැඳවාගෙන ගොස් පෙන්වූයේ ඊට දින කීපයකට පෙර තාත්තා වඳුරන්ට වෙඩි තියන්නට ගෙන ආ වායු රයිෆලයයි. නමුත් දිනේෂ් ඊට උණ්ඩ දමා ඇති බවක් කිසිවෙකුත් දැන සිටියේ නැත. ඒ නිසාම වායු රයිෆලය අතටගත් කසුන් විහිලුවට මෙන් ජනිදු දෙසට එල්ලය ගත්තේය. එහෙත් එය කිසිසේත්ම විහිලුවක් වූයේ නැත. ක්ෂණයෙන් වායු රයිෆලයේ කොකා ගැස්සී ගියේ කසුන්ටත් සිතාගත නොහැකි ලෙසය. උණ්ඩය කෙළින්ම ගොස් වැදුනේ ජනිදුගේ හිසටය. ඒත් සමඟම පුංචි ජනිදු ලේ පෙරාගෙන බිම ඇදවැටුණි.



**තුවක්කුවේ උණ්ඩ තිබුණු බව දැනගෙන ඉඳලා නෑ**

"අනේ ඉක්මණට ගෙදර එන්න. පොඩි එකාට හොඳටම අමාරුයි."

සඳුනි කෑ මොරදෙමින් ඒ ඇමතුම ගන්නා විටත් දිනේෂ් සිටියේ හයර් එකක් ගොස් නිවසට පැමිණෙමින්ය. ඇමතුමත් සමඟ විදුලි වේගයෙන් පැමිණි ඔහු දරුවාත් බිරිඳත් ඊට නංවා ක්ෂණයකින් ළඟම වූ කතරගම මූලික රෝහලට ගියා නොව ඉගිලුනාය. මන්ද වේගය තුළ දරුවාගේ ජීවිතයද තිබෙනා බවක් ඔහුට වැටහෙන්නට ඇත. පසුව දෙබරවැව මූලික රෝහලටත්, හම්බන්තොට මහරෝහලටත් ජනිදුව මාරු කෙරුණි. මේ අතර වෛද්‍ය පරීක්ෂණවලින් තහවුරු වූයේ දරුවාගේ හිස තුළ උණ්ඩය රැඳී ඇති බවත්, එය ඉවත් කිරීමට නම් ශල්‍යකර්මයක් සිදුකළ යුතු බවත්ය. ඒ වෙනුවෙන් යළිත් දරුවා ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහල වෙත මාරු කර යැවීමට පියවර ගැනුණි. නමුත් ඒ වනවිටත් සියල්ලන්ම ඉදිරියේ පුංචි එකා සදහටම දෙනෙත් පියාගෙන තිබුණි. පශ්චාත් මරණ පරීක්ෂණයේදී හෙළිවූයේ උණ්ඩය ජනිදුගේ මොළය පසාරු කරගෙන ගොස් මොළය තුළටම කිඳා බැස තිබූ බවත් ඒ තුළින් හිස්කබලට සහ මොළයට සිදු වූ තුවාල නිසා මරණය සිදුව ඇති බවත්ය.

කතරගම පොලිසිය මේ සම්බන්ධව වැඩිදුර විමර්ශන සිදුකළද කසුන් අත්අඩංගුවට පත්වුවද යළිත් ජනිදුගේ සිනාමල් දිනේෂ්ට හෝ සඳුනිට දකින්නට ලැබෙන්නේ නැත. කිසිවෙකුත් පුංචි එකා හිතාමතා නොමැරුවද කාගෙත් අතේ නොසිතා සිදුකළ වැරදි ඇති බව කිවයුතුමය. ඒ නිසා දරුපැටව් සිටින පවුල්වල උදවිය මේ සිද්ධියෙන්වත් පාඩමක් ඉගෙනගන්නවානම් හොඳය. එසේ නොවන්නට නිකරුණේ පරව යන තවත් මල් කැකුළක කඳුළු කතාවක් ඉදිරියේදී ඔබේ නිවස තුළින් ඇසෙන්නට ඉඩ ඇත.

(පුද්ගල නාම මනඃකල්පිතයි)

### මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව

"මේ වගේ සිදුවීම්වලට මූලික හේතුව දෙමව්පියන්ගේ නොසැළකිලිමත් බව. පොඩි දරුවෝ ඉන්න ගෙවල්වල දෙමව්පියෝ දැනගන්න ඕන වායු රයිෆලයක් වගේ දෙයක් දරුවන්ට පේනමානෙන් නොතියා ඉන්න. ඒක තියන තැන පාවිච්චි කරන පුද්ගලයා විතරක් දැනගත්තම ඇති. දැන් පිහියක් මන්නයක් එහෙම නම් දරුවෝ දැකලා දැකලාම ඒ ගැන සාමාන්‍යයෙන් දන්නවා. ඒත් වායු රයිෆලයක් කියන්නේ දරුවෙක්ට නිකන් අමුතු දෙයක්. ඉතින් ඒ වගේ දෙයක් පොඩි දරුවෙකුගේ අතට නිකන් හරි අහුවුණොත් ඒ දරුවා මොකද වෙන්නේ කියලා බලන්න ඒක අතපත ගාලා බලනවා. ඒ මඟින් අනතුරක් වෙන්න තියෙන ඉඩකඩ වැඩියි. මං කියන්නේ දරුවොම නෙවෙයි ඕන ලොකු කෙනෙක් එහෙම දෙයක් පේන්න තිබුණොත් අතපත ගානවා. මෙතැනදිත් වෙලා තියෙන්නේ එහෙම දෙයක්නේ. මේ දරුවගේ තාත්තා වායු රයිෆල් එක එයා විතරක් දන්න තැනක පරිස්සමට තිබ්බා නම් අද මෙහෙම දෙයක් වෙන්නේ නෑනේ. අල්මාරිය උඩ කියන්නේ ඒ වගේ දෙයක් තියන්න සුදුසු තැනක් නෙවෙයිනේ. ලංකාවේ 75% ක්ම අනතුරු වෙන්නේ ඔය නොසැළකිලිමත් බව හින්දා. ඒ නිසා මේ සිද්ධියෙන්වත් පාඩමක් ඉගෙනගෙන දරුවෝ ඉන්න හැම දෙමව්පියෙක්ම දරුවෙක්ට අනතුරක් වෙන්න තියෙන ඉඩකඩ අවම කරගන්න එක වටිනවා."

■ භාතිය වෙඩිවර්ධන

# කැන්ඩියන් මනාලියට අලුත් බවක්



### අඩු වියදම් රෙද්දක් තෝරාගත්තේ නමුත් පෙනුම ඉහළයි

අද අපි 'ධරණී මනාලිය' තුළින් ඉදිරිපත් කරන්නේ බොහොම සියුම් ලෙස පාරම්පරික බව වෙනස් කළ උඩරට මනාලියක්. මනාලිය හැඩගන්වන්නේ කොච්චිකඩේ පලඟතුරේ පාරේ සැලෝන් තරුෂි රූපලාවණ්‍ය ආයතනයේ ශිරෝමා ෆොන්සේකායි.

මේ මනාලිය මාල හත ඇතුළුව සාම්ප්‍රදායික ආකාරයට උඩරට මනාලියක් ලෙස හැඩ කරලා තියෙනවා. මෙතැනදි ඉරහඳ වෙනුවට තුන්තැල්ල තමයි භාවිතා කරලා තියෙන්නේ. ඒ වගේම දිගු කරාබු යුවළක් භාවිතා කරලා මනාලියගේ හැඩ වැඩි කරලා තියෙනවා. මේ ජුවලරි නිර්මාණය කළේ බුලත්කොහුපිටියේ මනෝජ් කැන්ඩියන් බ්‍රයිඩ්ල් ජුවලරි ආයතනය විසින්.

මනාලියගේ සාරිය ඇත්දළ පැහැයෙන් තෝරගෙන තිබෙනවා. පාරම්පරික බව පෙන්වීම සඳහා දිග අත් සහිත හැට්ටයට තරමක බෝරිච්චියක් දාලා තියෙනවා. මේ දවස්වල දැඩි ආර්ථික ප්‍රශ්න තියෙන නිසා රෙදි අරගෙන සාරිය නිර්මාණය කළා. සාරියට ජුවලරිවල පැහැය එන ආකාරයට පුංචි වර්ක් එකක් දැම්මා. ඒ වගේම සිහින් බෝඩරයක් නිර්මාණය කළේ සාරියේ පෙනුම වැඩිවෙන්න.

මේකප් එක හරිම සරලයි. දැන් හැම මනාලියක්ම කැමති ස්වභාවික ආකාරයට මේකප් කරන්න. මනාලියගේ සමේ පැහැය ඉස්මතු වෙන ආකාරයට මේකප් එක දාලා තියෙනවා.

කැන්ඩියන් එකට ගැලපෙන ආකාරයට කොණ්ඩය බන් එකක් ආකාරයට හැඩගැන්නුවා. රෝස පොහොට්ටු සහ ඉද්ද පොහොට්ටු ගහලා කොණ්ඩේ හැඩ කරලා තියෙනවා.





හැඩගැන්වීම
**ශිරෝමා ෆොන්සේකා**
සැලෝන් තරුෂි කොච්චිකඩේ

ඡායාරූප
**මධුසංක සිරිවර්ධන**

සම්බන්ධීකරණය
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**

## සැරදේ ධරණී

සුදු සේල සඳු වටා උඩුවියන් බඳින ද
හුදෙකලා මගේ සිත ඔබට නිති පෙම් කළා
ධරණී ඔබ කවිපිටක් අප හැමට වෙන් කළා
හදවතින් තුති දෙන්න දෙඅත මගෙ එක් කළා

කවිවලින් මාලයක් ගොතන්නෙමි හැඩදමා
ධරණියට පලඳන්න සිතුවා මා ගෙලවටා
හිරු කුමරු හිනැහෙද්දි සඳු දිනට ළංවෙලා
ධරණී ඔබ එනතුරා හිඳින්නෙමි මගබලා

හද ගැඹරෙ පායන්න හැමදම සඳවෙලා
හද විලේ සුපිපෙන්න සුවඳ කැකුළක් වෙලා

**සුනේත්‍රා ශ්‍රීමතී දිසානායක**
**පයාගල**

## දිනේවා ධරණී

යන්තම් තුන්මසක්
ගතවූවා පමණී
මුළු සිරිලකම
හඳුනාගත්තා ධරණී
මුළු ලොව
තොරතුරුත්
අප දෝතට දෙන්නී
දිගුකල් දිනේවා
පතනෙමි ඔබ ධරණී

**කමලා සිරිවර්ධන**
**දොඩම්ගස්ලන්ද**

## සයුර ඔබ

සරස්වතියට පෙම් බැන්ද ඔබ
ඇයිද රඟසිරි අත්හලේ
ගීතයට රිද්මයක් වූ ඔබ
ඇයිද සත්සර බිඳහලේ
දනන්හට අස්වැසිල්ලක් වූ ඔබ
ඇයිද අත්වැල අත්හලේ
සොබාදම් දිනිතියගෙ වීණා
නදෙහි තත් ඇයි බිඳහලේ

**රත්නසේකර රූපසිංහ**
**කිතුල්ගල**



## ධරණී සිත සනසවන්නී

හිගේ නැතිව පුද සෙනෙහස
නිරතුරුව අප ළඟම දැවටී
ගෙවී යන මේ දිවි සැඳැවේ
කාන්සිය දුරු කර දමන්නී

දුරක වෙසෙනා දූ පුතුන්ගෙන්
සිඟිති සුරතල් ළපැටියන්ගෙන්
ඇත්වී කල් ගෙවී යන සඳ
සතුට සැනසුම රැගෙන එන්නී

නොයෙක් සීමාවන් අතරමැද
එකාකාරීව ගෙවෙන දිවියට
සැබෑ වෙනසක් උදා කරනට
නිරතුරුව අත්වැලක් වන්නී

අකුරු මැද රස මිහිර කලතා
සුසංවේදී හැඟුම් පුබුදා
දැනුම ගෙන දී සිතට දිරි දී
ඔබයි අප සිත් සනසවන්නී

**චන්ද්‍රා රෝහිණී කැටිපෙආරච්චි**
**ඇල්පිටිය**

## නුඹය

හිරු පායනු ඇත
මල් පිපෙනු ඇත
සඳ බබලනු ඇත
වෙනස නම්
නුඹය...
නුඹ නොමැති
හිස්බවය...

**ජයන් උඩුගම**
**අධිකරණ වෛද්‍ය**
**වතුපිටිවල**

# කවි යාය

## කැලෑමල්

හිරුකිරණින් විකසිත වී
බිඟු කැළගේ පහස ලබා
මුළු ලොව සුවඳින් නහවා
පරවී යයි හොර රහසේ

**සෝමසිරි වීරසිංහ**
**පොල්ගොල්ල**

## සුරපුර කොහිද

අවාරේ පිපි
පැතුම් ගැබ්බර
එළිය නොදැකම
මියෙයි බිහිදෙර

අදත් දිදුළයි
ඉරේ උණුසුම
කොහිද පෙරදා
මැවුණු සුරපුර

ඔමේෂ් ශෙහාන් දහනායක
වෛද්‍ය පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
නොමියැදුණු

මියැදුණු
ප්‍රේමයේ
සොහොන මත

තබමි බැතිබරව
වන මලක්

පිනි කඳුළින්
තෙමුණු
තවම
නො මියැදුණු

**චමින්ද රොෂාන්**

## අපේ දූ දරුවෝ

ලොක්කා චුට්ටා දෙන්නයි අක්කලා දෙන්නයි
තිළිණි කුළිණි එක්කලා සොහොයුරු ගොන්නයි
ලොකුයි කළුයි චූටියි අයියයි මල්ලියි
ලොකු පොඩි අයියා එක්කලා ආදර නංගියි

එක දෙක තුනයි සියයි සිය දහස් ගණන්
ගනිනට නොහැක හැඩ උයනකි පිරුණු මලින්
එබිකම් කරන සැනෙකින් ඒ දෙරට දෙරින්
ලස්සන හිනා මල් පීදුනි එකම තැනින්

මිදුලේ රටාවට හය අට කොටු ඇඳුණා
එක පිට එක උසට මින් බෝලෙන් බිඳුණා
මිදුලේ කොනක සෙල්ලම් නිවසක් තැනුණා
කමතේ නියරෙ කුඹුරේ විසිතුරු මැවුණා

වෙල් ඉපනැල්ල කන්දට ලන්දටම ගෙවූ
සෙල්ලම් පිටිය තෝතැන්නයි දහෙ නිවූ
සුමිහිරි මතක හා මගෙ හිත මටම කිවූ
කරුණකි වත්මනේ අපෙ දූ දරුවො පවූ

**දීපිකා ප්‍රියදර්ශනී ප්‍රනාන්දු**
**මොරටුව විල්ලෝරාවත්ත**

## ඉගිල ගියත් සමනලී

දහසක් සිතුවිලි පිබිදුව
සරසවි මතකෙට කැන්දුව
ජීවිතයම මන්මත් කළ
කොහිද ඉන්නෙ දැන් සිරිදුව

මුව හසරැලි නිති වස්සන
පිපි කුසුමක් මෙන් ලස්සන
මගෙ හදවත සුවඳ කෙරූ
දකින්න නැහැ රුව ලස්සන

දෙනුවන් නිල් කැට වගේය
තොල්පෙති සූකිරි වගේය
රණ තිසරුන් නොවුණත් ළැම
රතු ජම්බල ගෙඩි වගේය

ඉඳහිට අන් අයට හොරෙන්
ලත් පහසක සුමුදු සරෙන්
සිහිවී හදවත වැලපේ
සුදු මැණිකේ හනික වරෙන්

සිතුවිලි මගෙ පුබුදු කළා
නෙත කඳුළැලි යාවි ගලා
සිටින තැනක් කියනවාද
එන්නට මට පියාසලා

**ආ.ජයරත්න සිරිසේන**
**කොටිකාවත්ත**

## පියාණනි

බේබදු පියෙකු ලෙස හංවඩු වැදී මියගියද
මහමෙරක් තරම් වටී ඔබ
ජීවිතයේ අසරණ වූ මා හට
කුමන දෙය කළද කීවද
මියගියද
තවමත් මගේ පියාණන්මයඔබ

**නදී**
**පනාගොඩ**



## පෙහෙකම් ළඳුනි

පිපෙන හසරැලි පිරුණු මුහුණට
නෙතේ කැල්මෙන් ඔප වැටෙන්නේ
සැලෙන බංගලි වළලු දැතේ
මිණිකිකිණි හඬ පරදවන්නේ
වැවෙන තුන්පත් රටා විසිතුරු
මලින් සරසා රෙදි වියන්නේ
බැඳෙන සෙනෙහස ළඳුනි පෙහෙකම්
හදවතේ පිපි මල් පිදෙන්නේ

**පොල්ගොල්ලේ**
**සෝමසිරි වීරසිංහ**

කවි යාය

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.**
''කවි යාය''"ධරණී' කර්තෘ මණ්ඩලය, අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk ලිපිනයට ඊමේල් කරන්න

## අලව්ව නගරයේ

පිහිටි අපගේ
දිල්රුක්ෂි
රූපලාවන්‍යාගාරයට
පුහුණු රූපලාවන්‍ය
ශිල්පිනියන් අවශ්‍යයි.

වැටුප 30000-50000

0712 041 733
0774 583 527

## උගස් තැබූ රත්තරං

ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
ධරණී
අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන-0115 200 900
බෙදාහැරීමේ අංශය -0112 127204
දැන්වීම් අංශය-0112672801 0112672603
ෆැක්ස්-0112 673 451

## මෝහණ

සැක බිය දුක තරහ පීඩා දෝෂ සබකෝලය ඇබ්බැහිය
ලිංගික හා මානසික ගැටළුවට සහනය
මෝහණ පාඨමාලා ධනාත්මක චින්තන කුසලතා
පෞරුෂ සංවර්ධනයට
ළමා, තරුණ, අඹුසැමි, ප්‍රේම සබඳතා ගැටළු,
මතක, ධාරණ, බුද්ධිය, ඉගෙනුම් ගැටළු
විශ්ව ශක්තිය, හීලිං සහ N.L.P ප්‍රතිකාර



සිංහල දේශමාන්‍ය වෛද්‍ය Q ජයසිංහ
ජාත්‍යන්තර පාරම්පරික වෛද්‍ය සභාව
071-8787270 -0714771407
ශ්‍රී සහනය, මහරගම. ර:ලි:ප: 16883

## ආතරයිටීස් විශේෂ ප්‍රතිකාර



දණහිස් ඉදිමුම වේදනා සියලු සන්ධි රෝග, වාත රෝග, හිරිය, කශේරුකා ඈත් වීම, ළංවීම, ඉපැරැණි නිල ප්‍රතිකාර මඟින් පළමු ප්‍රතිකාරයේ සිටම සුවය. කැඩුම් බිඳුම් ප්‍රතිකාර.

ආතරයිටිස් ප්‍රතිකාර ඔබේ නිවසට ගෙන්වා ගත හැක. මාසිකව රු.7500/-



පාරම්පරික වෛද්‍ය ආර්. බී. පියතිස්ස
රත්න වෙද මැදුර
163/1, නිල්පනාගොඩ හන්දිය, මිනුවන්ගොඩ.
0776 060 950

## උකස් රත්තරං

උකස් කළ හෝ සින්නවීමට යන රන් භාණ්ඩ බේරාදී වෙළඳපොළ වටිනාකමට උපරිම මිලට මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවය
0771 259 360

## හෙදියන් අවශ්‍යයි

මහරගම සහ කඩුවෙල රෝයල් නර්සිං හෝම් පුද්ගලික සමාගමේ දිවා/රාත්‍රි සේවය සඳහා පිළිගත් පුහුණු ආයතනයක පුහුණුව ලැබූ පෞද්ගලික රෝහලක අවම වශයෙන් වසරක පළපුරුදු සහිත වයස අවුරුදු 22 - 50 අතර ගැහැනු/පිරිමි හෙද/හෙදියන් අවශ්‍යයි

ආහාර නවාතැන් පහසුකම් නොමිලේ ලබාදෙයි.
ETF, EPF සහිත ස්ථිර රැකියාව
අවම මාසික වැටුප රු.30,000/= සිට 70,000/=
දක්වා ඔබගේ පළපුරුද්ද හා පුහුණුව අනුව වෙනස් වේ. වාර්ෂික වැටුප් වර්ධන රුපියල් මිලියනයක ජීවිත රක්ෂණයක්.

වැඩි විස්තර සඳහා මානව සම්පත් කළමනාකරු
දුරකථන අංක 0718 131 131

රෝයල් නර්සිං හෝම් පුද්ගලික සමාගම.
දේවානන්ද පාර, නාවින්න, මහරගම.
E-mail : admin@royalnursinghome.com
Web : www.royalnursinghome.com

## උගස් රත්තරන්

සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනයට පැමිණ බේරා දී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ .
දිවයින පුරා සේවාව,
බොරුවලට නොරැවටෙන්න

පවුම -180,000/-

070 157 09 36
070 155 22 60

## සත්කාර

රැකියා තුළ නියුතු කාර්යබහුල ඔබගේ ආදරණීය දෙමාපියන් වැඩිහිටියන් සුරක්ෂිතව රැකබලා ගැනීමට ඔවුන්ගේ සැදෑ සමය සුවපහසු ආරක්ෂාකාරීව ගත කිරීමට ඉඩපහසුව සමග සුරක්ෂිතම සේවාවක් දැන් අපෙන්.

Sathkara Eldereare Center
(මාතර, අපරැක්ක අධිවේගී පිවිසුම අසල)

- පැය 24 පුරා සේවය
- පුස්තකාල පහසුකම්
- සුඛෝපභෝගී කාමර (attached Bathroom with hot water)
- පොහෝ දින විශේෂ වැඩසටහන්
- සහනදායී අය කිරීම්
- වෛද්‍ය පහසුකම්
- ප්‍රනීත ආහාර පාන

ඔබත් අදම අමතන්න 0713 131 411

## ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ළඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2022 / 2023 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගැනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට

ක්ෂණික ඇමතුම් -0777 444908

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස
- 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වෑවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැඟ හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මගින් ඔබ අතට ඉක්මනින් විසදුම්
0094 37 22 48828

## ඔබ ඉදිරිපත්වන විභාග වලින් ජය ලබාගන්නේ කෙසේද?

- අධ්‍යාපනය බිඳ වැටී ඇද්ද?
- ව්‍යාපාර පාළු වී කඩා වැටී අසරණ වී ඇත්තේ ඇයි?
- ආර්ථික අපහසුතා මැද්දේ රැකියාවක් ලැබෙන්නේ නැද්ද?
- සැමියාගේ/ බිරිඳගේ අයුතු සම්බන්ධකම් වලින් ඔබ පසුතැවිලි වෙනවාද?
- දරුවන් සැමියන් මත්කුඩුවලට ඇබ්බැහි වී අසරණ වෙලා ඉන්නවාද?
- හැරගිය අය ගෙන්වීම/ විවාහය ඉක්මන් කිරීම
- දරුවෙල අහිමිවන්නේ ඇයි ?



සියලුම කරුණු වලට ඉක්මන් විසඳුම්!!

පුරා දශක 04 ක් ජනතාව මුදවාගත් ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් සත්භාවයෙන් යුතුව දිනපතා රැවටිලිවලට අසුවන ඔබගේ, ගෙවන ග්‍රහචාරය, උපන්දිනය/ වේලාව සමග කතාකර පිහිටක් ලබා ගන්න. කළ හැකි වැඩ පමණක් භාර ගනිමි

ගුප්ත විද්‍යා විශාරද
පූජ්‍ය කොන්ඩදෙණිය ධම්මරත්න වෙද හාමුදුරුවෝ
පුරාණ ආවාසය
සංඝරාජපුර
හතරලියැද්ද

071 453 5659, 071 453 5630

මගේ කාරණා ඉටුවීමෙන් ඇඹිලිපිටිය සෙවනගල පදිංචි මල්කාන්ති විජයලතා විසින් ප්‍රසිද්ධ කරන ලදී.

# දැන්වීම් සඳහා අමතන්න
# 0112 672 601, 0112 672 603


ඉතා ධෛර්ය සම්පන්න, පවුලේ අය ගැන සැලකිලිමත්, පවුල පිළිබඳ වගකීම් සහගත, චතුරව භාෂා හැසිරවිය හැකි, යමක් හොඳින් පැහැදිලි කර හැකි, රැකියා පලපුරුද්දක් සහිත, නායකත්ව කුසලතා සහිත, නිති පුහුණුවට ලැදි, ද්විතික අධ්‍යාපනයක් ලද, කොළඹට තදාසන්න

ඔබ....

- ගෘහනියක්නම්
- වෘත්තීය කාන්තාවක්නම්
- විශ්‍රාමික කාන්තාවක්නම්
- ව්‍යාපාරික කාන්තාවක්නම්
- අර්ධකාලීන නියුක්තිකයෙක්නම්
- පුහුණුකාරිනියක්නම්
- පුද්ගලික ගුරුවරියක්නම්
- රජයේ සේවිකාවක්නම්
- සෞඛ්‍ය සේවිකාවක්නම්
- රැකියා වියක්තිකාවක්නම්

අප සුදානම් ඔබට ඉහල ආදායමක් ලබන්නට අලෙවිකරන රැකියා අවස්ථාවක් ලබා දෙන්නට, ඔබ සුදානම් ද? යොමුකරන් අයදුම්පත දැන්ම..

uthpalaws@yahoo.com 0777 355 084

## ශරීර හා පුරුෂ ශක්තිය වර්ධනයට
## වැල්පෙනෙල කැප්සියුල්

වැල්පෙනෙල කැප්සියුල් 100% වැල්පෙනෙල සහ අමුක්කරා පමණක් යොදා නිපදවා ඇත. අතුරු ආබාධ නැත.

නිෂ්පාදනය හා බෙදාහැරීම
සී/ස ඖෂධ ලංකා පුද්ගලික සමාගම
48-B/4, 10 කණුව පාර, කටුවාවල, බොරලැස්ගමුව.
0711 517 097 දුරකථන/ෆැක්ස්: 0112 517447




කාර්ගිල්ස්, ආපිකෝ සහ හෙල්ත්ගාර්ඩ් ඇතුළු සුපිරි වෙළඳසැල්වලින් හා ෆාමසි වලින් මිලදී ගත හැක.
බද්දේගම ස්ටෝර්ස් (මල්වත්ත පාර)
S.H.G සිංහල බෙහෙත් වෙළඳසැල් වලින් ලබාගත හැක.

Online Orders : www.myherbals.lk / 0777 463 898
සැ.යු. ඖෂධයේ ලියාපදිංචි අංකය 01/01/AZ/08/190
මිල - රු 400/-

## සෙත්ගුරු

දින හතක් තුළ කැපී පෙනෙන වෙනසක්

ලෝකයේ බලවත්ම දිව්‍යමය විශ්ව ශක්ති ප්‍රතිකාර
විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා සුවිශේෂ ප්‍රතිකාර



Hyperactive - අධි ක්‍රියාකාරී
Physical Disorder - ශාරීරික ආබාධ
Mental Retradation - මානසික දුර්වලතා
Autistic / Autism - ඔටිසම් / Epilepsy - අපස්මාරය
Down Syndrome / Learning Delay
Dyslexia / Dyscalculia
Attention Deficit Hyperactivity Disorder

මොළයේ සහ ස්නායු ආබාධ සඳහා

මෝහන වේදී / පංචකර්ම චිකිස්තක / රේඛී ආචාර්යය / වාස්තු උපදේශක / යෝගා උපදේශක
ජීවිත උපදේශක / භාවනා හා ආධ්‍යාත්මික උපදේශක / විශ්ව සත්‍ය ගවේශක

රාජගිරිය / කඩවත / කැළණිය 071 378 1000 විශ්වජිත වික්‍රමසිංහ මහතා

## සිහින් සිරුරක් සඳහා (Cinnamon)
## කුරුඳු කැප්සියුල්

කුරුඳු කැප්සියුල් 100% දේශීය කුරුඳු පමණක් යොදා නිපදවා ඇත.
ශරීරයේ රුධිරගත සීනි හා අධික මේදය අඩු කරයි.
ශරීර තරබාරුව අඩු කරයි.
ප්‍රතිඔක්ෂිකාරක ගුණයෙන් අනූනයි.
අතුරු ආබාධ නැත.

නිෂ්පාදනය හා බෙදාහැරීම
සී/ස ඖෂධ ලංකා පුද්ගලික සමාගම
48-B/4, 10 කණුව පාර, කටුවාවල, බොරලැස්ගමුව.
0711 517 097 දුරකථන/ෆැක්ස්: 0112 517447



කාර්ගිල්ස්, ආපිකෝ සහ හෙල්ත්ගාර්ඩ් ඇතුළු සුපිරි වෙළඳසැල්වලින් හා ෆාමසි වලින් මිලදී ගත හැක.
බද්දේගම ස්ටෝර්ස් (මල්වත්ත පාර)
S.H.G සිංහල බෙහෙත් වෙළඳසැල් වලින් ලබාගත හැක.

Online Orders : www.myherbals.lk / 0777 463 898
සැ.යු. ඖෂධයේ ලියාපදිංචි අංකය 02/01/PB/14/681
මිල - රු 400/-



## පුහුණුවෙන් පසු රැකියාගත කිරීම සඳහා නවක හෙද සිසුවියන් බඳවා ගැනේ.

හෙද වෘත්තියට ඇලුම් කරන අ.පො.ස. සා/පෙළ පෙනී සිටි තරුණ ඔබට අප ආයතනයේ පුහුණුවෙන් පසු රැකියා අවස්ථා සඳහා යොමු කෙරේ.

25% පාඨමාලා ගාස්තු අඩුවෙන්

නවක බඳවා ගැනීම් සඳහා අයදුම් කිරීමට NT ලෙස Type කර 0775230017 ට ඔබගේ නම සහ ලිපිනය SMS කරන්න.

නේවාසික පහසුකම් සහිතයි (Online ලියාපදිංචි විය හැක)

EMIT CAMPUS කුරුණෑගල | හලාවත | දඹුල්ල | මීගමුව

## NEW CHANDEE JEWELLERS



011 289 1517 / 5656512
No. 37, High Level Rd, Homagama
Ncjhomagama@newchandee.com

011 303 1135 / 2735766
No. 44B, Gall Rd, Dehiwala
Ncjhomagama@newchandee.com

## මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්

විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න. නැතහොත් ලිපියක් මගින් විමසන්න. (පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

## ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි? ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි? අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?

# මෙන්න!

එයින් මිදෙන්න නිසි මගක්...

අයුතු සම්බන්ධතා නැවතීම

- නිවාස ආරක්ෂා
- නඩුහබ දිනීමට
- දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

- රැකියා ලබා ගැනීමට
- සියලු විභාග සඳහා
- නොවිකිනෙන ඉඩම් විකිණීමට

- විවාහ පමා අයට
- හැරගිය අය ගෙන්වීම
- අසාර්ථක ව්‍යාපාර දියුණුවට

# මාතර වෙද හාමුදුරුවෝ

ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට
## ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.

වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න

අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත මාතර වෙද හාමුදුරුවෝ

භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී


Ritzbury
SugarFree
Ritzbury
CHOCOLATE FINGERS
SugarFree
45 g.NET
Ritzbury
SUGAR FREE
සීනි රහිත ඩාර්ක් චොකෝ
DARK CHOCO
45 g.NET
Ritzbury
Choco-Mo
4 COOKIES
SugarFree
සීනි රහිත චොක්ලට් තැවරූ කුකීස්
SUGAR FREE CHOCOLATE COATED COOKIES
40 g.NET
Your favourite chocolate indulgences
now available sugar free
Rs. 160/- upwards
CBL
Group




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.